# පෙරදිග සංගීතය

# 6 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය
(2015 සිට ක්‍රියාත්මක වේ)




සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

www.nie.lk

# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

## 6 වන ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk    විද්‍යුත් තැපැල : info@nie.lk

**පෙරදිග සංගීතය**

**6 වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2014**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

*මුද්‍රණය* : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂය යි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනාගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

''සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ලැදියා පුබුදුවා, එමගින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.''

("To sensitize students and the community through aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමග යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමග මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින් ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු, මානව හිතවාදී, ක්‍රියාශීලී, සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩ ලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කරදෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින් ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අපි යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තු දේ s | කි ය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

මෙම ප්‍රවේශයත් සමග ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ

දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකිවන පරිදි විෂය කරුණු මෙහිදී අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමික ව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී යහ ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථක ව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මකව චින්තනය මෙහෙයවා ඒවා විසඳාගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිත ව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමාන ය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව විෂය නිර්දේශය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්‍යෝගයෙන් හා අධිෂ්ඨානයෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** — ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** — ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ලේඛක මණ්ඩලය

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර |
| කපිල මැද්දෙගොඩ | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්‍ෂ, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පානදුර |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සෞන්දර්ය ස. අ. අධ්‍යක්‍ෂ (විශ්‍රාමික), කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර |
| චිත්‍රානන්ද ෆොන්සේකා | ගුරු උපදේශක, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරගම |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර |
| ජී. කේ. ලීනා මාග්‍රට් | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල |
| නිහාරි සමන් කුමාරි මුණසිංහ | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | ගුරු සේවය, ජනාධිපති විද්‍යාලය, මීනුවන්ගොඩ |
| රුවානි වීරසිංහ | ගුරු සේවය, රාජසිංහ විද්‍යාලය, හංවැල්ල |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| සුදත් සමරසිංහ | අධ්‍යක්‍ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| ආචාර්ය මාදුරුඔය ධම්මිස්සර හිමි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණි විශ්වවිද්‍යාලය, යක්කල |
| අමරසිරි වික්‍රමරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, ඔලුවිල් |

**පරිගණක යතුරු ලියනය** : ලක්‍ෂමී පෙරේරා
ඩබ්. එම්. ධම්මිකා

**පිටකවර නිර්මාණය** : රවීන්ද්‍ර තේනුවර, කථිකාචාර්ය,
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**විවිධ සහය** : ඊ. එම්. වික්‍රමනායක
ප්‍රේමරත්න පෙරේරා

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ පෙරදිග සංගීතය විෂයයක් වශයෙන් හැදෑරීමෙන් දරුවාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසුකාලීනවද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. උක්ත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවර ප්‍රධාන නිපුණතා 9ක් හඳුන්වා දී ඇති අතර එම නිපුණතා කරා ලඟා වීමට අත්‍යවශ්‍ය නිපුණතා මට්ටම් පෙළක් ද හඳුන්වා දී ඇත.

මෙම නව විෂය නිර්දේශය සැකසීමේ දී, පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල වලින් ලබාගත් දත්ත, ජාතික මට්ටමේ විභාග පරීක්ෂකවරුන්ගේ වාර්තා ඇසුරෙන් සිසුන් තුළ විශේෂයෙන් සංවර්ධනය විය යුතු විෂය කොටස් පිළිබඳ තොරතුරු පාදක කරගන්නා ලදී. එසේ ම පළාත් බද සේවාස්ථ සැසි, විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් නියාමන පර්යේෂණ වාර්තා, කලාප මට්ටමෙන් පවත්වන ලද කාර්ය බද්ධ පරීක්‍ෂණ දත්ත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අදහස්, සංගීත විෂය හදාරන ලද විද්වතුන්ගේ අදහස්, විද්‍යුත් මාධ්‍යයන්හි විකාශය වූ සාකච්ඡා හා වැඩසටහන් ඇසුරෙන් ලබා ගත් තොරතුරු මෙන් ම පාසල් පද්ධතියේ පෙරදිග සංගීත විෂය ඉගැන්වීම් කරන ගුරුභවතුන්ගේ හා දෙමව්පියන්ගේ අදහස් ද විෂය නිර්දේශ සම්පාදනයේ දී විශේෂයෙන් අවධානයට ලක් කරන ලදී.

මෙම විෂය නිර්දේශය ප්‍රායෝගික නැඹුරුතාවයකින් යුතු ව ගොඩ නගා ඇති අතර ක්‍රියාකාරකම් සඳහා හඳුන්වා දී ඇති ගුණාත්මක යෙදවුම් හැකිතාක් යොදා ගනිමින් පාඩම සංවර්ධනය කිරීම ගුරුභවතුන්ගේ වගකීමයි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ හඳුන්වා දී ඇති නිදර්ශක ඇගයීම් උපකරණ ග්‍රන්ථය ඇසුරු කර ගනිමින් දරුවන්ගේ ඇගයීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබට සක්‍රීයව දායක වීමට සිදුවේ.

ක්‍රියාකාරකම් සැළසුම් කිරීමේ දී හඳුන්වා දී ඇති ප්‍රවේශවලට අමතරව වෙනත් සුදුසු ක්‍රමවේද නිර්මාණශීලීව යොදා ගැනීමේ හැකියාව හා නිදහස ඔබට ඇත. මෙහි දී විෂය කරුණුවල ප්‍රමාණාත්මක බව හා නවතාවයන් පිළිබඳ ව හඳුනාගැනීමට ගුරුවරයාට සහාය කරගැනීමට හැකිවන සේ ගොඩනැගුණු අතිරේක කියවීම් පොතක් ද ඔබට සපයනු ඇත.

පෙරදිග සංගීතය විෂයය හදාරණ දරුවන් අතරින් වාදනය ප්‍රධාන විෂයය ලෙස සියලු ප්‍රායෝගික කොටස් අධ්‍යයනය කිරීමට සූදානම් වන ශිෂ්‍යයාට මේ සඳහා තෝරාගත හැකි නිර්දේශිත සංගීත භාණ්ඩ වනුයේ වයලීනය, එස්රාජය, දිල්රුබාව, බටනලාව, සරෝද්, සිතාර්, බොක්ස් ගිටාරය, ඉංග්‍රීසි මැන්ඩලීනය, සන්තූර් සහ ෂෙහනායි යන භාණ්ඩ වේ. ගායනය කරන ශිෂ්‍යයෙකු තුළ මෙන්ම වාදනය කරනු ලබන ශිෂ්‍යයකු තුළ ද අවශ්‍ය ප්‍රමාණයට ශිල්පීය දක්ෂතා වර්ධනය විය යුතු වේ. ඒ අනුව ගායනයේ සරල හැකියාවන් වාදකයකු තුළ ද වර්ධනය විය යුතු වේ. කිසිසේත්ම ගායනය කළ නොහැකි ශිෂ්‍යයෙකුට තම ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩයට අමතරව ගායනය වෙනුවට තබ්ලාව වාදනය කළ හැකි ය.

ගායනය ප්‍රධාන විෂයය ලෙස සියලු ප්‍රායෝගික කොටස් අධ්‍යයනය කිරීමට සූදානම් වන ශිෂ්‍යයාට මේ සඳහා ඕනෑම සංගීත භාණ්ඩයක් තෝරාගත හැකි අතර ඔහුගෙන් වාදනයේ දී එතරම් විශේෂ ශිල්පීය ප්‍රාගුණ්‍යයක් බලාපොරොත්තු නොවේ. අවශ්‍ය නම් ගායනය කරනු ලබන ශිෂ්‍යයකුට තබ්ලාව ද තෝරාගත් භාණ්ඩය ලෙස අධ්‍යයනය කළ හැකි වේ. ඒ සඳහා නිර්දේශිත තාල පද වාදනය කිරීම, ගයනු වයනු ලබන ගීතයකට අනුව තබ්ලාව වාදනය කිරීම ආදී හැකියාවන් ප්‍රමාණවත් ය.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iv |
| හැඳින්වීම | v-vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x-xiv |
| වාර සටහන | xv-xvi |
| ක්‍රියාකාරකම් සන්තතිය | 01-95 |

# 6 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ගායනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | • ස්වසන අභ්‍යාස<br>• ශුද්ධ ස්වර ගායනය<br>• ශුද්ධ ස්වර, සංකේත සහ ස්වර නාම පෙරදිග අපරදිග වශයෙන්<br>• ස්වර ප්‍රස්තාර ගායනය<br>• ශුද්ධ ස්වර ස්ථාපන ගීත ගායනය<br>• තාලානුකූල ස්වර අභ්‍යාස | 1 ගායනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.<br>2 ශුද්ධ ස්වර ඇතුළත් ස්වර ස්ථාපන ගීත ගායනය කරයි.<br>3 පෙරදිග අපරදිග වශයෙන් ස්වරවල ඇති වෙනස දක්වයි. | 12 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 ස්වර පුවරු සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනියි.<br><br>2.2 සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | • මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත් ස්වරපුවරුව, මවුත් ඕගන් (හාර්මෝනිකා) රෙකෝඩර් ෆ්ලූට්, හාර්මෝනියම් වැනි භාණ්ඩ අතුරින් එකක් සරලව වාදන හුරුව සහ සාමූහික ක්‍රියාකාරකම්<br>• තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය සංගීත භාණ්ඩ හඳුනා ගැනීම<br>• වයලින්, සිතාර්, බටනලා, ගිටාර්, එස්රාජ්, දිල්රුබා,සන්තූර්,සරෝද්,ෂෙහනායි ඉංග්‍රීසි මැන්ඩලින්, තබ්ලා වැනි සංගීත භාණ්ඩ අතරින් තෝරාගත් භාණ්ඩයක් වාදනය කිරීමේ මූලික හැකියා වර්ධනය | 1 සරල සංගීත භාණ්ඩයක් මගින් වාදන හුරුව ලබයි.<br>2 සම්ප්‍රදායික සම්භාව්‍ය සංගීත භාණ්ඩයක මූලික හුරුව ලබයි. | 05<br><br>02<br>01<br>10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 3.1 ගීත රසාස්වාදයේ යෙදෙයි. | • පාසල් ගීතය<br>• ජාතික ගීය (ශ්‍රී ලංකා) | 1 අභිමානාත්මක හඬින්, හැඟීමෙන් හා ඉරියව්වෙන් පාසල් ගීය හා ජාතික ගීය නිවැරදිව ගායනය කරයි. | 03 |
| | 3.2 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 2 හය වන ශ්‍රේණිය දක්වා ලැබූ සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරයි.<br><br>3 සාමුහික ක්‍රියාකාරකම් තුළින් මානසික සතුට ලබයි.<br>4 ප්‍රායෝගික හැකියා දියුණු වේ. | 06 |
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 4.1 සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරමින් සංස්කෘතික උරුමයන් සාකච්ඡා කරයි. | • එළුවන් කෑමේ ක්‍රීඩාවේ ගී<br>• මේවර කෙළිය ගී 2ක්<br>• කළගෙඩි සෙල්ලමේ ගී<br>• ඔළිඳ කෙළිය ගී 2ක් | 1 සිංහල ජන ක්‍රීඩා අතරින් තෝරාගත් ගීත ගායනයේ යෙදෙයි.<br><br>2 එළුවන් කෑම, මේවර කෙළිය කළගෙඩි සෙල්ලම හා ඔළිඳ කෙළියේ ගීත වෙන්කොට දක්වයි. | 06 |
| | 4.2 ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු ගී පිළිබඳ අත්දැකීම් ලබයි. | • තුන්සරණේ ගී 2ක් | 1 තුන්සරණේ ගී ගායනය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 සරල සංගීතයේ ළමා ගීත අභ්‍යාස කරයි.<br><br>5.2 සරල සංගීතය හා බැඳි මව්පිය ගුණ වරුණ ඇතුළත් විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ගීත ගායනය. | • විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමා ගීත දෙකක් ගායනය (ආදරේ ඇයි, සෙන්පතියන් ගැන, ඉරෙන් හඳෙන්, යන ගීත අතරින් දෙකක්)<br><br>• සුරතල් නංගියෙ අපෙ අම්මා<br>• මිදුලේ වැලි මාළිගාවෙ | 1 ප්‍රචලිත ළමා ගී ප්‍රාසංගිකව ගායනයේ යෙදෙයි.<br>2. ගී පද මාලාවන්හි අර්ථය හා භාවය පිළිබඳ සංවේදී ව විමසයි. | 04<br><br>02 |
| 6.0 රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 නාට්‍ය ගීත ගායනය කරයි.<br><br>6.2 නූර්ති ගීත ගායනය සමඟ රංගනය කරයි. | • නරිබෑණා නාට්‍යයේ ගීත ගායනය සමඟ රංගනය<br>• නිර්දේශිත නූර්ති ගී<br>• අද වෙස්සන්තර<br>• සුවඳ පත්ම<br>• මෙම ගිම්හාන | 1 නරිබෑණා නාට්‍යයේ ගී ගායනයේ හා රංගනයේ යෙදෙයි.<br><br>2 ප්‍රචලිත නූර්ති ගී කිහිපයක ගායන හැකියා ප්‍රදර්ශනය කරයි. | 04<br><br>05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 7.1 හඬ නිපදවිය හැකි මෙවළම් සකසයි. | • පිඹීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ<br>• ගැටීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ<br>• ඇතිල්ලීමෙන්/පෙළීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ | 1 ආදේශ භාණ්ඩ නිර්මාණයේ යෙදෙයි.<br>2 ඒවා ඇසුරෙන් රිද්මයානුකූල නිර්මාණ ඉදිරිපත් කරයි. | 04 |
| | 7.2 ආදේශ භාණ්ඩ ආශ්‍රිත නිර්මාණයේ යෙදෙයි. | • මාතෘකාවක් මත කරන නිර්මාණ (වැස්ස, කෝච්චිය වැනි)<br>• රබන් පද වාදනය | | 06 |
| 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 8.1 ප්‍රස්තාරකරණයේ මූලික කුසලතා ලබයි. | • මූලික රිද්ම රටා ප්‍රස්තාර කිරීම<br>• මාත්‍රා ලඝු-ගුරු-ප්ලුත අක්ෂර, විභාග<br>• මූලික තාල මත පද ප්‍රස්තාර කිරීම | 1 විවිධ රිද්ම රටා ප්‍රස්තාර කිරීමේ කුසලතා ලබයි.<br>2 ගීත ප්‍රස්තාරකරණයේ මූලිකාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | ඉදිරි ශ්‍රේණිවලදී මෙම නිපුණතාව ක්‍රියාත්මක වේ. | | | |

# 6 ශ්‍රේණිය - පෙරදිග සංගීතය
## වාර සටහන.

### පළමු වාරය

| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව / ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.1 ගායනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | 1 | • ස්ථාන අභ්‍යාස ශුද්ධ ස්වර | 02 |
| | 2 | • ශුද්ධ ස්වර , සංකේත සහ ස්වර නාම | 02 |
| | 3 | • පෙරදිග අපරදිග වශයෙන් සංගීතය | 02 |
| | 4 | • ශුද්ධ ස්වර ස්ථාන ගීත ගායනය හා ස්වර ප්‍රස්තාර ගායනය | 06 |
| 2.1 ස්වර පුවරු සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනියි | 5 | • මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත් ස්වර පුවරුව, මුඛ ඕගන් (හාර්මෝනිකා) හාර්මෝනියම් රෙකෝඩර් ෆ්ලූට් වැනි භාණ්ඩ අතරින් එකක් සරලව වාදන හුරුව සහ සාමූහික ක්‍රියාකාරකම් | 03 |
| 2.2 සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි | 6 | • කාලානුකූල ස්වර අභ්‍යාස වාදනය | 02 |
| | 7 | • සංගීත භාණ්ඩ හඳුනා ගැනීම වයලින්, සිතාර්, බටනලා, ගිටාර්, එස්රාජ්, දිල්රුබා, ඉංග්‍රීසි මැන්ඩලින්, තබ්ලා වැනි සංගීත භාණ්ඩ | 03 |
| 5.1 සරල සංගීතයේ ළමා ගීත අභ්‍යාස කරයි | 8 | • විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමා ගීත දෙකක් ගායනය ( අද රෑ ඇයි, " සෙන්පතියන් ගැන, ඉරෙන් හඳෙන් " යන ගී අතරින් 2ක් | 02 |

### දෙවන වාරය

| | | | |
|---|---|---|---|
| 3.1 ගීත රසාස්වාදයේ යෙදෙයි. | 9 | • පාසල් ගීතය | |
| | 10 | • ජාතික ගීතය | 02 |
| | | | 01 |
| 6.2 නූර්ති ගී ගායනය කරයි | 11 | • අද වෙස්සන්තර , සුවඳ පත්ම මෙමම ගිම්හාන ගායනය | 03 |
| | 12 | • නූර්ති ගීත සමග රංගනය | 02 |
| 1.1 ගායනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | 13 | • කාලානුකූල ස්වර අභ්‍යාස | 03 |
| 2.1 ස්වර පුවරු සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනියි. | 14 | • මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල් විද්‍යුත් ස්වර පුවරුව, මුඛ ඕගන් (හාර්මෝනිකා) හාර්මෝනියම්, රෙකෝඩර් ෆ්ලූට් වැනි භාණ්ඩ අතරින් එකක් සරලව වාදන හුරුව සහ සාමූහික ක්‍රියාකාරකම් | 03 |
| 2.2 සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි | 15 | • තෝරාගත් භාණ්ඩයක් වාදනය කිරීමේ මූලික හැකියා වර්ධනය වාදන ඉරියව් | 02 |
| | 16 | • ස්වරස්ථාන නිවැරදිව වාදනය | 03 |
| | 17 | • සරිගම ස්වර ඇතුළත් ගීත වාදනය | 03 |
| | 18 | • ස්වර ස්ථාන ගීතයක් වාදනය | 03 |
| 4.1 සිංහල ජනක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරයි | 19 | • එළුවන් කෑමේ ක්‍රීඩාවේ ගීත ගායනය. | 02 |
| | 20 | • මේවර සෙල්ලමේ ගීත ගායනය. | 01 |
| | 21 | • ඔළිඳ කෙළියේ ගීත ගායනය. | 01 |
| | 22 | • කළගෙඩි සෙල්ලමේ ගීත ගායනය | 02 |

## තෙවන වාරය

| | | | |
|---|---|---|---|
| 5.1 මව්පියගුණ වරුණ ඇතුළත් විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ගීත ගායනය | 23 | • සුරතල්' නං ගීයෙ අපෙ අම්මා<br>• මිදුලේ වැලි මාලිගාවේ | 02 |
| 4.2 ඇදහිලි සහ විශ්වාස මත ගොඩනැගුණු ගී පිළිබඳ අත්දැකීම් ලබයි. | 24 | • තුන්සරණේ ගී 2 ක් ගායනය | 02 |
| 6.1 නාට්‍ය ගීත ගායනය කරයි. | 25<br>26 | • නරිබෑණා නාට්‍යයේ ගීත ගායනය<br>• ගායනය සමඟ රංගනය | 02<br>02 |
| 7.1 හඬ නිපදවිය හැකි මෙවලම් සකසයි. | 27<br>28 | • හඬ නිපදවිය හැකි මෙවලම් සැකසීම.<br>• ගැටීම මත' හඬ නිපදවිය හැකි භාණ්ඩ | 04<br>02 |
| 7.2 ආදේශ භාණ්ඩ ආශ්‍රිත නිර්මාණයේ යෙදෙයි. | 29<br>30 | • මාතෘකාවක් මත කරන නිර්මාණ<br>• රබන් පද වාදනය | 02<br>02 |
| 8'1 mߥ¦ad¾ l rK f h auQ§s l F, ; d , nhs' | 31<br>32<br>33 | • ßoer g d mߥ¦ad¾ l Su'<br>• ud| ßl- wÓ r , >q. Fe mÍE<br>• uQ§s ; d| u; mo mߥ¦ad¾ l Su | 01<br>02<br>02 |
| 3.2 ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රායෝගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | 34 | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 06 |

# ස්වසන අභ්‍යාස

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග, සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ගායනයේ මූලික හැකියා වර්ධනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- ගායනයේ දී හොඳින් හුස්ම හැසිරවීමට හුරු වෙයි.
- දීර්ඝ හුස්මක් රඳවා ගෙන ගැයීමට හුරු වෙයි.
- භාවාත්මක ව ගැයීමට අවශ්‍ය මූලික ශක්තිය ලබා ගනියි.

ගුණාත්මක යෙදවුම් :
- පෑන් කොපු
- ගස්ලබු බටනලාවක්
- ගොටු කොළ
- විවිධ හැඩ සහිත බෝතල් කුප්පි
- පනාවක් හා ඊයම් කොළ

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

නිවැරදි ව මෙන් ම විශිෂ්ට ලෙස ගායනයක් ඉදිරිපත් කිරීමට තම හඬෙහි ශක්තිය දියුණු කර ගැනීමේ දී ස්වර අභ්‍යාස ඉතා වැදගත් ය. එහෙත් ස්වරයන්ගේ නියමිත නාදය උපදවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය එක් සාධකයක් වන්නේ ස්වසනය යි. ගායනයට උචිත ලෙස ආශ්වාස ප්‍රශ්වාස කිරීම මනා හික්මීමකින් යුතු ව කරනු ලබන පුහුණුවකින් ම කළ යුතු ය. මේ සඳහා විවිධ අභ්‍යාස ඇතත් 6 ශ්‍රේණියට උචිත අභ්‍යාස පමණක් තෝරාගැනීම වඩාත් ඵලදායි වේ. සෑම දිනක ම සංගීත පන්තිය ඇරඹීමට පෙර ස්වසන අභ්‍යාසයන්හි සිසුන් යෙදවීම ඉතා වැදගත් ය.

කුමන ස්වසන අභ්‍යාසයක යෙදුණ ද සිරුර ක්‍රියා කළ යුතු පොදු ක්‍රමවේදයක් ඇත. එනම්, සිරුර තුළ ඇති වාතය සිරුරෙන් පිට කිරීමේ දී කුස සිරුර තුළට හැකිළී යා යුතු ය. නැවත ආයාසයෙන් හුස්ම නොගෙන කුසෙහි මාංස පේශී ලිහිල් කර පෙනහළු තුළට වාතය ගලා ඒමට සැලැස්විය යුතු ය. එවිට කුස පිරී පිම්බී යා යුතු ය. මෙසේ වන්නේ අප පෙනහළු වෙත ගන්නා වාතයේ පීඩනය පෙනහළුවල පහළ කොටස ඩයෆ්‍රම්(ශ්ස්රේප) වෙත යොමු කරන නිසා ය. නිදසුන් ලෙස පහත දක්වා ඇති අභයාසයන්හි යෙදෙන්න. ඔබ තුල නිපුණත්වයක් ලබා ගැනීමෙන් අනතුරු ව පාඩම සංවිධානය කරගන්න.

- පෙනහළු තුළ තිබෙන වාතය මුඛයෙන් ෂ් .......... හඬ නිකුත් කරමින් පිට කරන්න. (හුස්ම පිටවීමට සාපේක්ෂ ව කුස සිරුර තුළට එබී යා යුතු ය.) මුඛයෙන් ෂ් ............. හඬ නිකුත් කරනුයේ එම අභ්‍යාසය මෙහෙයවන්නාට හුස්ම පිට කළ බව හඳුනා ගැනීමට ය.
- දැන් සිරුර තුළට හැකිළී ගිය කුසෙහි මාංස පේශීන් නිදහස් කරන්න. (එවිට පෙනහළු වෙත වාතය ගලා එනු ඇත. මෙම ක්‍රියාවලිය නිරායාසයෙන් සිදුවීමට ඉඩ දෙන්න)
- මේ ආකාරයට ආශ්වාස ප්‍රශ්වාස කිරීමට හොඳින් පුහුණු වන්න. ඉදිරි සියලු අභ්‍යාසවල දීත් ගායනයේ දීත් ස්වසනය සිදුකළ යුත්තේ මේ අයුරිනි.

■ වැඩිදුර මඟ පෙන්වීම හා අභ්‍යාස අතිරේක කියවීම් පොතේ යොදා ඇත.

පාඩම සංවර්ධනය :

**පියවර 01**

■ ඊයම් කොළ එතූ පනාව හෝ ගොටු කොළයක් දිවෙහි රඳවාගෙන අනුවාදනයක යෙදෙන්න.

■ එම ගීතය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. එම ගීතය අනුවාදනය කිරීමේ දී දීර්ඝ ආශ්වාසයෙහි ඇති බලපෑම පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

■ මෙම ක්‍රියාවට මෙන් ම ගායනයට දීර්ඝ ආශ්වාසයෙහි ඇති වැදගත්කම පහදා හුස්ම රඳවා ගැනීම දියුණු කර ගන්නා ආකාරය අවබෝධ කරවන්න. (මි.10)

පියවර 02

■ සිසුන් කණ්ඩායම් කර ඇමුණුම 1 හි ඇති කාර්ය පත්‍රිකාව බෙදා දෙන්න.

■ සිසුනට එම ක්‍රියාකාරකම්හි නිදහසේ යෙදීමට අවස්ථාව සලසා අවශ්‍ය තන්හි උපදෙස් දෙන්න.
(ඔබ යෙදුණු අභ්‍යාසයන්හි මුල් ඉරියව් පිළිබඳ ව වඩාත් සැළකිලිමත් වී සිසුන් තුළ ද ඒවා වර්ධනය කරන්න) (මි.15)

පියවර 03

■ සිසුන් කණ්ඩායම් 3 ට වෙන් කර ඇමුණුම 2 හි ඇති කාර්ය පත්‍රිකාව බෙදා දී එහි ඇති තේමාවන් හුස්ම භාවිතයෙන් ප්‍රති නිර්මාණය කිරීමට සලස්වන්න. (මුල් ඉරියව් පිළිබඳ ව මෙහිදී ද සැලකිලිමත් විය යුතු ය) (මි. 10)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

එක් දීර්ඝ හුස්මක් ගෙන ඉන් වැඩිම ඉලක්කම් සංඛ්‍යාවක් ගණන් කිරීමට සලස්වා අගයන්න. (මි. 05)

පසුවැඩ :

■ එක් හුස්මක් තුළ අංක එකේ සිට ගණන් කළ හැකි උපරි ම ඉලක්කම් සංඛ්‍යාව ගණනය කිරීමේ අභ්‍යාසයේ නිරත කරවන්න.

■ උචිත ගීයක් තෝරාගෙන නිවැරදි ඉරියව් පවත්වා ගනිමින් එක් හුස්මක් තුළ වැඩි ම පද ප්‍රමාණයක් ගැයීමට පුහුණු වීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් : 12 සංගීත ගුරු මාර්ගෝපදේශය පිටු 11 සිට 15 දක්වා

ඇමුණුම 01

ඔබ අත ඇති උපකරණ භාවිතයෙන් පහත උපදෙස් අනුව ක්‍රියාකාරකමක යෙදෙන්න.

(පැන් කොපු - ගස් ලබු බටනලාවක් - ගොටු කොළ - විවිධ හැඩ සහිත බෝතල් කුප්පි පනාවක් හා ඊයම් කොළ)

■ ඔබ අත ඇති උපකරණවලට පිඹීමෙන් හඬක් උත්පාදනය කරන්න. (ස්වසන අභ්‍යාසයන්හි යෙදීමේ දී ඔබ සිරුරේ තිබිය යුතු ඉරියව් මෙම ක්‍රියාකාරකම තුළ ද තිබිය යුතු ය. එය ගුරු මහත්ම, මහත්මීන්ගෙන් අසා දැනගන්න.)

■ ඔබ උපදවන හඬ එක් හුස්මක් තුළ දීර්ඝ කාලයක් රඳවා ගන්න.
ගොටු කොළයක් ගෙන දිවට සහ තල්ලට තබා තදකර ඒ අතරින් වැරෙන් සුළඟ පිට කරන්න.

**ඇමුණුම 02**

**පහත උපදෙස් අනුව ක්‍රියා කරන්න.**

- **කණ්ඩායම් 3 බෙදන්න.**
- **ඔබ අත ඇති උපකරණවලට පිඹීමෙන් ඇතිවන නාද භාවිත කර පහත සිද්ධි නිරූපණය කිරීමට උත්සාහ ගන්න.**
- **කෝච්චිය**
- **වැස්ස**
- **සුළඟ**
- **ස්වසන අභ්‍යාසයන්හි යෙදීමේ දී ඔබ සිරුරේ තිබිය යුතු ඉරියව් මෙම ක්‍රියාකාරකම තුළ ද තිබීම අත්‍යවශ්‍ය ය.)**

## ස්වර නාම සහ ස්වර සංකේත


**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ගායනයේ මූලික හැකියා වර්ධනය කරගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- x සෞන්දර්ය විෂයන්ගේ මාධ්‍යයන් පැහැදිලි කරයි.
- x නාද සහ ශබ්ද අතර වෙනස දක්වයි.
- x පෙරදිග අපරදිග ස්වර නාම සහ සංකේත සන්සන්දනය කරයි.
- x ස්ථානීය අගයෙන් යුක්තව, ස්වර ගායනයට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ශුද්ධ ස්වර 7 ස්වර පුවරුවක ලකුණු කළ දෘශ්‍ය උපකරණයක්.




- පෙරදිග ස්වරනාම සහ සංකේතත්, බටහිර ස්වරනාම සහ සංකේතත් ඇතුළත් කළ වගු සටහනක්. (2007 - 6 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ 17 වන පිටුව)
- පහත දැක්වෙන කවිය ඇතුළත් දෘශ්‍ය උපකරණයක්.

  සමන්පිච්ච මල් ඉහිරුණු - නිල් තණකොළ පිට්ටනියක්  
  වගෙයි අහස අන්න බලනු - කොච්චර ලස්සන ද රැට
- දර්ශනයක් ඇතුළත් වර්ණ චිත්‍රයක්
- සර්පිනාව වයලීනය/එස්රාජය.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්** :

6 ශ්‍රේණියේ දරුවන්ට සංගීත ස්වර ආගන්තුක විෂය කොටසකි. පෙරදිග සහ අපරදිග සංගීත ක්‍රම දෙකම ස්වර මත ගොඩනැගී ඇති බව පහදා දිය යුතු වේ. සෞන්දර්ය විෂයයන්ගේ මාධ්‍ය පිළිබඳ හඳුන්වා දීම මෙහි දී අවශ්‍ය වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| සාහිත්‍ය | - | භාෂාව | නාට්‍ය | - | අභිනය |
| චිත්‍රකලාව | - | වර්ණ, රේඛා, හැඩතල | සංගීතය | - | නාද |
| නර්තනය | - | චලන | | | |

අපේ කණට ඇසෙන හඬ නාද සහ ශබ්ද වශයෙන් වර්ග දෙකක් ඇති බවත්, එයින් නාද කිසියම් ආකාරයකට සංවිධානය වී ස්වර 7 ක් ගොඩ නැගී ඇති බවත්, හඳුන්වා දිය යුතුය. හින්දුස්ථානී සංගීතයේ සප්තස්වර

සඳහා භාවිත ස්වර නාම සහ සංකේත ද, බටහිර සංගීතයේදී එම ස්වර හා සමානව ස්වර යෙදෙන ආකාරය ත්, ඒවායේ නම් සහ ස්වර සංකේතත්, ස්වර ආරෝහණ අවරෝහණ වශයෙන් පිහිටන ආකාරයත්, ඉගැන්වීම ද, මෙම පාඩමින් අපේක්ෂිතය. මේ සඳහා 2007 - 6 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ 17 වන පිටුව භාවිතයට ගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1

- "සමන් පිච්ච මල් ඉහිරුණු '' කවිය ප්‍රදර්ශනය කරන්න. ඔබට කැමති නාද රටාවකට රසවත් ව ගායනය කරමින් පාඩමට පිවිසෙන්න. කවියේ අදහස සිසුන්ගෙන් විමසන්න. සාහිත්‍යයේ මාධ්‍යය භාෂාව වන බව පැහැදිලි කරන්න. චිත්‍රය ප්‍රදර්ශනය කර එහි අදහස විමසන්න. චිත්‍ර ශිල්පියා යොදා ගෙන ඇති මාධ්‍ය පැහැදිලි කරන්න. මෙසේ නර්තනයේ සහ නාට්‍යයේ මාධ්‍ය පැහැදිලි කරන්න.
(මි. 10යි.)

පියවර 2

- සුදුසු ක්‍රියාකාරකමක් යොදා ගනිමින් අමිහිරි හඬ සහ මිහිරි හඬ සිසුන්ට වෙන් කර ගැනීමට මග පෙන්වන්න. අමිහිරි හඬ ශබ්ද වශයෙන් ද මිහිරි හඬ නාද වශයෙන් ද නම් කරන්න. මිහිරි අමිහිරි හඬ ලැයිස්තුවක් සිසුන් ලවා පිළියෙළ කරවන්න. සංගීතයේ සප්ත ස්වර සංකල්පය පැහැදිලි කරන්න. පෙරදිග, අපරදිග ස්වර නාම සහ සංකේත ඇතුළත් වගුව ප්‍රදර්ශනය කරමින් සාකච්ඡා කරන්න. සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න. විද්‍යුත් යතුරු පුවරුවල ස්වර ලකුණු කිරීමට යොදා ගත් සංකේත පැහැදිලි කරන්න. (මි. 20 යි.)
- ශුද්ධ ස්වර 7 ම ඇතුළත් ඔබට කැමති රාගයකට අයත් සර්ගම් කොටසක් හෝ තාලානුකූල ස්වර කොටසක් තානාලංකාරයක් වැනි වේගවත් වූ ස්වර ඛණ්ඩයක් සමග ස්වර ගයන්න, වයන්න. ස්වරවලට ස්ථානීය අගයක් සප්තකයට අයත් ස්වර ආරෝහණ, අවරෝහණ වශයෙන් ගයා වයා පෙන්වන්න. ස්වර එකිනෙකෙහි ඉහළ පහළ භාවයේ පිළිවෙළ අනුව ස්වර හතෙහි ස්ථානීය අගය රූප සටහන් මගින් පැහැදිලි කිරීමට සිසුන් යොමු කරන්න. (මි.20 යි.)

පියවර 3

- ඉගෙන ගත් ස්වර ස්ථාපන ගීතයක ස්වර ප්‍රස්තාරයක් ගායනයට සිසුන්ට අවස්ථාව දෙන්න. කණ්ඩායම් වශයෙන් ස්වර අෂ්ඨකය ආරෝහණ-අවරෝහණ වශයෙන් ගායනය කිරීමට හැකියාව ඇතිදැයි විමසීමට සිසුන්ට අවස්ථාව දෙන්න. (මි. 20 යි.)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- පෙරදිග අපරදිග ස්වර නාම සහ සංකේත ඇතුළත් වන සේ වාචික ප්‍රශ්න විමසන්න.
- ආරෝහණ - අවරෝහණ වශයෙන් ස්වර 5 ක් හෝ 8ම යොදා ගෙන ගායනයට ඉඩ සලසා අගයන්න.
- බටහිර ස්වර නාම යොදා ගනිමින් ආරෝහණ අවරෝහණ වශයෙන් ගායනයට ඉඩ සලසා අගයන්න. (මි.10 යි.)

**පසුවැඩ**

- ස්වර පුවරු භාණ්ඩයන්හි ස්වර හඳුනාගෙන කැමති ආකාරයකට ආරෝහණ අවරෝහණ ස්වර වාදනය පුහුණුවට යොමු කරන්න. වාදනය කරමින් ගායනය කිරීමට යොමු කරන්න.

**අතිරේක උදව් :**

- ස්වර ගායනාවලට සවන් දීමට යොමු කිරීම.

## පෙරදිග අපරදිග වශයෙන් සංගීතයේ ස්වභාවය

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන, ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ගායනයේ මූලික හැකියා වර්ධනය කරගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- පෙරදිග සහ අපරදිග වශයෙන් සංගීත ක්‍රම දෙකක් ඇති බව වටහා ගනියි.
- භාරතීය සංගීතයේ ප්‍රධාන පද්ධති දෙක හඳුනාගනියි.
- ලෝක සිතියමක පෙර-අපරදිග සංගීතය ප්‍රචලිත රටවල් ලකුණු කරයි.
- ඉන්දීය සිතියමේ සංගීත පද්ධති ලකුණු කරයි.
- මෙරට සංස්කෘතියට භාරතීය සංගීතය එක් වූ අයුරු පැහැදිලි කරයි.
- මහින්දාගමනයෙන් පසු සංස්කෘතිකමය වෙනසක් මෙරට ඇති වූ බව පිළිගනියි
- නූතන ශ්‍රී ලාංකේය සරල සංගීතය පෙරදිග සහ අපරදිග සංගීත ක්‍රමවලින් පෝෂණය ලබා ඇති බව පිළිගනියි.

ගුණාත්මක යෙදවුම්:

- හින්දුස්ථානී රාගධාරී සංගීතයට අයත් ගායනයක්/වාදනයක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක් /තැටියක් සහ වාදන යන්ත්‍රයක් (මෙහි දී 6 ශ්‍රේණියේ දරුවන්ට රස විඳිය හැකි මධ්‍යලය හෝ ද්‍රැතලය රාගධාරී අංගයක් වීම වැදගත් ය.)
- බටහිර සංගීතාංගයක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක්/තැටියක් ( බටහිර සංධ්වනියක හෝ නූතන බටහිර සංගීතාංගයක කොටසක් ඇතුළත් වීම වැදගත් ය)
- උතුරු ඉන්දීය සහ දකුණු ඉන්දීය සංගීත කොටස් ඇතුළත් හඬ පටයක්/තැටියක්
- වර්ණ දෙකක් යොදා ගනිමින් පෙරදිග අපරදිග රටවල් ලකුණු කළ සහ ඉන්දියාවේ උත්තර, දක්ෂිණ ප්‍රදේශ ලකුණු කළ සිතියමක්
- සර්පිනාව වයලීනය/එස්රාජය.

ක්‍රියාකාරකම **සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

පාසල් දරුවන් සංගීතය විෂයක් වශයෙන් අධ්‍යයනය කරන්නේ 6 ශ්‍රේණියේ සිට ය. එබැවින් සංගීතයේ ගැඹුරු ශාස්ත්‍රීය කොටස් ඉගැන්වීමේ දී ඉතා සරල, ලිහිල් ක්‍රමවේද අනුගමනය කරමින් ක්‍රියාකාරකම්වල යෙදෙමින් ඉගෙනීමට යොමු කිරීම ගුරුවරයාගේ වගකීම යි.

පෙරදිග සහ අපරදිග වශයෙන් ලෝක සංගීතය ප්‍රධාන ක්‍රම දෙකක් මත ගොඩනැගී ඇති බව දරුවන් මුලින් ම දැනගත යුතු ය. මේ පිළිබඳ සාකච්ඡාවේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීම වැදගත් ය. රසවත් කථාන්තරයක් ලෙස මේ කරුණු ගුරුවරයාට ඉදිරිපත් කළ හැකි ය.

බෞද්ධාගම, භාෂාව, ශිල්පකලා, ආදී සංස්කෘතික උරුමයන් ශ්‍රී ලංකාවට ගලා ආවේ මහින්දාගමනයෙන් පසු මහා භාරතයෙන් බව පිළිගත් කරුණකි.

පෙරදිග සංගීතය වශයෙන් සලකනු ලබන භාරතීය සංගීතය ද මෙසේ ශ්‍රී ලංකාවට ගලාවිත් ඇත. උත්තර භාරතීය රාගධාරී සංගීතය නැතහොත් හින්දුස්ථානී සංගීතය ශ්‍රී ලාංකික සිංහල ජනයා අතරත්, දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතය නැතහොත් කර්ණාටක සංගීතය ශ්‍රී ලාංකික දමිළ ජනයා අතරත් බෙහෙවින් ජනප්‍රිය විය. විශේෂයෙන් මෙම පාඩම සාකච්ඡාවේ දී බ්‍රිතාන්‍ය පාලන සමය අවසාන භාගයේ දී ඉන්දියාවෙන් මෙරටට පැමිණි නාට්‍ය කණ්ඩායම් නූර්ති නාට්‍ය රඟ දැක්වීම නිසා හින්දුස්ථානී රාගධාරී සංගීතය මෙරට සාමාන්‍ය ජනතාව අතර ද ජනප්‍රියත්වයට පත් වූ බව පැහැදිලි කළ හැකි ය. මීට අමතර ව මහාකවි රවීන්ද්‍රනාත් තාගෝර්තුමන්ගේ ලංකාගමනයෙන් පසු හොරණ ශ්‍රීපාලි විද්‍යායතනය හරහා සංගීත අධ්‍යාපනය මෙරට ආරම්භ වූ බවත්, සහ ශ්‍රී ලාංකිකයන් වැඩි දුරටත් සංගීත අධ්‍යාපනය ලැබීමට ඉන්දියාවේ ශාන්ති නිකේතනය හෙවත් විශ්වභාරතී විශ්ව විද්‍යාලයට සහ ලක්නව් භාත්ඛණ්ඩේ සංගීත විද්‍යාපීඨයට ඇතුළත් වූ බවත් දැක්වීම ප්‍රමාණවත් ය. නූතන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනයාගේ රස වින්දනයට සරල ගී නිර්මාණය වන අතර එම නිර්මාණවල දී හින්දුස්තානී සංගීතයේ මූලිකාංග සමග බටහිර සංගීතයේ සාමාන්‍ය කොටස් ද මිශ්‍ර ව භාවිත කරන බව පැහැදිලි කළ හැකි ය. මෙම කරුණු වඩා දීර්ඝ නොවන ශෛලියකින් ඉතාමත් ම සරල ව පැහැදිලි කිරීමට ගුරුවරයා වග බලා ගත යුතු වේ.

මේ අනුව පාසල් සංගීත අධ්‍යාපනයේ දී හින්දුස්ථානී රාගධාරී සංගීතයට අයත් ශාස්ත්‍රීය සහ ප්‍රායෝගික කොටස් ද, බටහිර සංගීතයේ අත්‍යවශ්‍ය කොටස් ද, පන්ති කාමරයේ දී දරුවන්ට ඉගෙනීමට ඉඩකඩ සැලසෙන බව ද හඳුන්වා දීම වඩාත් සුදුසු ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

පියවර 1

- ශ්‍රව්‍ය පට/තැටි යොදා ගනිමින් හින්දුස්ථානී සහ බටහිර සංගීත කොටස් ශ්‍රවණයට සලසන්න. නැතහොත් ගුරුවරයාගේ දක්ෂකම මත ගයා/වයා පෙන්වන්න. එම කොටස් වෙන් කර හඳුනාගැනීමට උපකාරී වන සේ සිසුන් සමග සාකච්ඡාවක් කරන්න.

(මි.10 යි)

පියවර 2

- වර්ණ යොදා ගනිමින් පෙර-අපරදිග වෙන් කර සලකුණු කළ සිතියම භාවිතයට ගනිමින් සිසුන් ලවා පෙරදිග රටවල් සහ අපරදිග රටවල් වෙන් කරවා ලැයිස්තුවක් පිළියෙළ කරවන්න.
- ඉන්දියාවේ සිතියම් කොටස භාවිතයට ගනිමින් උත්තර සහ දක්ෂිණ වශයෙන් බෙදෙන අයුරු සහ එම කොටස් දෙකට අයත් ප්‍රදේශ, නගර වෙන් කර ලැයිස්තුවක් සකසන්න.
- උතුරු ඉන්දීය සහ දකුණු ඉන්දීය සංගීත කොටස් ශ්‍රවණයට සලසමින් සරල සාකච්ඡාවක් කරන්න.

(මි. 20 යි)

පියවර 3

- පෙරදිග අපරදිග සංගීතය ව්‍යාප්ත රටවල් සහ ඒවායේ ස්වභාවය පිළිබඳ අදහස් දැක්වීමට සිසුන් යොමු කරන්න.
- උතුරු ඉන්දීය සහ දකුණු ඉන්දීය සංගීත පද්ධති පිළිබඳ සිසුන්ගෙන් විමසන්න

(මි.10 යි)

- මහින්දාගමනයෙන් පසු මෙරටට බුද්ධාගම පැමිණීම, ශ්‍රී ලංකාවේ සමාජය තුළ ඇති වූ සංස්කෘතිකමය වෙනස, හින්දුස්ථානී සංගීතය ප්‍රචලිත වූ

අයුරු නූර්ති යුගය සහ රවීන්ද්‍රනාත් තාගෝර්තුමන්ගේ ලංකාගමනය සම්බන්ධ කරගනිමින් රසවත් කථාවක් පන්තියට ඉදිරිපත් කරන්න.

(විනාඩි 15 යි)

- රාග පදනම් කරගත් නූර්ති ගීතයක් ගයා/වයා රසවත් ව පන්තියට ඉදිරිපත් කරන්න. රාගධාරී පසුබිම සිසුන් සමග සාකච්ඡා කරන්න. සිසුන්ට අදහස් දැක්වීමට පොළඹවන්න.
- නූතන ලාංකේය සංගීත නිර්මාණ තුළ රාගධාරී පසුබිම මෙන් ම බටහිර සංගීත ශිල්ප ධර්ම ද ඇතුළත් බව පහදා දෙන්න.

(විනාඩි 15 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- මෙම පාඩම් සැලසුමේ මුලින් සඳහන් කළ ඉගෙනුම් පල ආවරණය වන අයුරින් මෙතෙක් සාකච්ඡා කළ කරුණු පදනම් කර ගනිමින් වාචික ව ප්‍රශ්න කිහිපයක් අසා පිළිතුරු ලබා ගැනීම.

(විනාඩි 10 යි)

**අතිරේක උදව් :**

- පණ්ඩිත් රවිශංකර්, හරිප්‍රසාද් චෞරෂියා, ශිවකුමාර් ශර්මා වැනි භාරතීය සංගීතඥයන්ගේ මධ්‍ය-ද්‍රැත ලය හා බැඳි වාද්‍ය ඛණ්ඩ සහ ගසල්, භජන් ගායනවලට සවන් දීමට යොමු කිරීම.

# ස්වර ස්ථාපන ගීත ගායනය

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | සංගීතයේ මූලිකාංග, ශිල්පාංග, සිද්ධාන්ත හඳුනාගනිමින් වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. |
| නිපුණතා මට්ටම 1.1 | : | ගායනයේ මූලික හැකියා වර්ධනය කරයි. |
| කාලච්ඡේද සංඛ්‍යාව | : | 06 |

ඉගෙනුම් පල :
- ශුද්ධ ස්වර ගායන කුසලතාව ලබයි.
- ස්වර සප්තකය ආරෝහණ අවරෝහණ වශයෙන් ගයයි.
- ශුද්ධ ස්වර අන්තර වටහා ගනියි.
- ස්වර අභ්‍යාස තුළින් ස්වර ස්ථාපන ගී නිර්මාණය වී ඇති බව පිළිගනී.
- ස්වර අභ්‍යාස ගොඩනැගීමට පෙළඹෙයි.
- ගීත ගයමින් රසාස්වාදයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- එක් එක් ස්වර ස්ථාපන ගීතයේ ස්වර සහ පද මාලාව වර්ණ දෙකකින් ප්‍රස්තාර කොට සකසා ගත් දෘශ්‍ය උපකරණ 6 ක්
- ස්වරවාද්‍ය භාණ්ඩයක්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

මෙරට පාසල් සංගීත අධ්‍යාපනයේ ''ස්වර ස්ථාපන ගී'' සංකල්පය බොහෝ කලක සිට භාවිතයේ පවතී. සිසුන් සංගීතය විෂයයක් ලෙස හැදෑරීම අරඹනුයේ 6 වැනි ශ්‍රේණියේ සිට ය. දරුවාට ස්වර ගැයුම ආගන්තුක ය. එබැවින් සෘති ස්වරයේ සිට අඩු පරාසයකින් අරඹා වැඩි පරාසයක් දක්වා ස්වර විහිදීම ක්‍රමයෙන් සිදුවන ලෙස ගොඩනගා ඇති ස්වර ස්ථාපන ගීත ප්‍රායෝගික ව අභ්‍යාසයේ යෙදවීම මෙහිදී සිදුවේ.
ගී පද මගින් ස්වර ස්ථාපනය සිදු කොට ගී පද නිවැරදි ව ගායනය හුරු වූ පසු ඊට අදාළ ස්වර ප්‍රස්තාරය සිසුන් සමග ගායනය කළ යුතු වේ. මේ සඳහා නිර්දේශිත ශුද්ධ ස්වර ස්ථාපන ගී පහත දැක්වේ. මේ සඳහා පද්ධතියේ මෙතෙක් භාවිත කළ ස්වර ස්ථාපන ගීවලට අමතර ව මෙවර විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් මෙම ක්ෂේත්‍රයට හඳුන්වාදෙන ශාස්ත්‍රපති සුදත් සමරසිංහ විසින් රචිත අභිනව ස්වර ස්ථාපන ගී පොතෙන් ගීත තෝරා ගත හැකි ය. එහි සී.ඩී. තැටිය ද භාවිත කළ හැකි ය. මෙමගින් ස්වර ස්ථාපන ගීයට නවමු ප්‍රවේශයක් එක් කර ඇති අතර ඒ ඇසුරින් මෙතෙක් භාවිත කළ ගීත ද නව මුහුණුවරකින් භාවිත කිරීමට හැකිවනු ඇත. උදා:-

1. හොඳ දේ හිතමී - '' ස '' සිට '' රි '' දක්වා
2. ගී ගයන මේ කුරුළු යාලුවන් හා - '' ස '' සිට '' රි '' දක්වා
3. ඈත ආකහේ - '' ස '' සිට '' ග '' දක්වා
4. එකට සතුටු සාගරේ - '' ස '' සිට '' ම'' දක්වා
5. කඳුපෙල අතරේ - '' ස '' සිට '' ප '' දක්වා
6. කඳු කඳු නැගෙනා - මන්ද්‍ර ස්වර පුහුණුව
7. මුනිසිරි පාදේ - '' ස '' සිට '' උච්ච ස '' දක්වා
8. ඈත ඈදී යලි මෑතට පාවේ - '' මන්ද්‍ර ධ '' සිට '' උච්ච ස '' දක්වා
9. බැතිනා සිරිපා කරුණා - ආරෝහණ අවරෝහණ ස්වර ගායනය
10. ඈත හිමේ ගිරිමුදුනේ - ස්වර අභ්‍යාස රටා ගායනය

කාලච්ඡේද 2 ක දී ගීත දෙකක් ස්වර ප්‍රස්තාර සමග ගායනය පුහුණුවට යොදා ගැනීම වඩාත් ඵලදායී වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

පියවර 01

- 5 ශ්‍රේණියේ දී සිසුන් අධ්‍යයනය කර ඇති ගීතයක් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට ඉඩ දෙන්න. ඉදිරිපත් කළ ගායනය අගයන්න. ගුරුවරයා විසින් රසවත් ස්වර ප්‍රස්තාරයක් ගායනය කර පෙන්වන්න. ස්වර ගායනයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(මි. 10 යි)

පියවර 02

- දෘශ්‍ය උපකරණයක් මගින් පළමු ස්වර ස්ථාපන ගීතය ප්‍රදර්ශනය කරන්න. කොටසින් කොටස ගායනය හුරු කරවන්න. පද මාලාව තහවුරු වූයේ නම් ඒ අනුව ස්වර ප්‍රස්තාරය ගායනය කරවන්න. ගී පද එක් කණ්ඩායමකුත් ස්වර තවත් කණ්ඩායමකුත් වශයෙන් විවිධ ප්‍රවේශ යොදා ගනිමින් නැවත නැවත ගායනයේ යොදවන්න.

(මි. 30 යි)

- දෙවන ස්වර ස්ථාපන ගීතය ද ඉහත ක්‍රමය අනුව පුහුණු කරවන්න.

(මි. 20 යි)

පියවර 03

- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව ගීත දෙක ගායනයට සලස්වන්න.
- ස්වර ප්‍රස්තාර නියමිත නාදස්ථාන අනුව ගායනයට යොමු කරන්න.
- අභ්‍යාස පොතේ ගීත දෙක ප්‍රස්තාර කරගැනීමට ඉඩ සලසන්න.

(මි. 15 යි)

ඇගයීම හා තක්සේරු කරණය සඳහා උපදෙස් :

- වඩාත් මිහිරි ව හා නිවැරදි ව ගායනය කරන ශිෂ්‍යයා/ ශිෂ්‍යාව පන්තිය ඉදිරියට කැඳවා ගීත ගායනයට සලස්වා ආදර්ශයක් ලෙස අගය කරන්න.

(මි. 05 යි)

**පසුවැඩ :**

- අභ්‍යාස පොතේ සටහන් කරගත් ගීත වර්ණ දෙකක් භාවිත කර සටහන් පොතේ ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.
- නිර්දේශ කර ඇති ගීත 7 න් ඉතිරි වන ගීතය නිදහස් කාලයක දී පුහුණු කරන්න.

**අතිරේක උදව් :**

- 2008 - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 36, 91-92 ස්වර ස්ථාපන ගී ප්‍රස්තාර දක්වා ඇත.

ක්‍රියාකාරකම 05

# සංගීත භාණ්ඩ වාදනය කරමු

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහාගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සරල සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනී.

මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත් ස්වර පුවරුව, මවුත් ඕගන්/(හාමොනිකා) රෙකෝඩර් ෆ්ලුට්, හාර්මෝනියම් වැනි භාණ්ඩ අතරින් එකක් සරල ව වාදන හුරුව සහ සාමූහික ක්‍රියාකාරකම්.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගෙනුම් පල :

- පහසුවෙන් පරිහරණය කළ හැකි සංගීත භාණ්ඩ හඳුනාගනී.
- එම භාණ්ඩයන්හි ස්වර පිහිටන ආකාරය වටහාගනියි.
- එම භාණ්ඩයන්හි ස්වර සප්තකය හා සරල තනුවක් වැයීමට හැකියාව ලබාගනී.
- මෙම භාණ්ඩ වාදනයේ ඇති පහසුතා වටහාගනී.
- මෙම භාණ්ඩ වාදනය තුළින් සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ ඇල්මක් ඇති කරගනී.
- ක්‍රීඩාමය අත්දැකීමක් ලෙසින් භාණ්ඩ වාදනයේ හුරුව ලබයි.

ගුණාත්මක යෙදවුම් :

- මවුත්ඕගන්, රෙකෝඩර්, ෆ්ලුට්, ග්ලොකන් ස්පීල්, විදුලි ඕගන්, මෙලෝඩිකා කිහිපයක්.
- එම වාද්‍ය භාණ්ඩයකින් වැයෙන සංගීත ඛණ්ඩයක් අඩංගු සීඩී තැටියක් හෝ කැසට් පටයක් හා යන්ත්‍රයක් මෙම සංගීත භාණ්ඩයන්හි ස්වර පිහිටීම දැක් වූ දෘශ්‍ය උපකරණයක්.
- වාදන ඉරියව් දක්වා සකසා ගත් දෘශ්‍ය උපකරණ.
- සරල තාල වාද්‍ය භාණ්ඩයක්.

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

සංගීත භාණ්ඩ අතුරින් නිශ්චිත ව ස්වර පිහිටා ඇති භාණ්ඩ මෙහි දී සරල සංගීත භාණ්ඩ යනුවෙන් අර්ථ දක්වා ඇත. මෙසේ හඳුනාගත් භාණ්ඩ විශාල ප්‍රමාණයක් දැක්විය හැකි ය. පහසු මුදලකට සපයා ගත හැකි වීම හා සරල ව පහසුවෙන් වාදනය කළ හැකි වීම මෙම භාණ්ඩවල විශේෂත්වය යි. සංගීත විෂය ධාරාව මුලින් ම හඳුනාගන්නා 6 ශ්‍රේණියේ දී සිසුන්ට මෙම භාණ්ඩ ඇසුරු කිරීමට හුරු කිරීමෙන් විෂය කෙරෙහි ආශාවක්, ඇල්මක් ඇති කිරීම අරමුණ යි. මෙහි දී ස්වර සප්තකය හඳුනා ගැනීම, වාදනය කිරීමට පුහුණු වීම, ක්‍රීඩාමය අත්දැකීමක් ලෙසින් ලබා දීම තුළින් දරුවාට එම භාණ්ඩය සමීප කිරීමට හැකි වනු ඇත. මෙම ක්‍රියාකාරකම සඳහා කාලච්ඡේද 5 ක් වෙන් කර ඇති බැවින් විවිධ වූ ක්‍රියාකාරකම් 5 ක් කළ හැක. එමෙන් ම සංගීත භාණ්ඩ වෙන වෙන ම කණ්ඩායම් කර ගත යුතු ය.

මවුත් ඕගන්, රෙකොඩර්, ෆ්ලුට් වැනි භාණ්ඩ මිලෙන් අඩු ය. මීට අමතර ව පාසලේ තූර්ය වාදක කණ්ඩායමේ ඇති මෙලෝඩිකා ද මේ සඳහා

යොදා ගත හැක. මෙම පාඩම ආරම්භ කිරීමට සතියකට දෙකකට පෙර මෙම සංගීත භාණ්ඩ සපයා ගැනීමට සිසුන්ට උපදෙස් ලබාදීම සුදුසු ය.

පාඩම සංවර්ධනය :

පියවර 01

- සරල ස්වර වාද්‍ය භාණ්ඩයකින් වැයෙන සංගීත ඛණ්ඩයක් කැසට් පටයක් හෝ ඍ තැටියක් මගින් සිසුන්ගේ ශ්‍රවණයට සලස්වන්න.
- ඒ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ගුරුවරයා විසින් සරල සංගීත භාණ්ඩයකින් සරල ගීත ඛණ්ඩයක් වාදනය කරන්න. නිල් අහස් තලේ රැ ඔඅසබනකැ එඅසබනකැ*
- මෙම භාණ්ඩ වාදනය කිරීම පහසු බව සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මි.20)

පියවර 02

- එක් එක් සංගීත භාණ්ඩයන්හි ස්වර පිහිටීම හා ව්‍යුහය පිළිබඳ ව සකසා ගත් දෘශ්‍ය උපකරණ ප්‍රදර්ශනය කරන්න.
- එක් එක් භාණ්ඩයන්හි ස්වර පිහිටීම පිළිබඳ ව සිසුන් දැනුවත් කරමින් ඔවුන් සමඟ සාකච්ඡා කරන්න. ස්වර අෂ්ඨකය වාදනයට හුරුකරවන්න.
- සංගීත භාණ්ඩ වර්ගය අනුව සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න. (ᴾලර්ලකලෘ වශයෙන්)
- ඇමුණුම 1, 2, 3, 4, කණ්ඩායම්වලට බෙදා දෙන්න. (එක ඇමුණුමකින් පිටපත් 4 ක් අවශ්‍ය වේ.)
- ගුරුවරයා එක් එක් කණ්ඩායම් වෙත ගොස් අවනද්ධ භාණ්ඩයක් වාදනය කරමින් ඔවුන්ට උදව් ලබා දෙන්න.

(මි. 60)

පියවර 03

- සිසුන් කණ්ඩායම් කර බෙදා දුන් ඇමුණුම් වාදනය කරවන්න.
- එක් එක් කණ්ඩායම් සම්පූර්ණ ස්වර ප්‍රස්තාර වාදනය කිරීමට පොළඹවන්න.

(මි. 20)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

වඩාත් හොඳින් වයන කණ්ඩායම හෝ සිසුන් තෝරා ඉදිරියට කැඳවා වාදනය කිරීමට සලස්වා ඔවුන් අගයන්න. (මි.20)

පසු අභ්‍යාස : වාදනය කිරීම සඳහා සරල ස්වර ප්‍රස්තාර සිසුන්ට ලබා දෙන්න. ස්වර ස්ථාපන ගී, සරල ළමා ගී ආදියෙහි ප්‍රස්තාර සොයා ගැනීමට සිසුන් පොළඹවන්න. ළමුන්ගේ විවේක අවස්ථා සංගීත භාණ්ඩය සමග ගත කිරීමට ඔවුන් උනන්දු කරන්න.

අතිරේක උදව් : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශවල සටහන් කර ඇති ස්වර ස්ථාපන ගීත, ළමා ගීත ආදිය ප්‍රස්තාර භාවිත කරන්න.

ᴾ කණ්ඩායම - ්රපදබසජ් (මවුත් ඕගන්)
ර් කණ්ඩායම - ග්ලොකන් ස්පිල් - ධරට්බ ඃඉැකක එදබ෴ැකැජඑ කරන්න.)
ක කණ්ඩායම - එැකදාසජ් ලා්රපදබසමප
ෘ කණ්ඩායම - ඍැජදරාැර කෙමඑැ

ඇමුණුම 1

Þ කණ්ඩායම

ස ස ස / ග ග ග / ප ප ප / ග ග ග /

ඊ කණ්ඩායම

ග - - / ප - - / ග - - / ස - -

ක කණ්ඩායම

ග ග ග / ග ග ග / ග ග ග / ග ග ග

a කණ්ඩායම

ග ස ස/ ග ස ස/ ග ස ස / ග ස ස

ඇමුණුම 2

Þ කණ්ඩායම ග - ම / ප - - / ග - රි / ස - - /

ක කණ්ඩායම රි - ග / ම - - / ප - ම / ග - - /

z කණ්ඩායම ස ස ස / ස - - / ස ස ස / ස - - /

Þ කණ්ඩායම ප ප ම / ප ප ම / ග ග රි / ග ග රි /

ක කණ්ඩායම රි ග ම / රි ග ම / ග රි ස / ග රි ස /

ඇමුණුම 3

Þ කණ්ඩායම ස - රි - / ග - ම - / ප ප ප ප / ප - - - /

ක කණ්ඩායම ප - ම - / ග - රි - / ස ස ස ස / ස - - - /

z කණ්ඩායම ස ස ස ස / ස - - - / ස ස ස ස / ස - - - /

Þ කණ්ඩායම ස රි ස රි / ස රි රි රි/ රි ග රි ග / රි ග රි ග /

ක කණ්ඩායම ග ම ග ම / ග ම ග ම / ම ප ම ප / ම ප ම ප /

ඇමුණුම 4 ඔඅසබනකැ ඔඅසබනකැි දබට

ස - ස - / ප - ප - / ධ - ධ - / ප - - - /

ම - ම - / ග - ග - / රි - රි - / ස - - - /

ප - ප - / ම - ම - / ග - ග - / රි - - - /

ප - ප - / ම - ම - / ග - ග - / රි - - - /

ස - ස - / ප - ප - / ධ - ධ - / ප - - - /

ම - ම - / ග - ග - / රි - රි - / ස - - - /

# සරල සංගීත භාණ්ඩවලින් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.2 : සරල සංගීත භාණ්ඩ වාදන කුසලතා වර්ධනය කර ගනී.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- පහසුවෙන් වාදනය කළ හැකි භාණ්ඩ වාදනයේ යෙදෙමින් තෘප්තියක් ලබයි.
- තාලානුකූල ස්වර අභ්‍යාස වාදනයේ යෙදෙයි.
- තෝරාගත් භාණ්ඩයෙන් නිවැරදි ස්වර වාදන හැකියාව ලබයි.
- ස්වර අභ්‍යාසයේ යෙදීම, වාදන කුසලතා වර්ධනයේ දී වැදගත් වන බව පිළිගනී.

ගුණාත්මක යෙදවුම් :
- වාදන පහසුතා ඇති සංගීත භාණ්ඩ (මවුත් ඕගන්, ග්ලොකන් ස්පිල් මෙලෝඩිකා ආදී)
- තාලානුකූල ස්වර අභ්‍යාස ලියූ පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

මීට පෙර පාඩමේ දී සිසුන් විසින් ස්වර සප්තකය හා සරල ස්වර ඛණ්ඩ වාදනය කර සංගීත භාණ්ඩය පිළිබඳ යම් අවබෝධයක් හා පහසුවක් ලබා ඇත. මෙම පාඩමේ අරමුණු වන්නේ තාලාත්මක ස්වර අභ්‍යාස වාදනය කිරීම තුළින් සිසුන්ගේ හස්ත සාධනය කිරීම හා භාණ්ඩයට අදාළ යම් යම් ශිල්ප ක්‍රම නිතැතින් ම ලබා දීම යි. තාලයක් මත ස්වර අභ්‍යාස වාදනය කිරීම තුළින් සිසුන්ගේ හස්ත සාධනය කිරීම හා භාණ්ඩයට අදාළ යම් යම් ශිල්ප ක්‍රම නිතැතින් ම ලබා දීම යි. තාලය සමග ස්වර අභ්‍යාස වාදනය කරන බැවින් සිසුන්ගේ තාල හැකියාව ද මේ මගින් සංවර්ධනය කරගත හැකි ය.

3/3 හා 4/4 මාත්‍රා බෙදන අයුරින් මෙම ස්වර අභ්‍යාස නිර්මාණය කරගත හැකි ය. 6 ශ්‍රේණියේ සිසුන් බැවින් ඉතා ම සරල අයුරින් මේවා නිර්මාණය කරගත යුතු ය. මීට පෙර පාඩමේ දී සරල ස්වර ඛණ්ඩ වාදනය කරමින් අත්දැකීම් ලබා ඇති දරුවන් මේ වන විට භාණ්ඩයේ ස්වර පිහිටීම හා ස්වර පිළිබඳ වැටහීම ලබා ඇත.

පාඩම සංවර්ධනය :

පියවර 01
- මීට පෙර ක්‍රියාකාරකමේ දී වාදනය කර ඇති ස්වර ඛණ්ඩයක් සාමූහික ව වාදනයේ යොදවන්න.
- දක්ෂ ලෙස වාදනය කරන සිසුන් අගයන්න.

(මි. 10)

පියවර 02
- තාලානුකූල ස්වර අභ්‍යාස ඇතුළත් පත්‍රිකා ප්‍රදර්ශනය කරන්න. (ඇමුණුමේ දක්වා ඇත. )
- තෝරාගත් ස්වර අභ්‍යාස එක් එක් භාණ්ඩයෙන් වාදනය කරන අයුරු පෙන්වන්න.
- ඒ අනුව භාණ්ඩ වාදනයේ යොදවන්න.
- භාණ්ඩ වර්ග අනුව කණ්ඩායම් කර වාදනයට මග පෙන්වන්න.

(මි. 40)

පියවර 03
- එක් එක් භාණ්ඩ වර්ගයට අයත් කණ්ඩායම ලවා ස්වර අභ්‍යාස වාදනය කර ප්‍රදර්ශනය කරන්න.
- දක්ෂතා අගයන්න. (මි. 15)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

එක් එක් පියවරේ දී දක්ෂතා ඇති දරුවන් අගයමින් අපහසුතා දක්වන දරුවන්ට පෞද්ගලික ව මග පෙන්වන්න.

(මි.15)

පසු අභ්‍යාස

ස ස / ප ප / ධ ධ / ප - /
ම ම / ග ග / රි රි / ස - /
ප ප / ම ම / ග ග / රි - /
ස ස / ප ප / ධ ධ / ප - /
ම ම / ග ග / රි රි / ස - /

අතිරේක උදව්

ඔඅසබනකැ එඅසබනකැ කසළුඑකැ ිඒරල ඊ්ෆ් ඉක්ජනි යසව ධකා ප්ජ ාදබ්කා ය්ා ි ේරපයන ගීතවල ස්වර ප්‍රස්තර ලබාදෙන්න.

ඇමුණුම 1

ස - - / රි - - / ග - - / ම - - /
ප - - / ධ - - / නි - - / ස̇ - - /
ස̇ - - / නි - - / ධ - - / ප - - /
ම - - / ග - - / රි - - / ස - - /

ඇමුණුම 2

ස - - - / ග - - - / ප - - - / ග - - - /
රි - - - / ම - - - / ධ - - - / ම - - - /
ග - - - / ප - - - / නි - - - / ග - - - /
ස - - - / ග - - - / ප - - - / ග - - - /

ඇමුණුම 3

ස රි ග ම / ප - ප - / රි ග ම ප / ධ - ධ - /
ග ම ප ධ / නි - නි - / ම ප ධ නි / ස̇ - ස̇ - /
ස̇ නි ධ ප / ම - ම - / නි ධ ප ම / ග - ග - /
ධ ප ම ග / රි - රි - / ප ම ග රි / ස - ස - /

ඇමුණුම 4

ස - ස - / ග රි ස - / රි - රි - / ම ග රි - /
ග - ග - / ප ම ග / ම - ම - / ධ ප ම - /
ප - ප -/ නි ධ ප - / ධ - ධ - / ස̇ නි ධ - /

ඇමුණුම 5

ස රි ග ම / ප ම ග රි / ස රි ග ම/ ප - ප - /
රි ග ම ප / ධ ප ම ග / රි ග ම ප / ධ - ධ - /
ග ම ප ධ / නි ධ ප ම / ග ම ප ධ /නි - නි - /
ම ප ධ නි / ස̇ නි ධ ප / ම ප ධ නි /ස̇ - ස̇ -
ස̇ නි ධ ප / ම ප ධ නි / ස̇ නි ධ ප / ම - ම -
නි ධ ප ම / ග ම ප ධ / නි ධ ප ම / ග - ග -
ධ ප ම ග / රි ග ම ප / ධ ප ම ග / රි - රි -
ප ම ග රි / ස රි ග ම / ප ම ග රි / ස - - -

# සංගීත භාණ්ඩ හඳුනාගැනීම

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.2 : වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගෙනුම් පල :
- තෝරාගත් වාද්‍ය භාණ්ඩය පිළිබඳ ව සරල අවබෝධයක් ලබයි.
- අනෙකුත් වාද්‍ය භාණ්ඩ පිළිබඳ ව හැඳිනගැනීමට ඇල්මක් දක්වයි.

ගුණාත්මක යෙදවුම් :
- භාණ්ඩ පිළිබඳ පිටපත් කරගන්නා ලද හැඳින්වීම් පත්‍රිකා
- භාණ්ඩ වාදන අයත් ඪක තැටි
- සපයා ගත හැකි නිර්දේශිත භාණ්ඩ

පාඩම සැලසුම සඳහා උපදෙස් :

6 ශ්‍රේණියේ දී මුලින් ම සංගීතය හැදෑරීමට පැමිණෙන සිසුන්ට සංගීත භාණ්ඩ පරිහරණය පිළිබඳ ඇති අත්දැකීම් අල්ප ය. නිර්දේශිත භාණ්ඩ වාදනයට පෙර එම භාණ්ඩය හා පරිහරණය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම වඩාත් ප්‍රතිඵලදායක වනු ඇත. ප්‍රායෝගික හැදෑරීම සඳහා නිර්දේශිත වයලීනය, සිතාරය, එස්රාජය, දිල්රුබාව, ගිටාරය, බටනලාව, තබ්ලා යන භාණ්ඩ සියල්ලට පින්තූර සහිත ව කෙටි හැඳින්වීම් පත්‍රිකා ලබා දී ඒ තුළින් ස්වයං අධ්‍යයනයක් කිරීම මේ ක්‍රියාකාරකම තුළින් අපේක්ෂිත ය. නමුදු සියලු හැඳින්වීම් පත්‍රිකා සෑම දරුවකුට ම ලබා දීම අපේක්ෂා නොකෙරේ. තමන් තෝරාගත් භාණ්ඩයට අදාළ හැඳින්වීම් පත්‍රිකාව පමණක් අධ්‍යයනයට යොමු කිරීම ප්‍රමාණවත් ය. සෑම දරුවකුට ම කේවල ව අධ්‍යයනයට පහසුකම් සැලසෙන සේ හැඳින්වීම් පත්‍රිකා පිටපත් කොට ලබා දෙන්න. සන්තූර්, සරෝද්, ෂෙහනායි යන සංගීත භාණ්ඩ සඳහා කියවීම් පත්‍රිකා මේ අනුව සකසා ගන්න.

පාඩම් සංවර්ධනය

පියවර 01
- ගුරුවරයාට වඩාත් හොඳින් වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩයකින් වාදනයක් ඉදිරිපත් කිරීම හෝ වාද්‍ය බණ්ඩ ඇතුළත් ඪක තැටියටත් ප්‍රදර්ශනයෙන් එම වාදනය පිළිබඳ ව සිසුන් සමග කෙටි සාකච්ඡාවක යෙදීම. (මි. 10)

පියවර 02
- නිර්දේශිත වාද්‍ය භාණ්ඩ අතුරින් ළමුන් තෝරාගත් වාද්‍ය භාණ්ඩ සැලකිල්ලට ගෙන ඔවුන් වර්ග කරන්න. අනතුරු ඔවුන්ට අදාළ කියවීම් පත්‍රිකාව ලබා දී ස්වයං අධ්‍යයනයකට ඉඩ සලසා දෙන්න.

(මි. 70)

පියවර 03
- අධ්‍යයනය කළ කරුණු පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න. ඌන පූරණය සඳහා සජීවී ව යොදා ගත හැකි භාණ්ඩ උපයෝගී කොට ගන්න. (මි.10)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

සුදුසු පරිදි කෙටි වාචික ප්‍රශ්න විමසීමෙන් අගයන්න.

(මි. 10)

පසු අභ්‍යාස : පුවත් පත් සඟරා, ග්‍රන්ථ ඇසුරින් සංගීත භාණ්ඩ පිළිබඳ අධ්‍යයනයට

යොමු කරන්න. පහසුකම් ඇත්නම් අන්තර්ජාලය අධ්‍යයනය කිරීමට මග පෙන්වන්න.

කියවීම් පත්‍රිකා අංක 01

බටනලාව

- මෙය සුළඟේ ආධාරයෙන් නාදය උපදින එනම් සුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් භාණ්ඩයකි.
- මෙය නිර්මාණය කොට ඇත්තේ උණ බට වර්ගයකිනි.
- බටනලාව සිදුරු 7 කින් සමන්විත ය. එයින් එක් සිදුරක් පිඹීම සඳහා ද අනෙක් සිදුරු 6 අතැඟිලි තැබීම සඳහා ද යොදා ගනී.
- දෑතෙහි, මාපටැඟිලි දෙකත් සුළැඟිලි 2ත් හැර ඉතිරි ඇඟිලි 6 වාදනයේ දී සිදුරු ඇරීම වැසීම සඳහා භාවිතයට ගනී.
- බටනලාවක මන්ද්‍ර පංචමයේ (ප) සිට උච්ච පංචමය (ප) දක්වා ස්වර වාදනය කළ හැකි ය. (ඇතැම් ප්‍රවීණ සංගීතඥයන් මෙම සීමාව අභිබවා වාදනය කරන අවස්ථා ද ඇත.)
- විවිධ ප්‍රමාණයෙන් යුත් බටනලා භාවිතයේ පවතී. අනෙක් භාණ්ඩ මෙන් බටනලාව ඒ ඒ අවස්ථාවේ දී සුසර කළ නොහැකි නිසා එක් එක් ශ්‍රැතියට ගැළපෙන ලෙස විවිධ ප්‍රමාණයෙන් යුත් බටනලා අවශ්‍ය වේ.
- තිරස් හා සිරස් යනුවෙන් බටනලා වර්ග දෙකකි. තිරස් බටනලා හරස් අතට වාදනය කෙරේ. ඒවා මුරලි යනුවෙන් හැඳින්වේ. සිරස් බටනලා කෙළින් අතට වාදනය කෙරේ. ඒවා බන්සූරි නමින් හඳුන්වනු ලැබේ.

කියවීම් පත්‍රිකා අංක 02

**සර්පිනාව**

- මෙය සුළඟේ ආධාරයෙන් නාදය උපදින වාද්‍ය භාණ්ඩයකි. ස්වර පුවරු භාණ්ඩ වර්ගයට අයත් වන මෙහි කලු සහ සුදු අකුරු ඇත.
- මේවා සිංගල් රීඩ්, ඩබල් රීඩ්, ත්‍රී සෙට් ආදි වශයෙන් නලා අනුව වර්ග කර ඇත.
- සුළඟ යෙදීමේ ආකාරය අනුව හැන්ඩ්බැලෝ - ෆුට් බැලෝ ලෙස ව්‍යවහාර කෙරේ.
- ඔටෝමැටික්, ස්කේල් චේන්ජ්ර් ආදි වශයෙන් ද වර්ග කෙරේ.
- බටහිර ශිල්ප ක්‍රම වන කෝඩ්ස් හා හාර්මනි වැනි අංග ද වාදනය කළ හැකි ය.
- ලී පෙට්ටියක් සහිත ය. නලා නිම වී ඇත්තේ පිත්තල ලෝහයෙනි.
- බැලෝ එකෙන් ඇතුළට ගන්නා වාතය නලාව හරහා පිටවීමෙන් එහි ඉපියාවෙහි ඇති වන කම්පනය මගින් නාදය උපදී.
- භජන්, ගසල්, කවාලි යන ගායනවල දී මෙන් ම පැරණි ගීත, හා සරලගීත ගායනය වාදනයේ දී බහුල ව යොදාගන්නා අතර නූර්ති සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය යි.

### කියවීම් පත්‍රිකා අංක 03

වයලීනය

- පෙරදිග/අපරදිග සම්ප්‍රදායයන් දෙකෙහිම භාවිත වන සංගීත භාණ්ඩයකි.
- තත් වාද්‍ය භාණ්ඩයක් වන මෙය තත් 4 කින් සමන්විත ය.
- එම තත් දකුණේ සිට වමට සිහින් තතේ සිට මහත තත තෙක් පිළිවෙළින් යෙදී ඇත.
- වයලීනය වාදනය කරනුයේ ඊදඅ ආධාරයෙනි.
- වයලීනය, වියෝලා, චෙලෝ, ඩබල් බේස් යනු වයලීන් පවුලෙහි භාණ්ඩ 4 අතර ඉන් කුඩා ම සාමාජිකයා වයලීනය වේ.
- පෙරදිග හා අපරදිග සම්ප්‍රදායයන්හි වයලීන් වාදනයේ ඉරියව් මෙන් ම සුසර කිරීමේ ක්‍රමය ද වෙනස් ය.

### කියවීම් පත්‍රිකා අංක 03

සිතාරය

- මෙය හින්දුස්ථානී සංගීතයේ භාවිත වන ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය යි.
- මෙය තත් වාද්‍ය භාණ්ඩයකි.
- මෙහි ප්‍රධාන තත් 7 කි. නමුත් ප්‍රධාන වශයෙන් ස්වර නිපදවනුයේ "නායකී තාර්" නමින් හඳුන්වන ප්‍රධාන තතෙනි.
- ප්‍රධාන තත් 7 ට අමතර ව ඉතා සිහින් තත් පෙළක් ඇත. ඒවා තරෆ් තත් (අනු නාද තත්) ලෙස හඳුන්වයි.
- සිතාරයේ දාන්ඩි දැවයෙන් නිමවා ඇති අතර තුම්බාව ඉන්දියානු වට්ටක්කා විශේෂයකින් නිමවා ඇත.
- සිතාරයේ දිගැති ලී කඳ මත එහා මෙහා කළ හැකි පිත්තල කුරු (පර්දා) 20 කි. ඒවා ස්වර නිපදවා ගැනීම සඳහා උපයෝගි කොට ගනී.
- සිතාරය වාදනය කිරීම සඳහා දකුණතෙහි දබරගිල්ලේ පළඳින විශේෂ උපකරණයක් ඇත. එය මිස්රාබ් නම් වේ.

### කියවීම් පත්‍රිකා අංක 04

එස්රාජය

- උතුරු ඉන්දීය (හින්දුස්ථානී) සංගීත සම්ප්‍රදායට අයත් භාණ්ඩයක් වන මෙය වඩා ප්‍රචලිත ව ඇත්තේ බෙංගාල ප්‍රාන්තයේ ය. (බටහිර බෙංගාලය)
- මෙය තත් වාද්‍ය භාණ්ඩයකි.
- මෙහි ප්‍රධාන තත් 4 කි. එයින් ස්වර උත්පාදනය කරනු ලබන්නේ මුලින් ම පිහිටුවා ඇති ප්‍රධානතම තතෙනි. එය 'බාජ්කා තාර්' ලෙස හඳුන්වයි.
- මෙහි උඩ කොටස සිතාරයටත් පහළ කොටස සාරංගිය නමැති භාණ්ඩයටත් සමානතාවක් දක්වයි. ඒ හැඩයෙන් පමණි. ප්‍රමාණයෙන් නොවේ.
- මෙහි භාවිත වන අනුනාද (තරෆ්) තත් නිසා හඬේ මිහිරි බව වැඩි ය.
- මෙය වාදනය කරනුයේ ඊදඅ ආධාරයෙනි.
- මෙහි දාන්ඩි හා තුම්බාව දැව භාවිතයෙන් නිමවා ඇත. තුම්බාව මත යොදා ඇත්තේ

සත්ත්ව සමකි.

## කියවීම් පත්‍රිකා අංක 05

දිල්රුබාව

- හින්දුස්ථානි සංගීතයේ භාවිත වන තත් වාද්‍ය භාණ්ඩයකි. හැඩයෙන් එස්රාජයට සමාන ය. එහෙත් ප්‍රමාණයෙන් එස්රාජයට වඩා තරමක් විශාල වේ.
- මෙය වාදනය සඳහා ඊදඅ උපයෝගී කොට ගැනේ.
- මෙහි ප්‍රධාන තත් 4 කි. කම්පන අනු තත් 22 කින් ද යුක්ත ය.
- දිල්රුබාවේ හරස් අතට බඳින ලද ලෝහ යතුරු (පර්දා) 18 ක් ඇති අතර, එමගින් අදාළ ස්වර උපදවා ගනු ලබයි.
- මෙම භාණ්ඩය දකුණතින් ඊදඅ ඇතිල්ලීමෙන් ද වමතින් තත් යතුරු (පර්දා) මතට වමතේ ඇඟිලි තෙරපීමෙන් ද වාදනය කරනු ලබයි.

## කියවීම් පත්‍රිකා අංක 06

ගිටාරය (ඊදංරුීඑබසිය)

- තත් වාද්‍ය භාණ්ඩයක් වන මෙය තත් 6 කින් යුක්ත ය. පසුකාලීනව තත් 12 දක්වා වැඩිදියුණු කළ ඒවා ද ඇත.
- ලෝකයේ බොහෝ රටවල බහුල ව භාවිත කෙරෙන වාද්‍ය භාණ්ඩයකි.
- ගිටාරය වාදනය කිරීම සඳහා පික් එකක් භාවිත කෙරේ. එය ප්ලාස්ටික් හෝ ෆයිබර්වලින් සාදා ඇත.
- ගීතයක් ගායනයේ දී තාල වාද්‍ය භාණ්ඩයක් නොමැති වුව ද ගිටාරයක් මගින් රිද්මය ද පවත්වා ගනිමින් සහාය වාදනය ලබාගත හැකි ය.
- අනුනාද ඇති කිරීම සඳහා වාත කුටීරයකින් යුක්ත යි.
- ගිටාරයේ ස්වර පුවරුව හරහා ඇති ස්වර ස්ථාන දක්වෙන හරස් ලෝහ පටි (ෆ්‍රැට්) නමින් හැඳින්වේ. ඇඟිලි ඒවා මත තැබීමෙන් ස්වර උත්පාදනය කෙරේ.

## කියවීම් පත්‍රිකා අංක 07

මැන්ඩලීනය ෘබටකසිය

- මෙය බටහිර වාද්‍ය භාණ්ඩයක් වුව ද, උතුරු හා දකුණු ඉන්දියානු සංගීතයේ ද භාවිත වේ.
- තත් වාද්‍ය භාණ්ඩයක් වන මෙය තත් 8 කින් සමන්විත ය.
- තත් 8 කින් යුක්ත වුව ද සුසර කරනු ලබන්නේ ස්වර 4 කට ය. එනම් එක ස්වරයකට තත් දෙක බැගින් සුසර කරනු ලැබේ.
- මෙය වාදනය කරනුයේ පික් (ඡසජන) එකක ආධාරයෙනි.

## කියවීම් පත්‍රිකා අංක 08

තබ්ලාව

- මෙය සත්ත්ව සම් ආධාරයෙන් හඬ උපදවන අවනද්ධ වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩයකි.
- මෙම භාණ්ඩය කොටස් දෙකකින් යුක්ත යි. විශාල කොටස බායාං (ඩග්ගා) ද, කුඩා කොටස දායාං (දහිනා) ලෙස ද හඳුන්වයි.
- බායාං හි බඳ කොටස ලෝහයෙන් තනා ඇති අතර, දායාංහි බඳ කොටස ලීයෙන් තනා ඇත. කොටස් දෙකෙහි ම මතුපිටට යොදා ඇත්තේ සත්ත්ව හම් ය.

- ගීත ගායනයේ දී සහාය වාද්‍ය භාණ්ඩයක් ලෙස ද මෙය උපයෝගී කොට ගැනේ.
- ඒකල වාද්‍ය භාණ්ඩයක් සේ ම මෙය උතුරු ඉන්දියානු සංගීතයේ භාවිත වන අවනද්ධ වාද්‍ය භාණ්ඩ අතුරින් ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස සැලකේ.

ක්‍රියාකාරකම 08

## ගයා වයා විඳිමු ළමා ගී

නිපුණතාව 5.0 : ව්‍යවහාරික සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ ව අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 5.1 : ව්‍යවහාරික සංගීතයේ ළමා ගී ගායනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- ළමා ගී පදමාලා තුළ ඇති ස්වභාවය හා සුවිශේෂත්වය පිළිබඳ අවබෝධය ලබාගනී.
- ළමා ගී ගායන/වාදන කිරීමේ කුසලතාව ලබයි.
- ළමා ගී රස විඳියි.
- ළමා ගී නිර්මාණය කිරීමට පෙළඹෙයි.
- ළමා ගී ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සෙන්පතියන් ගැන, ආදරේ ඇයි පොඩි හඳ මාමේ, ඉරෙන් හඳෙන් යන ළමා ගීවලින් දෙකක් අඩංගු කැසට්, සීඩී, ඩීවීඩී, පෙන්ඩ්‍රයිව් එකක්.
- හාමෝනියම්, ඕගන්, ගිටාර්, තබ්ලා හෝ වෙනත් තාල වාද්‍ය භාණ්ඩයක්
- තෝරාගන්නා ලද ගීත දෙකෙහි පදමාලා අඩංගු දෘශ්‍යාධාරක දෙකක් හෝ ශිෂ්‍ය සංඛ්‍යාවට ගැළපෙන ප්‍රමාණයට ඡායා පිටපත්
- ගුරුවරයාගේ පාඩම් සැලසුමට අනුව සකසන ලද චිත්‍ර, ඡායාරූප, ලිපි ලේඛන වැනි දෑ, ඇමුණුමෙහි ඡායා පිටපත්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :
- විද්‍යුත් මාධ්‍ය ගී අතරින් ළමා ගීතවලට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ශ්‍රව්‍ය මාධ්‍යගත ළමා ගී තුළින් සිය සිතැඟි අනුව චිත්ත රූප මවා ගැනීමට අවකාශය සැලසෙයි.
- ආදරේ ඇයි පොඩි හඳ මාමේ - ඉරෙන් හඳෙන්, සෙන්පතියන් ගැන නිර්දේශිත ගීත අතරෙන් ගීත දෙකක් තෝරාගෙන රස වින්දනයට ලක් කොට ප්‍රාසංගික ව ගායනයට හුරු කිරීම අපේක්ෂිත ය.
- මුල් ගීතවලට හානියක් නොවන සේ ගායනය කිරීම වඩාත් ඵලදායි වේ.

පාඩම සංවර්ධනය :

පියවර 01
- පහසු මාධ්‍යයක් උපයෝගි කරගනිමින් තෝරාගත් ළමා ගීතය ශ්‍රවණයට සැලැස්වීම හෝ වාදනය සහිත ව ගීතය ගුරුවරයා විසින් ගායනය කර ශ්‍රවණයට සලස්වන්න.
- එම ගීතය ගැයීමට හැකියාව ඇති සිසුවකු හෝ සිසුවියක ලවා ගුරුවරයාගේ වාදනය සහිත ව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න. (රංග කුසලතාවෙන් හෙබි සිසුවකුට හෝ සිසුවියකට රංගන අවස්ථාව සලසා දීම වඩාත් යෝග්‍ය වේ.
- ගායනය හා රංගනය අගයමින් උපස්ථම්බනය කරන්න.

(මි. 10)

පියවර 02
- ගායනය සඳහා තෝරා ගත් ගීතයේ පදමාලාව චිත්‍ර, ඡායාරූප, ලිපිලේඛන ප්‍රදර්ශනය කරන්න. ඡායා පිටපත් සිසුන්ට ලබා දෙන්න.

- අදාළ ගීතයේ තනුව සිසුන්ට ග්‍රහණය කරගත හැකි වන සේ ගායනයට හුරු කරන්න.
- සාමූහික, යුගල, ඒකල ආදි වශයෙන් නැවතත් ගායනය කරවන්න.
- දෙවන ළමා ගීතය ද මෙලෙස ගායනයට හුරු කරවන්න.

(මි. 40)

පියවර 03

- පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව සිසු සිසුවියන් කණ්ඩායම් ගත කරන්න.
- ගායනා කරන ලද පළමු ළමා ගීතය ගායනයට ඉඩ දෙන්න.
- ගායනය සමග ඊට සරිලන සරල රංගනයක් නිර්මාණය කර ගැනීමට හා පුහුණුවීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන්න.
- ඒ ඒ කණ්ඩායම් විසින් නිර්මාණය කරන ලද රංගන විලාසයන් සහිත ගායනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. (මි. 20)
- ඉහත ආකාරයට දෙවන ළමා ගීතය ද ගායනයට සලස්වන්න.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කළ එම ප්‍රාසංගික අංග සහිත ගායන අගයන්න.
- ගායනයෙහි සදොස් තැන් නිදොස් කරන්න.
- රංගනයෙහි නිර්මාණාත්මක බව අගයන්න.
- ගීතය හා රංගනය අතර ඇති ගැළපීම් හා නොගැළපීම් පහදා දෙන්න.
- ඉදිරිපත් වීම හා සාමූහික ව කටයුතු කිරීම අගයන්න.

(මි. 10)

පසු අභ්‍යාස :

- විද්‍යුත් මාධ්‍යවලින් ප්‍රචලිත ළමා ගී ගීත ඇල්බමයක් හෝ පොත් පිංචක් සකසන්න.
- 6 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය - 2007 හි 5. 1. 1. 1 ඇමුණුමෙහි සඳහන් ළමා ගීත අතරින් අවම වශයෙන් ගීතයක් ගායනයට පුහුණු වන්න.
- සාහිත්‍ය සමිති, පන්ති රැස්වීම්, උදෑසන රැස්වීමේ දී ළමා ගීතයක් ප්‍රාසංගික ව ඉදිරිපත් කරන්න.

අතිරේක උදව් : 2007 වසරේ සිට ක්‍රියාත්මක ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.1 නිපුණතා මට්ටම

ඇමුණුම 1

'ඉරෙන් හඳෙන් එළිය අරන්...'

ගී පද - සෝමරත්න දිසානායක
සංගීතය - රෝහණ වීරසිංහ
ගායනය - හර්ෂණ දිසානායක
චිත්‍රපටය - සූරිය අරණ

ඇමුණුම 2

පුතා : සෙන්පතියන් ගැන නැව්පතියන් ගැන කතා අහන කොට අම්මේ
මට හරි ආසයි // ඒ ඇයි මගෙ හොඳ අම්මේ
අම්මා සෙන්පතිකමටයි, නැව්පතිකමටයි නම ගිය සිංහල ආරේ
ගති නැරේ පුත ඒකයි ඔබ හට ඒ ගැන එ තරම් ආසා
පුතා - මහ පඬිඳුන් ගැන, මහ කිවිඳුන් ගැන, කතා අහනකොට අම්මේ
මට හරි ආසයි // ඒ ඇයි මගෙ හොඳ අම්මේ
අම්මා - මහ පඬිවරුනට, මහ කවිවරුනට, තෝතැනි වූ ලක් දීපේ
හෙළ පුතෙකුවැ ඔබ ඉපදුනු පිනටයි ඒ ගැන එතරම් ආසා
පුතා - හේන් කුඹුරු ගැන ගොපළු ලියන් ගැන කතා අහනකොට අම්මේ
මට හරි ආසයි // ඒ ඇයි මගෙ හොඳ අම්මේ
අම්මා - ඈත එපිට සිට ගොවි රජ දහනකි සෝබන සිරිබර ලංකා
ගොවිකම ඔබටත් උරුම නිසා වෙනි ඒ ගැන එතරම් ආසා
පුතා - එඩිතරකම් ගැන, බිය නැතිකම් ගැන, කතා අහනකොට අම්මේ
මට හරි ආසයි // ඒ ඇයි මගෙ හොඳ අම්මේ
අම්මා - එඩිතරකමටයි, බිය නැතිකමටයි පෙර සිට සුපතල හෙලයේ
ඉපැදුනු ඔබතුළ ඒ ගති නැතිනම් ඒ නොවැ පුදුමය පුතුනේ

පද රචනය - හියුබත් දිසානායක
සංගීත නිර්මාණය - ආචාර්ය දයාරත්න රණතුංග
ගායනය - මහාචාර්ය අමරා රණතුංග සමග
පුලස්ති ඉන්දික රණතුංග

## සෙන්පතියන් 6/8 C

**Introduction**

DPM GR- / MGR GS- / SSS NNN / DDD P P P

PS- PS- / RGS RMG / S-S RGM / P++ +++

$ Song / ++D PMG

R-- GG- / --M GRG / S-- SS- / --S RSN

S-- RS- / RM- G-- / --R GMP / D-D DPM

Bit

P-- DD- / --S NDP / DP- P-- / ++M GRS

RG- MG- / RS- S-- / ++R MPN

**Interlude** / ++R MPN / D-- -NR

S-- N-- / D-- P-- / MGR GRN / S++

**Verse**

++N -NN / S-- SS- / ++P NSG / RR- SS-

++G -RS / R-- NN- / SG- R-- / S-R GMP

D-D -PM / PP- DD- / --M -RR / NN- NN-

--P +NN / R-- GG- / RS- S-- / --S RGM / P+

Bit

# පාසල් ගීතය ගැයීම /වැයීම

නිපුණතාව 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කරගැනීමට හුරු වෙයි.

නිපුණතා මට්ටම 3.1 : ගීත රසාස්වාදයේ යෙදෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- පාසල් ගීතය ගායනය /වාදනය වන විට සීරුවෙන් සිට ගායනය කරයි.
- තම පාසල් මාතාවට ගෞරවය දක්වයි.
- පාසලේ අනන්‍යතාව පාසල් ගීතයෙන් පිළිබිඹු වන බව අවබෝධ කර ගනියි.
- පාසලේ ඓතිහාසික තොරතුරු සොයා බැලීමට පෙළඹෙයි.

ගුණාත්මක යෙදවුම් :
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්, ගීයේ ගීත ස්වර ප්‍රස්තාරය ලියන ලද දෘශ්‍යාධාරයක්
- පාසලේ ඉහළ ශ්‍රේණියක සිසුවෙක් හෝ සිසුවියක් (පාසල් ගීය ගායනය කර පෙන්වීම සඳහා)
- පාසල් ගීතයේ පද ඇතුළත් කියවීමේ පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

6 වැනි ශ්‍රේණියේ පෙරදිග සංගීතය හැදෑරීමට පැමිණෙන දරුවන්ට පාසල් ගීතය ආගන්තුක ගීයක් නොවේ. පාසලේ විවිධ උත්සව සඳහා සහභාගි වීමේ දී පාසල් ගීය ගායනය/වාදනය වෙයි. එහෙත් මෙහි දී පාසලේ සංගීත විෂය භාර ගුරුභවතා ලෙසින් ගී තනුව ඉතා නිවැරදි ව ගැයීමට, වැයීමට මගපෙන්වීම හා පුහුණුව ලබා දිය යුතු ය. පාසලේ සියලු ම ළමුන්ට පාසල් ගීය ඉගැන්වීම ද ඔබේ වගකීම වේ. මෙහි දී ගීතයේ ප්‍රකාශනය පිළිබඳ සාහිත්‍යමය හා සංගීතමය විස්තරයක් තුළින් දරුවාට පෙරට වඩා මෙම ගීය පිළිබඳ හැඟීමක් හා අභිමානයක් ඇති කිරීම ඉතා වැදගත් ය.

පාඩම සංවර්ධනය :

පියවර 01
- පාසලේ ඉහළ ශ්‍රේණියේ සිසුවකු හෝ සිසුවියක ලවා පාසල් ගීය ගායනය කර පෙන්වන්න.
- ඉදිරිපත් කිරීම අගයන්න.
- 6 ශ්‍රේණියේ ළමුන්ට ඒ ගායනය පිළිබඳ ව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

(මි. 15)

පියවර 02
- පාසල් ගීයේ පද හා සංගීතය පිළිබඳ ව ළමුන් දැනුවත් කිරීමට ඔබ විසින් සකසා ගත් කියවීම් පත්‍රිකාව සපයා සිසුන්ට අධ්‍යයනයට ඉඩ සලසන්න.
- ගුරුවරයා වාද්‍ය භාණ්ඩයක් වයමින් පාසල් ගීතය අභිමානයෙන් යුතුව ගායනය කර පෙන්වන්න.

(මි.25)

පියවර 03

- කියවීම් පත්‍රිකාවේ තොරතුරු ළමුන් ග්‍රහණය කර ඇත්දැයි යන්න විමසීමට සාකච්ඡාවක යෙදෙන්න.
- ගීතය සිසුන් සමග එක් ව ගයන්න.
- පද උච්චාරණය, නිවැරදි ශ්‍රැතිය පවත්වාගැනීම ගැන විමසිලිමත් වන්න.
- ගායනය යම් ප්‍රමාණයකට ස්ථාවර වූ පසු ස්වර ප්‍රස්තාරය ගැයීමට සලස්වන්න.

(මි. 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ඒකල ව හෝ කණ්ඩායම් වශයෙන් ගායනයට යොමු කර නිවැරදිතාව අගයන්න.
- ඉතා නිවැරදි ව හා හැඟීමෙන් යුතු ඉරියව්වෙන් ගායනය කරන සිසු/සිසුවියන් ඉදිරියට ගෙන ගායනයට සලස්වා ආදර්ශ සපයන්න.

(මි. 10)

පසු අභ්‍යාස :

- පාසල් ගීතයේ ස්වර ප්‍රස්තාරය සපයන්න.
- වාදනයට යොමු කරන්න.

අතිරේක උදව් :

- ඔබ පාසලේ ඓතිහාසික තොරතුරු විදුහල්පති /පතිනිය මගින් හෝ ජ්‍යෙෂ්ඨ ගුරු භවතකු මගින් හෝ නිවැරදි ව ගොනු කර කියවීම් පත්‍රිකාවක් සකස් කර ගන්න.

# ජාතික ගීතය ගැයීම /වැයීම

නිපුණතාව 3.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කරගැනීමට හුරු වෙයි.

නිපුණතා මට්ටම 3.1 : ගීත රසාස්වාදයේ යෙදෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් පල :
- ජාතික ගීය ගැයෙන, ඇසෙන ස්ථානයක භාවිත කළ යුතු ඉරියව් අනුගමනය කරයි.
- තමා උපන් දේශයට ගෞරවය, ප්‍රණාමය දක්වයි.
- රටක, ජාතියක අනන්‍යතාව ජාතික ගීය තුළින් පිළිබිඹු වන බව අවබෝධ කර ගනියි.

ගුණාත්මක යෙදවුම් :
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්, ජාතික ගීයේ ගීත ස්වර ලියන ලද ප්‍රස්තාරය ඇතුළත් දෘශ්‍යාධාරයක්
- ජාතික ගීතයේ පද ඇතුළත් කියවීමේ පත්‍රිකාව

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

6 වැනි ශ්‍රේණියේ පෙරදිග සංගීතය හැදෑරීමට පැමිණෙන දරුවන්ට පාසල් ගීතය මෙන් ම ජාතික ගීය ද හොඳින් හුරු පුරුදු ය. විවිධ ජාතික උත්සව සඳහා සහභාගි වීමේ දී, ඔවුන් ජාතික ගීය ගයා ඇති මුත් එහි ශ්‍රැතිය, නාදස්ථාන, උච්චාරණය ආදියෙහි බොහෝ විට අඩුපාඩු ඇත. ඔබේ වගකීම වන්නේ ජාතික අභිමානය කුළු ගැන්වෙන පරිදි ජාතික ගීය ගායනය/වාදනය කිරීමට ඉගැන්වීම ය. 6 ශ්‍රේණියේ සිසු/සිසුවියන් විධිමත් සංගීත අධ්‍යාපනයේ දොරකඩ සිටිනා බැවින් නාදමාලාවේ වඩා සුවිශේෂ ස්ථාන අවධාරණය කොට පදමාලාව ද අර්ථවත් වන පරිදි ගායනය, වාදනය කර පෙන්වන්න. පදමාලාව නිවැරදි ව ශ්‍රැතියට ගැයූ පසු අදාළ ස්වර ගායනය කරවන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- ජාතික ගීය සම්පූර්ණ කට පාඩමින් ගායනය කිරීමට දන්නා සිසු/සිසුවියකට එය ගායනය කිරීමට ඉඩ දෙන්න.
- ඉදිරිපත් කිරීම අගයන්න.

(මි. 05)

පියවර 02
- ජාතික ගීය පද, සංගීතය ආදි තොරතුරු පිළිබඳ ව දැනුවත් කිරීමට ඔබ විසින් සකසා ගත් කියවීම් පත්‍රිකාව සිසුනට ලබා දී, එය අධ්‍යයනයට ඉඩ සලසන්න.
- ගුරුවරයා වාද්‍ය භාණ්ඩය සමග ජාතික ගීය අභිමානවත් ව, හැඟීම්බර ව ගායනය කර පෙන්වන්න.

(මි. 15)

පියවර 03
- කියවීම් පත්‍රිකාව ආශ්‍රයෙන් ජාතික ගීයේ නිර්මාණාත්මක අගය ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
- ජාතික ගීය සිසුන් සමග එක් ව ගයන්න.
- පද උච්චාරණය, නිවැරදි ශ්‍රැතිය පවත්වා ගැනීම පිළිබඳ ව විමසිලිමත් වන්න.
- ගායනය යම් ප්‍රමාණයකට ස්ථාවර වූ පසු ස්වර ප්‍රස්තාරය ගායනය කරවන්න. (මි. 10)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ඒකල ව හෝ කණ්ඩායම් වශයෙන් ගායනයට යොමුකර නිවැරදිතාව අගයන්න.
- ඉතා මිහිරි ව ගායනය කරන සිසු/සිසුවියන් ඉදිරියට ගෙන ගායනයට සලස්වා එය අගය කරන්න.

**(මි.10)**

පසු අභ්‍යාස :

- ජාතික ගීයේ ස්වර ප්‍රස්තාරය සපයන්න.
- වාදනයට යොමු කරන්න.

අතිරේක උදව් : ශ්‍රී ලංකා ජාතික ගීයේ නිවැරදි පද හා ස්වර ප්‍රස්තාරය ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාවේ ඇත.

ඇමුණුම 1

- ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාණාත්මක අගය පිළිබඳ ව සිසුන් සමග කෙටි සාකච්ඡාවක් කිරීම ඉතා වැදගත් වෙයි. එහි දී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් කියවීම් පත්‍රිකාවක් සකසා ගන්න.

1. ජාතික ගීයේ නිර්මාතෘ ආනන්ද සමරකෝන් මහතා බව
2. ඉන්දියානු ජාතික ගීයට සමාන බවක් ඇති වීමට හේතු
3. ජාතික ගීයේ කොටස් දෙකක් ඇති බව
4. පද මාලාවෙන් ප්‍රකාශිත අදහස
5. ජාතික ගීය ගායනයේ දී හෝ වාදනයේ දී අනුගමනය කළ යුතු පිළිවෙළ
6. සම්පූර්ණ ජාතික ගීතය ගායනය/වාදනය කරන අවස්ථා

# නූර්ති ගීත ගායනය කරමු

නිපුණතාව 6.0 : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 6.2 : නූර්ති ගීත ගායනය සමග රංගනය කරයි.

කාලච්ඡේද : 03

ඉගෙනුම් පල :
- නූර්ති ගීත ප්‍රචලිත වූ කාල වකවානුව දැනගනියි.
- අද්‍යතන යුගයේ ජනප්‍රිය නූර්ති ගීත නම් කරයි.
- නූර්ති ගීත ගායනයට කැමැත්ත පළකරයි.
- නූර්ති ගීත ඇතුළත් නාට්‍යවල නම් ලියයි.
- නූර්ති ගීත මිහිරි ව ගායනය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- එක් එක් නූර්ති ගීත ස්වර හා පද සමග වර්ණ දෙකකින් ප්‍රස්තාර කොට සකස් කරගත් දෘශ්‍ය උපකරණ 3 ක්
- ස්වර වාද්‍ය භාණ්ඩයක් (හාර්මෝනියම්)
- තාල වාද්‍ය භාණ්ඩයක්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

නූර්ති ගීත යනු පැරණි නූර්ති නාට්‍යවල එන ගීත විශේෂයකි. හින්දුස්ථානී සංගීතයේ ආභාසය ලබා පෝෂණය වී ඇති නූර්ති ගීත කර්ණ රසායන තනුවලින් නිර්මාණය වී ඇති බව සිසුන්ට පහදා දෙන්න. පහත දැක්වෙන කරුණු ඔස්සේ 6 ශ්‍රේණියට ගැළපෙන කියවීම් පත්‍රිකාවක් ගුරුවරයා විසින් සකස් කරගන්න.

- නූර්ති ගීත ප්‍රචලිත වූ කාල වකවානුව
- අද්‍යතන යුගයේ ජනප්‍රිය නූර්ති ගීත
- අද වෙස්සන්තර රාජ පුතා - (වෙස්සන්තර නූර්තිය)
- සුවඳ පද්ම ඕලු ආදි - (දුටුගැමුණු නූර්තිය)
- මෙම ගිම්හාන (විදුර)

ඉහත නූර්ති ගීත ඇතුළත් නාට්‍යවල නම් සඳහන් කරමින් කාලච්ඡේද 03 ක දී ඉහත ගීත 3 ගායන පුහුණුවට යොදාගැනීම වඩාත් ඵලදායි වේ.

පාඩම සංවර්ධනය :

පියවර 01
- ජනප්‍රිය නූර්ති ගීතයක්, ගුරුවරයා සර්පිනාව වයමින් රසවත් ව ගායනය කරන්න.
- ගීතයේ වචනවල අදහස සහ එහි පසුබිම පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මි. 10)

පියවර 02
- අදාළ ගීත 3 ලියූ දෘශ්‍යාධාර 3 වෙන් වෙන් ව ප්‍රදර්ශනය කරන්න.
- කොටසින් කොටස ගීතය ගායනයට හුරු කරවන්න.

- කණ්ඩායම් මාරු කරමින්, හා විවිධ ක්‍රමශිල්ප යොදාගනිමින් ගීත තහවුරු වන සේ  නැවත නැවත ගායනය කරවන්න.
- ඉතිරි ගීත 2ක ද මේ ආකාරයට ම පුහුණු කරවන්න.

**(මි. 90)**

පියවර 03

- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව ගීත ගායනයට අවස්ථාව ලබාදෙන්න.
- නිවැරදි ව ස්වර ස්ථාන පිළිබඳ ව අවධානය යොමු කරගත් සිසුන් අගයන්න.
- ගීත තුන අභ්‍යාස පොතේ ලියා ගැනීමට යොමු කරවන්න. වර්ණ දෙකක් භාවිත කරමින් නිවැරදි ව ලියන්න.

**(මි. 15)**

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

වඩාත් ම මිහිරි ව ගයන ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව පන්තිය ඉදිරියට කැඳවා ගීතය ගැයීමට  අවස්ථාව ලබා දී ප්‍රතිජනනාත්මක උපස්ථම්භනයක් ලබාදෙන්න.

**(මි. 05)**

පසු අභ්‍යාස : අභ්‍යාස පොතේ සටහන් කළ ගීත තුන නිදහස් කාලවල දී පුහුණු වන්න.

අතිරේක උදව් : නූර්ති ගීත ඇතුළත් ග්‍රන්ථ

## නූර්ති ගීත රංගනය සමග ගායනය කරමින්, ප්‍රාසංගික ව ඉදිරිපත් කරමු

නිපුණතාව 6.0 : රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 6.2 : නූර්ති ගීත ගායනය සමග රංගනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- නූර්ති ගීත ගායනය හා රංගනය සහිත ව ඉදිරිපත් කිරීමට කැමැත්ත පල කරයි.
- නූර්ති ගීත ගයමින්, රංගනය කරයි.
- නූර්ති ගීත එකතුවක් කිරීමට පෙළඹෙයි.

ගුණාත්මක යෙදවුම් :
- ස්වර වාද්‍ය භාණ්ඩයක්
- ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක්
- තාල වාදන භාණ්ඩයක්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

ප්‍රාසංගික ව ඉදිරිපත් කරන නූර්ති ගීත ගායන හා රංගන ප්‍රේක්ෂකයන් අමන්දානන්දයට පත් කිරීමට සමත් වී ඇත. මෙම ගීත ගායනයේ දී සර්පිනා, තබ්ලා, වයලින්, බටනලා, වැනි සංගීත භාණ්ඩ යොදා ගෙන ඇත. ගීතවල තිබූ මිහිරි බව නිසා ජනතාව ප්‍රිය කරන ගීත විශේෂයක් ලෙස නූර්ති ගීත හැඳින්විය හැකි බවත් නළු නිළියන් විසින් ම ගීත ගායනය කරමින් රංගනයේ යෙදෙන බවත්, සිසුන්ට මතක් කර දෙන්න.

පෙර ක්‍රියාකාරකමේ දී ඉගෙන ගත් පහත දැක්වෙන ගීත 3 රංගනයට යොදා ගන්න.

- අද වෙස්සන්තර රාජ පුතා
- සුවඳ පද්ම ඕලු ආදි
- මෙම ගිම්හාන

කාලච්ඡේද 02 ක දී මෙම ගීත 3 රංගනය සහිත ව ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීමට යොමු කිරීම වඩාත් ඵලදායි වේ.

පාඩම සංවර්ධනය :

පියවර 01
- පෙර පාඩමින් ඉගෙන ගත් එක් නූර්ති ගීයක් ගෙන, ගායනය හා රංගනය කර පෙන්වන්න.
- ඒ පිළිබඳ සිසු අදහස් විමසමින් කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මි. 10)

පියවර 02
- සිසු කණ්ඩායම් කර ඉගෙන ගත් ගීත නැවත ගායනය කරවන්න.
- ගීතයේ අදහසට ගැළපෙන සේ ප්‍රාසංගික ව ගායනයන් සහිත ව රංගනයේ යෙදීමට උපදෙස් දෙන්න.

- කණ්ඩායම් වශයෙන් මාරු කරමින්, එක් ගීතයක් ඉදිරිපත් කළ පසු ඉතිරි ගීත ද ඒ ආකාරයට පුහුණුවීමට මග පෙන්වන්න.

(මි. 30)

පියවර 03

- කේවල හෝ කණ්ඩායම් වශයෙන් ගීත 3 කණ්ඩායම් තුනකට ලබා දී ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
- ප්‍රාසංගික ව ඉදිරිපත් කරන විශේෂ දක්ෂතා ඇති සිසුන් පිළිබඳ ව අවධානය යොමු කරමින් අගය කරන්න.
- සංගීතය, ගායනය, රංගනය යන කොටස් තුන ම සමන්විත වන සේ කණ්ඩායම් දක්ෂතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මි.30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

වඩාත් ම දක්ෂ ලෙස ඉදිරිපත් කරන සිසුන් ඉදිරියට කැඳවා ගීත ගයමින් රංගනයට අවස්ථාව ලබාදෙන්න.

(මි. 10)

පසු අභ්‍යාස : නූර්ති ගීත එක්රැස්කර සකස් කරගත් පොත් පිංචට අදාළ ගීත රංගනය, ගායනය, සමග නිදහස් කාලවල දී පුහුණු වන්න.

අතිරේක උදව් : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ 8 ශ්‍රේණිය හා 11 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

# තාලානුකුල ස්වර අභ්‍යාස ගායනය

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග, සිද්ධාන්ත හඳුනාගනිමින් වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : ගායනයේ මූලික හැකියා වර්ධනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගෙනුම් පල :
- ස්වර අභ්‍යාසවල ස්වභාවය පැහැදිලි කරයි.
- ස්වර අභ්‍යාස නිර්මාණය කරයි.
- ශුද්ධ ස්වර සහිත ස්වර අභ්‍යාස ගායනයේ යෙදෙයි.
- ආධුනිකයකු ස්වර අභ්‍යාසයේ යෙදීමේ වැදගත්කම පිළිගනියි.

ගුණාත්මක යෙදවුම් :
- අවසානයේ දක්වා ඇති ලෙස කොටු කඩදාසියක් භාවිත කර සැකසූ ස්වර අභ්‍යාස සටහන් කළ දෘශ්‍ය උපකරණයක්.
- නිදසුන ලෙස දක්වා ඇති පරිදි ගුරුවරයා විසින් ගොඩනැගූ තාලානුකුල ස්වර අභ්‍යාස සටහන් කළ දෘශ්‍ය උපකරණ.
- සර්පිනාව වයලීනය/එස්රාජය.

පාඩම සැලසුම සඳහා උපදෙස් :

සංගීතය විෂය හදාරන දරුවන් ස්වර අභ්‍යාසයේ යෙදීම මුල සිට ම කළ යුතු කාර්යයකි. බොහෝ විට 6 ශ්‍රේණියේ දරුවන් ස්වරවල ස්ථානීය අගය පිළිබඳ හඳුනාගන්නේ මෙතැන් පටන් ය. මේ පිළිබඳ ව ගුරුවරයාගේ අවධානය යොමු කළ යුතු වේ. ස්වර ඉහළ පහළ වීම ශ්‍රවණය මගින් එකවර හඳුනාගත නොහැකි සිසුන් සඳහා දෘශ්‍යමය උපකරණ අභ්‍යාසයන්හි යෙදවීම වැදගත් ය. එමගින් ස්වර ඉහළ පහළ බව හඳුනාගනු ඇත. මේ සඳහා මෙම සැලසුම අවසානයේ දක්වා ඇති පරිදි කොටු රූල් කඩදාසියක ස්වර අභ්‍යාස කිහිපයක් සිසුන් ලවා නිර්මාණය කරවීමට පියවර ගන්න. මේ සඳහා 2008 - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 31-32 වන පිටුවල ඇති කාර්ය පත්‍රිකා ද භාවිතයට ගත හැකි ය. '

ස්වර අභ්‍යාසයේ යෙදවීම සඳහා ගීතයක් මෙන් රසවත් වන ලෙස තාලානුකුල ව ඔබ විසින් නිර්මාණය කරගත් ස්වර අභ්‍යාස රටා නැවත නැවත යොදා ගත යුතු වේ. මේ සඳහා නිදසුනක් පහත දැක්වේ.

/ස - ස රි / ග - - -/ ම - ම ග / රි - - - /
/රි - රි ග/ ම - - -/ ප - ප ම / ග - - - /
/ග ම ග ම / ප - ප - / ම ප ම ප / ධී - ධ - /
/ප ධ ප ධ / නි - නි ධ / ප - ධ නි / ස - - - /

ඉහත ස්වර රටාව ස්වර අභ්‍යාසයක ගති ලක්ෂණ රැඳෙන සේ තව දුරටත් පාද කිහිපයක් ඔබට ම නිර්මාණය කර ගත හැකි ය. මෙවැනි ක්‍රියාකාරකම් මගින් ස්වරවල ස්ථානීය අගය තහවුරු වූ පසු සම්ප්‍රදායික ව භාවිත කරන ස්වර අභ්‍යාස ද පුහුණුව සඳහා යොදාගන්න. විවිධත්වය ඇති කිරීමට හාර්මනී සිද්ධාන්තය ද යොදා ගත හැකි ය. නිදසුනක් ලෙස එක් කණ්ඩායමක් '' සරිග- / රිගම- / ගමප- / යනුවෙන් ස්වර අභ්‍යාසය ගායනය කරන විට 2

වැනි කණ්ඩායම විභාග දෙකකට පසු ව එම ස්වර අභ්‍යාසය ම ගායනය ආරම්භ කිරීමට යෙදිය හැකි ය. මෙහි දී ගමප-/ යන ඛණ්ඩයත්, සරිග-/ යන ඛණ්ඩයත් එකවර ගැයේ. මේ අයුරින් සෑම ඛණ්ඩයක් ම '' හාර්මනී '' වේ. ස්වරස්ථාන පිළිබඳ ප්‍රවේශම් විය යුතු අතර අඩු ලයක් යොදා ගැනීම ඵලදායී වේ. මෙයින් අභ්‍යාසයේ ඒකාකාරී බව ඇති වීම, එක ම ආකාරයේ ගායන මගින් අලසකම ඇති වීම වළක්වාලිය හැකි ය.

පාඩම සංවර්ධනය :

පියවර 01 ඔබට හැකි උපරිම ලයකින් තානාලංකාරයක් ස්වර මගින් ඉදිරිපත් කරන්න. එසේ වේගවත් ව ස්වර ගායනය හෝ වාදනය කිරීමට ස්වර අභ්‍යාසයේ යෙදීමේ වැදගත්කම පැහැදිලි කරන්න. ස්වර අභ්‍යාසවල දී ස්වර රටාවක් පවතින බව පැහැදිලි කරන්න.

(මි. 10)

පියවර 02 මෙහි අවසානයේ දක්වා ඇති පරිදි කොටු තුළ ගොඩනැගූ ස්වර අභ්‍යාස ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. එහි පළමු ස්වර ඛණ්ඩයේ ස්වර රටාව හඳුනාගැනීමට සිසුන් යොමු කරන්න. කොටු රූල් කඩදාසියක දෘශ්‍ය උපකරණයේ දැක්වෙන අභ්‍යාස සම්පූර්ණ කිරීමට මග පෙන්වන්න. එකිනෙක ස්වර ඉහළ පහළ වන අයුරු සිසුන් ලවා නිරීක්ෂණය කරවන්න. සිසුන්ට තනි තනි ව ස්වර අභ්‍යාසයක් ආරෝහණ අවරෝහණ වශයෙන් මුල සිට ම ගොඩනැගීමට යොමු කරන්න.

(මි. 30)

ඔබ විසින් නිර්මාණය කළ තාලානුකූල ස්වර අභ්‍යාසය ප්‍රදර්ශනය කරන්න. එය ගයා වයා පෙන්වන්න. සිසුන් අභ්‍යාසයේ යොදවන්න. කොටු රූල් කඩදාසිවල ගොඩනගා ඇති ස්වර අභ්‍යාස තාලානුකූල ව ගයා වයා පෙන්වන්න. සිසුන් අභ්‍යාසයේ යොදවන්න.

(මි. 40)

පියවර 03 කණ්ඩායම් වශයෙන් අභ්‍යාසයේ යෙදුණු ස්වර අභ්‍යාස ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. ගුරුවරයාගේ සර්පිනා වාදනයේ සහාය එක් කරන්න. උච්ච ස්වර ගායනයේ තත්ත්වය විමසන්න. ස්වරවල ස්ථානීය අගය පිළිබඳ අවධානය යොමු කරමින් නැවත නැවත අභ්‍යාසයේ යොදවන්න.

(මි. 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කැමති සිසුවකුට කැමති ස්වර අභ්‍යාසයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී අගයන්න.
- තෝරාගත් ස්වර අභ්‍යාසයක පළමු ස්වර ඛණ්ඩය ගුරුවරයා ද දෙවැනි ස්වර ඛණ්ඩය සිසුන් ද ආදී වශයෙන් ස්වර අභ්‍යාස ගායනය කරමින් එම ස්වර අභ්‍යාසය සම්පූර්ණ කිරීමේ ක්‍රමවේදය අගයන්න.

***ගුරුවරයාඃ-*** සරිග- ***සිසුන්ඃ-*** රිගම- ***ගුරුවයාඃ-*** ගමප- ***සිසුන්ඃ-*** මපධ- ආදී වශයෙන්


(මි. 10)


පසුවැඩ : ස-, සරිස-, සරිගරිස-, ............ යන ස්වර අභ්‍යාසය කොටු රූල් කඩදාසියක ආරෝහණ අවරෝහණ වශයෙන් ගොඩ නගා ගායන /වාදන අභ්‍යාසයේ යෙදෙන්න.

අතිරේක උදව් : " අභිනව ස්වර අභ්‍යාස මාලිකා - ග්‍රන්ථය - ශාස්ත්‍රපති සුදත් සමරසිංහ. "

**දෘශ්‍ය උපකරණ සඳහා මග පෙන්වීමක්**

•



## මෙලෝඩිකා, ග්ලොකන් ස්පීල්, විද්‍යුත් ස්වර පුවරුව , මවුත් ඕගන් (හාර්මෝනියම්) රෙකෝඩර් ෆ්ලුට් හාර්මෝනියම් වැනි භාණ්ඩ අතරින් එකක් සරල ව වාදන හුරුව සහ සාමූහික ක්‍රියාකාරකම්

නිපුණතාව 2.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහාගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සරල සංගීත භාණ්ඩ මගින් ක්‍රීඩාමය අත්දැකීම් ලබයි. වාදන කුසලතා වර්ධනය කර ගනී.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගෙනුම් පල :
- පහසුවෙන් පරිහරණය කළ හැකි සංගීත භාණ්ඩ හඳුනාගනී.
- එම භාණ්ඩයන්හි ස්වර පිහිටන ආකාරය වටහාගනියි.
- එම භාණ්ඩයන්හි ස්වර සප්තක හා සරල ව වැයීමට හැකියාව ලබාගනී.
- මෙම භාණ්ඩ වාදනයේ ඇති පහසුතා වටහාගනී.
- මෙම භාණ්ඩ වාදනය තුළින් සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ ඇල්මක් ඇති කරගනී.
- ක්‍රීඩාමය අත්දැකීමක් ලෙසින් භාණ්ඩ වාදනයේ හුරුව ලබයි.

ගුණාත්මක යෙදවුම් :
- මවුත්ඕගන්, රෙකොඩර්, ෆ්ලුට්, ග්ලොකන් ස්පීල්, ළමා විදුලි ඕගන් අතරින් කිහිපයක්.
- එම වාද්‍ය භාණ්ඩයකින් වැයෙන සංගීත ඛණ්ඩයක් අඩංගු සීඩී තැටියක් හෝ කැසට් පටයක් හා යන්ත්‍රයක් මෙම සංගීත භාණ්ඩයන්හි ස්වර පිහිටීම දැක් වූ දෘශ්‍ය උපකරණයක්.
- වාදන ඉරියව් දක්වා සකසා ගත් දෘශ්‍ය උපකරණ.
- සරල තාල වාද්‍ය භාණ්ඩයක්.

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

සංගීත භාණ්ඩ අතුරින් නිශ්චිත ව ස්වර පිහිටා ඇති භාණ්ඩ මෙහි දී සරල සංගීත භාණ්ඩ යනුවෙන් අර්ථ දක්වා ඇත. මෙසේ හඳුනාගත් භාණ්ඩ විශාල ප්‍රමාණයක් දැක්විය හැකි ය. අඩු මුදලකින් සපයා ගත හැකි වීම හා සරල ව පහසුවෙන් වාදනය කළ හැකි වීම මෙම භාණ්ඩවල විශේෂත්වය යි. සංගීත විෂය ධාරාව මුලින් ම හඳුනාගන්නා 6 ශ්‍රේණියේ දී සිසුන්ට මෙම භාණ්ඩ ඇසුරු කිරීමට හුරු කිරීමෙන් විෂය කෙරෙහි ආශාවක්, ඇල්මක් ඇති කිරීම මෙහි අරමුණ යි. මෙහි දී ස්වර සප්තකය හඳුනාගැනීම, වාදනය කිරීමට පුහුණු වීම, ක්‍රීඩාමය අත්දැකීමක් ලෙස ලබා දීම තුළින් දරුවාට එම භාණ්ඩය සමීප කිරීමට හැකි වනු ඇත. මෙම ක්‍රියාකාරකම සඳහා කාලඡේද 5 ක් වෙන් කර ඇති බැවින් ක්‍රියාකාරකම් 5 ක් සිදු කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත. එමෙන් ම සංගීත භාණ්ඩ වෙන වෙන ම කණ්ඩායම් කර ගත යුතු ය.

මෙම සංගීත භාණ්ඩ වර්ග බොහොමයක් වෙළඳ පොළේ ඉතා අඩු මිලකට ලබා ගත හැකි ය. මවුත් ඕගන, රෙකොඩර්, ෆ්ලුට්, වැනි භාණ්ඩවල් මිල ඉතාමත් අඩු ය. මීට අමතර ව පාසලේ තූර්ය වාදක කණ්ඩායමේ ඇති මෙලෝඩිකා වැනි භාණ්ඩ ද මේ සඳහා යොදාගැනීම ඵලදායි වේ. මෙම ක්‍රියාකාරකම ආරම්භ කිරීමට සතියකට දෙකකට පෙර මෙම භාණ්ඩ සපයා ගැනීමට සිසුන්ට උපදෙස් ලබා දීම සුදුසු ය.

පාඩම සංවර්ධනය :

පියවර 01
- සරල ස්වර වාද්‍ය භාණ්ඩයකින් වැයෙන සංගීත ඛණ්ඩයක් කැසට් පටයක් හෝ සී ඩී තැටියක් මගින් සිසුන්ගේ ශ්‍රවණයට සලස්වන්න.
- ඒ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ගුරුවරයා විසින් සරල සංගීත භාණ්ඩයකින් සරල ස්වර ඛණ්ඩයක් වාදනය කරන්න. නිල් අහස් තලේ ය ඔඅසබනකැ ඔඅසබනකැ*
- මෙම භාණ්ඩ වාදනය කිරීම පහසු බව සිසුන් සමග සාකච්ඡා කරන්න. (මි.30)

පියවර 02
- එක් එක් සංගීත භාණ්ඩයන්හි ස්වර පිහිටීම හා ව්‍යුහය පිළිබඳ ව සකසා ගත් දෘශ්‍ය උපකරණ ප්‍රදර්ශනය කරන්න.
- එක් එක් භාණ්ඩයන්හි ස්වර පිහිටීම පිළිබඳ ව සිසුන් දැනුවත් කරමින් ඔවුන් සමග සාකච්ඡා කරන්න.
- සංගීත භාණ්ඩ වර්ගය අනුව සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න. (ˀලර්ලකලෘ වශයෙන්)
- සංගීත භාණ්ඩවලට අදාළ දෘශ්‍ය උපකරණ (ස්වර පිහිටීම) එම කණ්ඩායම් වෙත ලබා දී ඒ පිළිබඳ අධ්‍යයනය සඳහා ඔවුන් පොළඹවන්න.
- ගුරුවරයා එක් එක් කණ්ඩායම් වෙත ගොස් ඔවුන්ට උදව් ලබා දෙන්න. (මි. 40)

පියවර 03
- එක් කාල ඡේදයකට එක ඇමුණුම බැගින් ලබා දී සිසුන් කණ්ඩායම් වශයෙන් වාදනය කරවන්න.
- ගුරුවරයා සරල තාල අවනද්ධ භාණ්ඩයක් වයමින් සිසුන් (ඇමුණුම්1,2,3,4) වාදනයෙහි පොළඹවන්න. නැවත නැවත අභ්‍යාස කරන්න.
- එක් එක් කණ්ඩායම් සම්පූර්ණ ස්වර ප්‍රස්තාර වාදනය කිරීමට පොළඹවන්න. (මි.40)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

වඩාත් හොඳ වාදක කණ්ඩායම හෝ සිසුන් තෝරා ඉදිරියට කැඳවා වාදනය කිරීමට සලස්වා ඔවුන් අගයන්න. (මි.10)

පසු අභ්‍යාස : සරල ස්වර ප්‍රස්තාර වාදනය සඳහා සිසුන් උනන්දු කරවන්න. ස්වර 5 ස්ථාපන ගී, සරල ළමා ගී ආදියෙහි ප්‍රස්තාර සොයා ගැනීමෙහි සිසුන් පොළඹවන්න. විවේකය සංගීත භාණ්ඩය සමග ගත කිරීමට ඔවුන් යොමු කරන්න.

අතිරේක උදව් : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශවල සටහන් කර ඇති ස්වර ස්ථාපන ගීත, ළමා ගීත ආදිය ප්‍රස්තාර භාවිත කරන්න.

ˀ කණ්ඩායම - ඊරපදඛසජ (මවුත් ඕගන්)
ඊ කණ්ඩායම - ග්ලොකන් ස්පිල් - ධරට්බ ඃඉකක එඳබ්‍ැකැජඵ කරන්න.)
ක කණ්ඩායම - එැකදාසජ ඊරපදඛසමප
ෘ කණ්ඩායම - ඍැජදරාැර කෙමඑැ

ඇමුණුම 1

Þ කණ්ඩායම

ස - - / ග - - / ප - - / ග - - වාර 4 ක්

ර් කණ්ඩායම

ග - - / ප - - / ග - - / ස - -

ක කණ්ඩායම

¸ ග ග / ¸ ග ග / ¸ ග ග / ¸ ග ග

a කණ්ඩායම

¸ ස ස/ ¸ ස ස/ ¸ ස ස / ¸ ස ස

ɀ කණ්ඩායම

¸ ප ප / ¸ ප ප / ¸ ප ප / ¸ ප ප

ඇමුණුම 2

Þ ග - ම / ප - - / ග - රි / ස - - /

ක රි - ග / ම - - / ප - ම / ග - - /

ɀ ස ස ස / ස - - / ස ස ස / ස - - /

Þ ප ප ම / ප ප ම / ග ග රි / ග ග රි /

ක රි ග ම / රි ග ම / ග රි ස / ග රි ස /

ɀ ග ග ග / ග - - / ස ස ස/ ස - - /

ඇමුණුම 3

Þ ස - රි - / ග - ම - / ප ප ප ප / ප - - - /

ක ප - ම - / ග - රි - / ස ස ස ස / ස - - - /

ɀ ස ස ස ස / ස - - - / ස ස ස ස / ස - - - /

Þ ස රි ස රි / ස රි රි රි/ රි ග රි ග / රි ග රි ග /

ක ග ම ග ම / ග ම ග ම / ම ප ම ප / ම ප ම ප /

ɀ ප - ම - / ග - රි - / ස ස ස ස / ස - - - /

ඇමුණුම 4

ස - ස - / ප - ප - / ධ - ධ - / ප - - - /

ම - ම - / ග - ග - / රි - රි - / ස - - - /

ප - ප - / ම - ම - / ග - ග - / රි - - - /

ප - ප - / ම - ම - / ග - ග - / රි - - - /

ස - ස - / ප - ප - / ධ - ධ - / ප - - - /

ම - ම - / ග - ග - / රි - රි - / ස - - - /

# තෝරාගත් සම්භාව්‍ය වාi භාණ්ඩ වාදන ඉරියව්

නිපුණතාව 2.0 : වාදන භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.2 : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- එක් එක් සංගීත භාණ්ඩවල වාදන ඉරියව් පිළිබඳ විස්තර කරයි.
- නිවැරදි ඉරියව් භාවිතය සංගීත භාණ්ඩවල වාදන කුසලතාව ඇති කිරීමට බලපාන බව ප්‍රකාශ කරයි.
- විවිධ සංගීත භාණ්ඩ නිවැරදි ඉරියව් අනුව පරිහරණය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- නිර්දේශිත සංගීත භාණ්ඩවල වාදන ඉරියව් දැක්වෙන පින්තූර සටහන් වාදනය සඳහා නියමිත සපයාගත් සංගීත භාණ්ඩ
- වාදන ඉරියව් දැක්වෙන වීඩියෝ දර්ශන

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

සංගීත භාණ්ඩවල හැඩය, ප්‍රමාණය හා බර වාදන ඉරියව් හා සම්බන්ධ ය. එබැවින් සංගීත භාණ්ඩ වාදනය කිරීමේ දී ඒ සඳහා වන නිවැරදි ඉරියව් භාවිතය ඉතා වැදගත් ය. භාණ්ඩය රඳවා ගන්නා අයුරු, දෑත භාවිතය ආදියත් ඉඳගෙන හෝ හිටගෙන යනාදී ඉරියව් ද මෙහි දී වැදගත් ව ඇත. එක් එක් භාණ්ඩය සඳහා නිවැරදි ඉරියව් භාවිතයෙන් එම භාණ්ඩය නිවැරදි ව ප්‍රගුණ කළ හැකි ය. මේ සම්බන්ධ නිවැරදි අවබෝධයක් ලබා දීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

පාඩම සංවර්ධනය :

පියවර 01
- වාදන ඉරියව් දැක්වෙන රූප සටහන පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- නැතහොත් වාදන ඉරියව් දැක්වෙන වීඩියෝ දර්ශන නැරඹීමට අවස්ථාව දෙන්න.
- සංගීත භාණ්ඩවල වෙනස්කම් හා ප්‍රමාණය පිළිබඳ සිසුන්ට වටහා දෙන්න.

(මි. 10)

පියවර 02
- සපයා ගත් සංගීත භාණ්ඩ සිසුන්ට පරිහරණය කිරීමට අවස්ථාව දෙන්න.
- විවිධ භාණ්ඩවල ඉරියව් පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- භාණ්ඩයෙන් භාණ්ඩයට ඉරියව් වෙනස් බව සිසුන්ට පැහැදිළි කරන්න.
- එක ම භාණ්ඩය සඳහා වාදන ඉරියව් කිහිපයක් ඇති බව වටහා දෙන්න.
  (උදාඃ වයලීනය)
- නියමිත ඉරියව්වෙන් හිඳ වාදනය කිරීමේ දී ඇති පහසුවත් වැරදි ඉරියව්වේ සිට වාදනය කිරීමේ දී ඇති වන අපහසුතාවයක් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- වැරදි වාදන ඉරියව් අනුගමනය කිරීමෙන් වාදන දෝෂ ඇති වන බව වටහා දෙන්න.

(මි. 30)

පියවර 03

- එක් එක් භාණ්ඩයේ වාදන ඉරියව් අනුව භාණ්ඩ හැසිර වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- වැරදි ඉරියව් අනුව භාණ්ඩය හසුරුවන අය හඳුනාගෙන නිවැරදි කරන්න. (මි. 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නිවැරදි ඉරියව් අනුව භාණ්ඩය හසුරුවන ලබන සිසුන් හඳුනාගෙන අගයන්න.
- නිවැරදි හස්ත සාධන ක්‍රම භාවිත නොකරන අය හඳුනා ගන්න. ඔවුන් නිවැරදි කරන්න. (මි. 10)

පසු වැඩ :

- තමන් සතු සංගීත භාණ්ඩවල ඉහත ආකාරයෙන් පුහුණු වීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් :

- අන්තර්ජාලය හරහා සම්භාව්‍ය සංගීත වැඩසටහන් නැරඹීම.
- පොත් පත්, පුවත්පත්, සඟරා ආදියෙහි එන වාදන ඉරියව් සඳහන් ව ඇති ලිපි
- රූපවාහිනී සංගීත වැඩසටහන්

## ස්වර ස්ථාන නිවැරදි ව වාදනය සඳහා සංගීත භාණ්ඩවල මූලික අභ්‍යාස

නිපුණතාව 2.0 : වාදන භාණ්ඩයන්හි ස්වරූපය වටහාගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2. : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- වයලින්, එස්රාජ්, දිල්රුබා යන සංගීත භාණ්ඩවල බෝව හසුරුවන ආකාරය පෙන්වයි.
- සිතාර්, ගිටාර්, මැණ්ඩලීන් යන සංගීත භාණ්ඩවල මිස්රාබ් එක, පික් එක හසුරුවන ආකාරය පෙන්වයි.
- බටනලාවේ නාදය උපදවන අයුරු පිඹීමේ අභ්‍යාස මගින් දක්වයි.
- තබ්ලාවේ බායාවේ හා දායාවේ මූලික අක්ෂර උපදවයි.

ගුණාත්මක යෙදවුම් :
- නිර්දේශිත සංගීත භාණ්ඩ
- සංගීත භාණ්ඩ වාදනය කිරීම දැක්වෙන පින්තූර සටහන හෝ වීඩියෝ දර්ශන

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

වාදන ඉරියව්වලින් අනතුරු ව එක් එක් සංගීත භාණ්ඩය හැසිරවීම පිළිබඳ මූලික අභ්‍යාස ඉදිරිපත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. විවිධ සංගීත භාණ්ඩවල ස්වර වාදනය ආරම්භ කිරීමට පෙර සැලකිලිමත් විය යුතු කරුණු කීපයකි. එහි හඬ නිපදවන ආකාරය බෝ එකක් භාවිත කරන භාණ්ඩයක් නම් බෝ එක හැසිරවීම, සුෂිර භාණ්ඩයක් නම් පිඹීමේ අභ්‍යාස, තත පෙලීමෙන් නාදය උපදින භාණ්ඩයක් නම් ඒ සඳහා වූ අභ්‍යාසය පුහුණු කළ යුතු ය. මේ සඳහා වෙන් වෙන් ව එක් එක් භාණ්ඩය සඳහා වූ ක්‍රම ශිල්ප වෙනස් වේ.

ස්වර පුවරු භාණ්ඩයක් නම් ස ස්වරය එක එල්ලේ වාදනය කළ හැක. නමුත් බටනලාව වැනි සුෂිර භාණ්ඩයක එය එසේ නොවේ.

පාඩම සංවර්ධනය :

පියවර 01
- ගුරුවරයා ප්‍රවීණත්වය දක්වන භාණ්ඩයකින් අභිමත ස්වර කොටසක් වයා පෙන්වන්න.
- හැකි නම් එක් එක් භාණ්ඩයේ නාදය උපදවන අයුරු වාදනය කර පෙන්වන්න.
- වාදන ඇතුළත් වීඩියෝ දර්ශනයක් සපයාගත හැකි නම් එය පෙන්වන්න. (මි.10)

පියවර 02
- වයලීනය සඳහා ඇමුණුම් අංක 1 හි දැක්වෙන හස්ත සාධන අභ්‍යාස කිහිපයක් සිසුන්ට ලබා දී අභ්‍යාසවල යොදවන්න.
- එස්රාජ්, දිල්රුබා සඳහා ඇමුණුම් අංක 2 හි අභ්‍යාස යොදාගන්න.
- ගිටාරය, මැන්ඩලීනය සඳහා ඇමුණුම අංක 03 අභ්‍යාසවල යොදවන්න.
- සිතාරය සඳහා 2008 7 ශ්‍රේණියේ ගුරුමාර්ගෝපදේශයේ පිටු අංක 83 හි අංක 1 හි සටහනෙහි ඇතුළත් අ්‍යාසය යොදාගෙන පුහුණු කරවන්න.

- පිඟීමේ භාණ්ඩ සඳහා සුදුසු හස්ත සාධන අභ්‍යාස සිසුන්ට ලබා දී ඒවා පුහුණු වීමට අවස්ථාව දෙන්න.
- තබ්ලාව සඳහා ඇමුණුම අංක 4 හා ඇතුළත් අභ්‍යාසවල යොදවන්න.

(මි. 30)

පියවර 03

- බෝ එක හැසිරවීම පිළිබඳ අභ්‍යාස සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සුළඟේ පාලනය මගින් සුෂිර භාණ්ඩවල හඬ උපදවන ආකාරය පිළිබඳ සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- මිස්රාබ් එකකින් හෝ පික් එකකින් වාදනය කරන භාණ්ඩ වාදනය කිරීමට අවස්ථාව දෙන්න.
- තබ්ලාවේ තිට ගෙ කත්, යන අක්ෂර තබ්ලාවෙන් වැයීමට අවස්ථාව දෙන්න.

(මි. 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

එක් එක් භාණ්ඩ වලින් නිවැරදිව අභ්‍යාස ඉදිරිපත් කළ සිසුන් ඇගයීමට ලක්කරන්න. දුබලතා ඇති සිසුන් සංවර්ධනය කරන්න.

(මි. 10)

පසුවැඩ : තමාට පහසුවෙන් සපයා ගත හැකි භාණ්ඩ නිවසේ දී පුහුණු වීමට සුදුසු අභ්‍යාස සකසා දෙන්න.

අතිරේක උදව් :

- 2008 - 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය

ඇමුණුම අංක 01

වයලීනයේ බෝ එක හැසිරවීම සඳහා අභ්‍යාස

අභ්‍යාස අංක 01

ඇ 1එ - පළමු තත

/ස- - - / ස - - - / ස - - -/ ස - - -/

ඊ 2බා - දෙවන තත

/ප- - - / ප - - - / ප - - -/ ප - - -/

ඉ 3 රා - තෙවන තත

/ස- - - / ස - - - / ස - - -/ ස - - -/

ඨ 4 එය - තෙවන තත

/ප- - - / ප - - - / ප - - -/ ප - - -/

අභ්‍යාස අංක 02

/ස- - - / ස - - - / ප - - -/ ප - - - /

/ස- - - / ස - - - / ප - - -/ ප - - - /

/ප- - - / ප - - - / ස - - -/ ස - - - /

/ප- - - / ප - - - / ස - - -/ ස - - - /

අභ්‍යාස අංක 03

/ප- - - / ස - - - / ප - - -/ ස - - - /

/ස- - - / ප - - - / ස - - -/ ප - - - /

ඇමුණුම අංක 02

එස්රාජ් දිල්රුබා

අභ්‍යාස අංක 01

/ස - - - / - - - - / - - - -/ - - - -/

/ස - - - / - - - - / - - - -/ - - - -/

/ස - - - / - - - - / - - - -/ - - - -/

/ස - - - / - - - - / - - - -/ - - - -/

අභ්‍යාස අංක 02

/ස - - - / - - - - / ස - - -/ - - - -/

/ස - - - / - - - - / ස - - -/ - - - -/

/ස - - - / - - - - / ස - - -/ - - - -/

/ස - - - / - - - - / ස - - -/ - - - -/

අභ්‍යාස අංක 03

/ස - - - /ස - - - / ස - - -/ ස - - -/

/ස - - - / - - - - / ස - - -/ ස - - -/

අභ්‍යාස අංක 04

/ස - ස - / ස - ස - / ස - ස -/ ස - ස -/

/ස - ස - / ස - ස - / ස - ස -/ ස - ස -/

ඇමුණුම අංක 03 - ගිටාරය

අභ්‍යාස අංක 01 -

ග ග ග ග / ග ග ග ග / ග ග ග ග / ග ග ග ග /

ධ ධ ධ ධ / ධ ධ ධ ධ / ධ ධ ධ ධ / ධ ධ ධ ධ /

රි රි රි රි / රි රි රි රි / රි රි රි රි / රි රි රි රි /

ප ප ප ප / ප ප ප ප / ප ප ප ප / ප ප ප ප /

නිනිනිනි / නිනිනිනි / නිනිනිනි / නිනිනිනි /

ග ග ග ග / ග ග ග ග / ග ග ග ග / ග ග ග ග /

මැන්ඩලීනය

ප ප ප ප / ප ප ප ප / ප ප ප ප / ප ප ප ප /

ස ස ස ස / ස ස ස ස / ස ස ස ස / ස ස ස ස /

ම ම ම ප / ම ම ම ම / ම ම ප ප / ම ම ප ප /

ස ස ස ස / ස ස ස ස / ස ස ස ස / ස ස ස ස /

ඇමුණුම අංක 4 - තබ්ලාව

අභ්‍යාස අංක 01

/ තිතිතිති / තිතිතිති /

/ ට ට ට ට / ට ට ට ට /

/ ති ට ති ට / ති ට ති ට /

අභ්‍යාස අංක 02

/ ගෙ ගෙ ගෙ ගෙ / ගෙ ගෙ ගෙ ගෙ /

/ න න න න / න න න න /

/ කත් කත් කත් කත් / කත් කත් කත් කත් /

# සම්භාව්‍ය සංගීත භාණ්ඩවලින් සරිගම යන ස්වර වාදනය කිරීම

නිපුණතාව 2.0 : වාදන භාණ්ඩයන්හි ස්වරූපය වටහාගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.2 : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කරගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : කාලඡේද 03

ඉගෙනුම් පල :
- තෝරාගත් සංගීත භාණ්ඩයේ සරිගම යන ස්වර පිහිටන ස්ථාන පෙන්වයි.
- සරිගම යන ස්වර 4 වාදනය කර පෙන්වයි.

ගුණාත්මක යෙදවුම් :
- පෙර පාඩම්වල දී මෙන් ම වාදන ඉරියව් දැක්වෙන පින්තූර භාවිතයට ගන්න.
- සරිගම ස්වර ඇතුළත් ස්වර ප්‍රස්තාර
- එක් එක් භාණ්ඩයේ ස්වර පිහිටීම දැක්වෙන රූප සටහන්
- නිර්දේශිත සංගීත භාණ්ඩ

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

මේ වන විට සිසුන් සංගීත භාණ්ඩ වාදනය කිරීමේ ඉරියව් පිළිබඳ හා වාදනය කිරීමට අවශ්‍ය මූලික කුසලතා පිළිබඳ ව අවබෝධයක් ලබා ගෙන ඇත. මෙම පාඩමෙන් අපේක්ෂා කරන්නේ අඩු ම වශයෙන් සරිගම යන ස්වර 4 වත් සිසුන් ලවා වාදනය කරවීම ය. ගුරුවරයාගේ නිවැරදි මග පෙන්වීම යටතේ එය එතරම් අපහසු කාර්යක් නොවනු ඇත. පාසලේ සංගීත භාණ්ඩවලට අමතර ව සිසුන්ගේ පරිහරණයට පෞද්ගලික සංගීත භාණ්ඩයක් තබාගැනීම ඔහුගේ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගැනීමට ඵලදායක වනු ඇත. එක් එක් භාණ්ඩයේ ස්වර පිහිටන ආකාරයත් එක් එක් භාණ්ඩ වාදනය කරන ආකාරය පිළිබඳවත් සරල අවබෝධයක් ගුරුවරයා සතුවිය යුතු යි. සිසුන් ළඟට ගොස් ඔවුන් මෙම අභ්‍යාසවල නිරත කිරීම ගුරුවරයා සතු කාර්යයකි.

පාඩම සංවර්ධනය :

පියවර 01
- වාදන ඉරියව් දැක්වෙන පින්තූර පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එක් එක් භාණ්ඩයේ ස්වර පිහිටීම දැක්වෙන රූප සටහන් සකසා ගෙන පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සරිගම යන ස්වර ඇතුළත් ඇමුණුම් අංක 01,02,03 හි දැක්වෙන ස්වර අභ්‍යාස ඇතුළත් පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයාට ඇති හැකියාව අනුව භාණ්ඩ කිහිපයකින් හෝ එක් භාණ්ඩයකින් සරිගම යන ස්වර වාදනය කර පෙන්වන්න.

(මි. 20)

පියවර 02
- සිසුන් නිවැරදි ඉරියව්වල ස්ථානගත කරන්න.
- භාණ්ඩවල ස්වර පිහිටීම දැක්වෙන රූප සටහන ඇසුරින් සාකච්ඡාවක් කරන්න.
- නිවැරදි ඉරියව්වල සිටිමින්, නිවැරදි ව අතැඟිලි හසුරුවමින් සරිගම යන ස්වර වාදනය කිරීමට හුරු කරවන්න.

- වයලීනය සඳහා ඇමුණුම් අංක 03 හි දැක්වෙන ස්වර අභ්‍යාස භාවිතයට ගන්න.
- බටනලාවේ සරිගම යන ස්වර එක්වර වැයීමට දුෂ්කර බැවින් ඒ සඳහා වූ සුවිශේෂ අභ්‍යාසවල නිරත කරවන්න. ඇමුණුම් අංක 02
- සිතාර්, එස්රාජ් සඳහා ඇමුණුම් අංක 01 භාවිත කරන්න.
- තාලානුකූල ව ස්වර අභ්‍යාස කරවීමට ගුරුවරයා මැදිහත් විය යුතු යි.

(මි. 40)

පියවර 03
- එක් එක් භාණ්ඩවලින් සරිගම යන ස්වර වාදනය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒ සඳහා වූ ස්වර අභ්‍යාස ද වාදනය කිරීමට අවස්ථාව දෙන්න.
- තාලානුකූල ව ස්වර අභ්‍යාස වාදනය කිරීමට අවස්ථාව දෙන්න.

(මි. 20)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

එක් එක් සිසුනට සරිගම යන ස්වර අභිමත භාණ්ඩයකින් වාදනය කිරීමට අවස්ථාව දී අගයන්න

(මි.40)

පසුවැඩ : ගුරුවරයා විසින් සරිගම යන ස්වර නිර්මාණය කරන ලද ස්වර අභ්‍යාස පුහුණු වීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් : 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ඇති ස්වර ප්‍රස්තාර භාවිතයට ගන්න.

බටනලාව සඳහා අභ්‍යාස

බටනලාවේ හඬ ඉපදවීමට හැකි වූ පසු සියලු ම සිදුරු විවෘත කර පිඹීමට උපදෙස් දෙන්න. එවිට නිකුත් වන්නේ තීව්‍ර ම ස්වරය යි. ඉන් පසු වමතේ දබරැඟිල්ලෙන් රූප සටහනේ අංක 01 දරණ සිදුර වැසීමට උපදෙස් දෙන්න. එවිට ග ස්වරය උපදී. දෙවනුව අංක 2 සිදුරත් අංක 3 සිදුරත් ආදි වශයෙන් වැසීමටත් විවෘත කිරීමටත් උපදෙස් දෙන්න. පහත සඳහන් අභ්‍යාස මේ සඳහා යොදා ගන්න.

ඇමුණුම් අංක 02

බටනලාව සඳහා අභ්‍යාසය

1. / ම - - - / ම - - - / ම - - - / ම - - - /

/ ම - - - / ම - - - / ම - - - / ම - - - /

2. / ම - - - / ග - - - / ම - - - / ග - - - /

/ ම - - - / ග - - - / ම - - - / ග - - - /

3. / ම - - - / ග - - - / රි - - - / ග - - - /

/ ග - - - / ම - - - / ග - - - / රි - - - /

/ ග - - - / රි - - - / ම - - - / ග - - - /

/ ග - - - / ම - - - / රි - - - / ග - - - /

4. / ම - - - / ග - - - / රි - - - / ස - - - /

/ ම - - - / රි - - - / ග - - - / ස - - - /

/ ම - - - / රි - - - / ග - - - / ස - - - /

/ ග - - - / රි - - - / ග - - - / ස - - - /

5. / ම - - - / ග - - - / රි - - - / ස - - - /

/ ස - - - / රි - - - / ග - - - /ම - - - /

## ඇමුණුම් අංක 01

සිතාරය/එස්රාජය/දිල්රුබා සඳහා අභ්‍යාස

1. / ස - - - / ස - - - / ස - - - / ස - - - /

   / ස - ස - / ස - ස - /ස - ස - / ස - ස - ස -/

   / ස ස ස ස / ස ස ස ස /ස ස ස ස / ස ස ස ස /

2. / ස - රි - / ස - රි - / ස- රි - / ස - රි - /

   / ස - රි - / ග - රි - / ස - රි - / ග - රි - /

   / ස - ග - / රි- ස - / ස- ග - / රි - ස - /

   / ස - රි - / ග - ම - / ම - ග - / රි - ස - /

3. / ස - ග - / රි - ම - / ම - රි - / ග - ස - /

   / ස - රි - / ම - ග - / ම - ග - / ම - රි - /

   / ස - ග - / ම - රි - / ම - රි - / ස - ග - /

   / ස - ම - / ග - රි - / ම - ස - / රි - ග - /

## ඇමුණුම් අංක 03

එක් එක් භාණ්ඩයේ ස්වර පිහිටීම දැක්වෙන රූප සටහන් සකසා ගන්න.

ස රි ග ම ස්වර සඳහා
වයලීනය සඳහා සරිගම යන ස්වර අභ්‍යාස

### අභ්‍යාස අංක 01

/ ස - - - / රි - - - / ස - - - / රි - - - /

/ ස - - - / රි - - - / ස - - - / රි - - - /

/ ප - - - / ධ - - - / ප - - - / ධ - - - /

/ ප - - - / ධ - - - / ප - - - / ධ - - - /

### අභ්‍යාස අංක 02

/ ස - - - / රි - - - / ග - - - / රි - - - /

/ ස - - - / රි - - - / ග - - - / රි - - - /

/ ප - - - / ධ - - - / නි - - - / ධ - - - /

/ ප - - - / ධ - - - / නි - - - / ධ - - - /

### අභ්‍යාස අංක 03

/ ස - - - / රි - - - / ග - - - / ම - - - /

/ ම - - - / ග - - - / රි - - - / ස - - - /

/ ප - - - / ධ - - - / නි - - - / ස - - - /

/ ස - - - / නි - - - / ධ - - - / ප - - - /

### අභ්‍යාස අංක 04

/ ස - - - / රි - - - / ග - - - / රි - - - /

/ ම - - - / ග - - - / රි - - - / ග - - - /

/ රි - - - / ග - - - / ම - - - / ග - - - /

/ රි - - - / ග - - - / රි - - - / ස - - - /

## සංගීත භාණ්ඩයකින් ස්වර ස්ථාපන ගීතයක් වාදනය කිරීම

නිපුණතාව 2.0 : වාදන භාණ්ඩයන්හි ස්වරූපය වටහාගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.2 : සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 03

ඉගෙනුම් පල :
- සංගීත භාණ්ඩවල නාදමය ගුණය පිළිබඳ අදහස් දක්වයි.
- වාදක මණ්ඩලයක ස්වරූපය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සපයා ගත හැකි නිර්දේශිත සංගීත භාණ්ඩ
- නියමිත හෝ ගුරුවරයා විසින් නිර්මාණය කරගන්නා ලද ස්වර අභ්‍යාස
- වාදක මණ්ඩලයක පින්තූර සටහනක් හෝ වීඩියෝ දර්ශනයක්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

මේ වන විට 6 ශ්‍රේණියේ සිසුන් වාද්‍ය භාණ්ඩ පිළිබඳ ව සරල අවබෝධයක් ලබා ගෙන ඇත. වාදන ඉරියව්, භාණ්ඩය හැසිරවීම හා ස්වර සප්තකය වාදනය කිරීමේ කුසලතාව ද ඇත. එබැවින් එම සිසුන් ලවා කුඩා ස්වර ස්ථාපන ගීතයක් හෝ නිර්මාණය කරන ලද ස්වර 4 කට 5 කට සීමා වූ ගීතයක් හෝ වාදනය කර ගැනීමේ හැකියාව ලබා ගත යුතු ය. මෙහි දී ගුරුවරයා විසින් ඔවුන්ව මෙහෙයවිය යුතු ය. සංගීත භාණ්ඩ සුසර කර දී සිසුන්ට ස්වර ප්‍රස්තාර ලබා දී හෝ දෘශ්‍ය උපකරණය මාර්ගයෙන් හෝ මෙම ගීතවල ස්වර ප්‍රස්තාරය වාදනය කිරීමට පුහුණු කළ යුතු ය. පුටුවක වාඩි වී සිටින ඉරියව්වෙන් හෝ බිම වාඩි වී සිටින ඉරියව්ව යන දෙකෙන් පහසු ඉරියව්වක් භාවිත කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- ඇමුණුම 1 හි සඳහන් ගීත ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න. නැතහොත් සිසුන්ට ලබා දෙන්න.
- එම ප්‍රස්තාරය හොඳින් කියවීමට අවස්ථාව දෙන්න. සර්පිනාව වයා ප්‍රස්තාරය සිසුන් සමග ගායනය කරන්න.

(මි. 20)

පියවර 02
- ගී පද ප්‍රස්තාරයක සංකේත පිළිබඳ ව සැකෙවින් දැනුවත් කරන්න. සිසුන්ට ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට අවස්ථාව දී සාකච්ඡා කරන්න (ස්වර ඇදෙන ස්ථාන ආදිය)
- 'එකට සතුටු සාගරේ' යන ගීතයේ ස්වර ප්‍රස්තාරය වාදනය කිරීමට සිසුන් පුහුණු කරන්න.
- 'කඳුපෙල අතරේ' යන ගීතයේ ස්වර ප්‍රස්තාරය වාදනය කිරීමට යොමු කරන්න.
- සපයා ඇති වෙනත් ප්‍රස්තාර ද හැකි අයුරින් වාදනයට යොමු කරන්න.
- මෙහි දී ගුරුවරයා සිසුන් ළඟට ගොස් ඔවුන්ගේ හස්ත සාධනය පිළිබඳ පරීක්ෂා කර බලා නිවැරදි කළ යුතු ය.
- අත්පුඩි ගසමින් විධානය දෙමින් සිසුන් පෙළඹවීම ද ගුරුවරයා සතු කාර්යයකි.

(මි. 40)

පියවර 03
- ස්වර ස්ථාපන ගීත වාදනය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සපයා ඇති අනෙක් කුඩා ස්වර ප්‍රස්තාර කොටස් ද වාදනයට අවස්ථාව දෙන්න.
- මේ වන විට අපේක්ෂිත මට්ටම ඉක්මවා යම් සිසුවකු හෝ සිසුවියක වාදන දක්ෂතා පෙන්වන්නේ නම් ඒවා ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවස්ථාව දෙන්න.

(මි. 40)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- වඩා හොඳින් වාදනය කරන සිසුන් ලවා වාදනය කරවන්න.
- වෙනත් ගීත වාදනය කළ හැකි අය වේ නම් ඒ අය ලවා වාදනය කරවන්න.

(මි.20)

පසුවැඩ : ගුරුවරයා විසින් මාත්‍රා 3 හා 4 වශයෙන් බෙදෙන සරල ස්වර ප්‍රස්තාර කීපයක් සකසා දෙන්න.

අතිරේක උදවි : පුවත්පත්, පොත් හෝ වෙනයම් ආකාරයකින් සපයා ගත හැකි ශුද්ධ ස්වර ඇතුළත් සරල ස්වර ප්‍රස්තාර වාදනය කිරීමට සිසුන් උනන්දු කරවන්න.

ඇමුණුම් අංක 01

ගීත අංක 01

/ ස ස ස / රි රි රි /ග - රි / ස - - /

/ ස - ස / රි - රි /ග - ග/ ම - - /

/ ම - ම / ග - ග /රි - රි / ස - - /

/ ස රි ග / ම - - /ම ග රි / ස - - /

ගීත අංක 02

/ ස ස ග ග / රි රි ග - / ස ස රි රි / ග - - -/

/ ස - රි - / ග - ම - / ග - රි - / ස - - - /

/ ප - ප - / ම - ප ම / ග - ම ග / රි - - - /

/ ස රි ග ම /ප - - - / ප ම ග රි / ස - - - /

ගීත අංක 03

/ ස ග රි / ස - - / රි ම ග / රි - - /

/ ග ප ම / ග - - / ම ග රි / ස - - /

/ ප ග ම / ප - - / ම රි ග / ම - - /

/ ග ස රි / ග - - / ප ග රි / ස - - /

ගීත අංක 04

/ ස රි ග රි / ග - - - / රි ග ම ග / ම - - - /

/ ග ම ප ම / ප - - - / ප ම ග රි / ස - - - /

/ ප ම ග ම / ප - - - / ම ග රි ග / ම - - - /

/ ග රි ස රි / ග - - - / ප ම ග රි / ස - - - /

ගීත අංක 05

/ ස රි ග ම / ග රි ස - / ප ධ නි ස̇ / නි ධ ප - /

/ ස̇ නි ධ ප / ධ නි ස̇ - / ම ග රි ස / රි ග ම - /

ගීත අංක 06

/ ස රි ස රි / ප - ප - / ධ ධ ධ නි / ප - ප - /

/ ම ම ම ම / ග ග ග ග / රි රි රි ග / ස - ස - /

ගීත අංක 07

/ ග - ම / ප - ග / ම - ග / රි - - /

/ ග - ම / ප - ධ / නි - - / - - - /

/ ධ - නි /ස̇ - ධ / ප - ග / රි - - /

/ ප - රි / ග - රි / ස - - / - - - /

# කෙළි ගීත (එළුවන් කෑම)

නිපුණතාව 4.0 : සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනා කරමින් සංස්කෘතික උරුමයන් පිළිබඳ සාකච්ඡා කරයි.

නිපුණතා මට්ටම 4.1 : සිංහල ජනක්‍රීඩා ආශ්‍රිත ගීෘත ගායනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- සාමූහිකත්වය වර්ධනය කරන ගීත විශේෂයක් ලෙස අගය කරමින් අදහස් දක්වයි.
- එළුවන් කෑමේ ගීත ගායනය කරයි.
- රංගනයේ යෙදෙමින් රසාස්වාදයේ යෙදෙයි.
- එළුවන් කෑමේ ක්‍රීඩාවේ ස්වභාවය විස්තර කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව
- තාල වාද්‍ය භාණ්ඩ - තාලම්පට, තම්මැට්ටම, ගැටබෙරය
- එළුවන් කෑමේ ගීත ලියන ලද දෘශ්‍යාධාරක
- එළුවන් කෑමේ ජන ක්‍රීඩාවේ නියැලෙන වීඩියෝ පට

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

දේශීය ජන ක්‍රීඩාවක් හා බැඳි ගීත විශේෂයක් ලෙස එළුවන් කෑමේ ගීත හැඳින්වේ. සාම්ප්‍රදායික ගායන විලාසයන්ගෙන් සමන්විත සරල රංගන ක්‍රියාකාරකම් හා බැඳි සාමූහික ව නියැලෙන ක්‍රීඩා විශේෂයකි. ප්‍රශ්න පිළිතුරු රටාව එළුවන් කෑමේ ගීත තුළ දක්නට ලැබෙන විශේෂත්වයක් ලෙස පෙන්වා දිය හැකිය. ගැමි සමාජයේ දරුවන් අතර එකමුතුකම, සහජීවනය, සුහදතාව වර්ධනය කරන ගීත විශේෂයක් ලෙසත් හා දරුවන්ගේ විවේකය ඵලදායි ලෙස ගත කිරීම සඳහාත් විනෝදාස්වාදය සඳහාත් බිහි වූ ගීත විශේෂයක් ලෙසත් එළුවන් කෑමේ ගීත හැඳින්විය හැකි ය. පහත සඳහන් ගී වලින් කැමති ගීත දෙකක් උගන්වන්න.
- මේ වැල මොකක්ද ?
- මේ පුටු කාගේ බණ්ඩාරේ
- කුරුළු කූඩු කූඩු දුටිමි
- කොච්චි කොටන්නං රළහාමී දෙනවද එළුවා

පාඩම සංවර්ධනය :

පියවර 01
- කෙළි ගී ඇසුරින් සත්ත්ව චරිත පාදක කොටගෙන ගොඩනැගී ඇති ගීත විමසුමට ලක් කරන්න.
- අනතුරු ව එළුවන් කෑමේ ගීත කිහිපයක් ගායනය කර පෙන්වන්න. හැකි නම් එළුවන් කෑමේ ක්‍රීඩාව ඇතුළත් වීඩියෝ පටයක් නැරඹීමට සලස්වන්න.

(මි. 10)

පියවර 02
- මෙම ක්‍රීඩා ගී පුහුණු කිරීමේ දී එළිමහන් ස්ථානයක් කරා සිසුන්" රැ ගෙන යන්න.
- එළුවන් කෑමේ ගීත ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ස්වර පුවරුව වයමින් සිසුන් සමග පළමු කවිය ගායනය කර කවි පුහුණු කරන්න.

- තාල වාද්‍ය භාණ්ඩ වයමින් තාල තබමින් ගායනය පුහුණු කරන්න.
- එළුවන් කෑමේ ගීත විවිධ නාද මාලාවන්ට හා විවිධ තාල රූපයන්ට අනුව නිර්මාණය වූ ගීත විශේෂයක් බව සාකච්ඡා කරමින් එම නාද මාලාවන් සහ තාල රූප පිළිබඳ අවධානය යොමු කරමින් ගායනයට පුහුණු කරන්න.
- දෘශ්‍යධාරයේ ඇතුළත් දෙවන ගීතය ද පුහුණු කරවන්න.
- එළුවන් කෑමේ ක්‍රීඩාවේ නියැලෙන අයුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ගුරුවරයා ද රංගනයේ යෙදෙමින් සිසුන්ද රංගනයට යොමු කරන්න.

(මි.40)

පියවර 03

- එළුවන් කෑමේ ක්‍රීඩාවේ දක්නට ලැබෙන චරිත කවරේදැයි දරුවන්ගෙන් විමසන්න.
- එම චරිත නිරූපනයට හැකි පරිදි එක් එක් සිසුන්ට අවස්ථාව ලබා දෙමින් ගීත ගයමින් රංගනයේ යෙදීමට යොමු කරන්න.
- අහඹු ලෙස තෝරාගත් විවිධ නාදමාලාවන්ට අයත් එළුවන් කෑමේ ගී පාදයන් ගැයීමට කුඩා කණ්ඩායම් යොමු කරන්න.

(මි.20)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාමූහික ව එකමුතු ව කටයුතු කළ සිසුන් අගය කරන්න.
- චරිත නිරූපණයන් මැනවින් ඉටු කළ දරුවන්ට ප්‍රශංසා කරන්න.
- අහඹු ලෙස තෝරාගත් විවිධ නාද මාලාවන්ට අයත් එළුවන් කෑමේ ගී පදයන් ගැයූ කණ්ඩායම් සතු හැකියා සෙසු කණ්ඩායම් තුළින් අගය කිරීමට යොමු කරන්න.

(මි. 10)

පසුවැඩ : එළුවන් කෑමේ ජන ක්‍රීඩාව අලංකාරවත් ව චිත්‍රයට නගන්න.

අතිරේක උදව් : සිංහල ජනකවි සංග්‍රහය

# කෙළි ගීත (මේවර කෙළිය)

නිපුණතාව 4.0 : සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරමින් සංස්කෘතික උරුමයන් පිළිබඳ සාකච්ඡා කරයි.

නිපුණතා මට්ටම 4.1 : සිංහල ජනක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් පල :
- සාමූහිකත්වය වර්ධනය කරන ගීත විශේෂයක් ලෙස අගය කරමින් අදහස් දක්වයි.
- මේවර කෙළියේ ගීත ගායනා කරයි.
- රංගනයේ යෙදෙමින් රසාස්වාදයේ යෙදෙයි.
- ගැමි පරිසරය, ගැමි ජීවන රටාව මෙම ගීත තුළින් විචිත්‍රවත්ව මැවීපෙනෙන බව ප්‍රකාශ කරයි.
- මේවර කෙළියේ ස්වභාවය විස්තර කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව
- තාල වාද්‍ය භාණ්ඩ - තාලම්පට, තම්මැට්ටම, ගැටබෙරය
- මේවර කෙළිය ගීත ලියන ලද දෘශ්‍යාධාරක - පිටු අංක 42 ඇතුළත් ගීත දෙකක් ප්‍රමාණවත් වේ.

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

දේශීය ජනක්‍රීඩා හා බැඳි සාම්ප්‍රදායික ගායන විශේෂයක් ලෙස මේවර කෙළිය හැඳින්විය හැකි ය. ප්‍රශ්න හා පිළිතුරු වශයෙන් රංගන ක්‍රියාකාරකම් හා බැඳි සාමූහික ව නියැලෙන කෙළි ගීත විශේෂයකි. නැති වූ ආභරණයක් පිළිබඳ ව සෙවීම, විමසීම, මෙම ගීතවලින් කියවේ. ගැමි සමාජයේ දරුවන් අතර එකමුතුකම, සහජීවනය, සුහදතාවය වර්ධනය කරන ගීත විශේෂයක් බවත්, පැහැදිලි කරදීම මෙයින් අපේක්ෂා කෙරේ. පහත සඳහන් ගී වලින් කැමති ගීත දෙකක් මේ සඳහා යොදා ගන්න.
- සාර සදිසි පෙති පේර නෙලන කල වල ගියදෝ මගෙ මේවරයා
- කොටන පොලන කොට පොල් අඹරන කොට
- නෑමට ගොස් එම නාන තැනේ දී වල ගියදෝ මගෙ මේවරයා

(මි. 40)

පාඩම සංවර්ධනය

පියවර 01
- සිසුන් දන්නා කෙළි ගී ඇසුරින් ආභරණයක් සෙවීම පාදක කර ගනිමින් ගොඩනැඟී ඇති ගීත විමසුමට ලක් කරන්න.
- අනතුරු ව මේවර කෙළියේ ගීත ගායනය කර පෙන්වන්න.

(මි.05යි)

පියවර 02
- පුහුණු කිරීම සඳහා එළිමහන් ස්ථානයක් කරා සිසුන් රැගෙන යන්න.
- මේවර කෙළියේ ගීත ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කර පළමු ගීතය ගායනයට පුහුණු කරන්න.
- ගැමි පරිසරය ගැමි ජීවන රටාව මෙම ගීත තුළින් පියවරෙන් පියවරට අලංකාරවත් ව මතුවන ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- දෘශ්‍යාධාරයේ ඇතුළත් දෙවන ගීතය ගායනය කිරීමට යොමු කරන්න.
- ස්වර පුවරුව වයමින් දරුවන් සමග ගායනය කර පුහුණු කරන්න.
- තාල වාද්‍ය භාණ්ඩ වයමින් තාල තබමින් ගායනය පුහුණු කරන්න.
- මේවර කෙළියේ නියැලෙන අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ගුරුවරයා ද රංගනයේ යෙදෙමින් සිසුන් රංගනයට යොමු කරන්න.

(මි. 20)

පියවර 03
- මේවර කෙළියේ ගීත තුළ දක්නට ලැබෙන විශේෂතා කවරේදැයි සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් කණ්ඩායම්වලට වෙන් කොට ගීත දෙක ගයමින් රංගනයේ යෙදීමට යොමු කරන්න.
- මේවර කෙළියේ ගීත ඇසුරින් ගැමි පරිසරය ඉස්මතු වන ආකාරය පිළිබඳ කෙටි විමසුමක් කරන්න.

(මි. 10)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- සාමූහික ව එකමුතු ව කටයුතු කළ සිසුන් අගය කරන්න.
- චරිත නිරූපණයන් මැනවින් ඉටු කළ සිසුන්ට ප්‍රශංසා කරන්න.
- ගීත ගයමින් අලංකාරවත් ව රංගනයේ යෙදුණු සිසුන්ගේ හැකියා අගය කරන්න.
- මේවර කෙළියේ ගීත ඇසුරින් ඉදිරිපත් කරන ලද අදහස් අගය කරන්න.

(මි. 05)

පසුවැඩ : මේවර කෙළිය ගීත ඇසුරින් ඔබ සිත් ගත් අවස්ථාවක් අලංකාරවත් ව චිත්‍රයට නගන්න.

අතිරේක උදව් :
- සිංහල ජනකවි සංග්‍රහය
- 2007 - 6 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශය - පිටු අංක 42

# කෙළි ගීත (ඔළිඳ කෙළිය)

නිපුණතාව 4.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 4.1 : සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් පල :
- ඔළිඳ කෙළිය ගීතවල නාද රටාව ගැන අදහස් දක්වයි.
- කෙළි ගී නාද මාලා එකිනෙකට සුළු වෙනස්කම් පෙන්වන බව ප්‍රකාශ කරයි.
- ඔළිඳ කෙළිය ගීත නාද රටා, සහ ක්‍රීඩාව පිළිබඳ අදහස් දක්වයි.

ගුණාත්මක යෙදවුම් : ඔළිඳ ඇට, ඔළිඳ පුවරුවක්, කවි ලියන ලද පත්‍රිකාවක්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

විවිධ ජන ක්‍රීඩාවන්හි දී ගැයෙන කවි සඳහා ආවේණික නාද රටාවන් ඇත. එයින් කෙළි ගී සරල බස් වහරකින් හා ක්‍රීඩාවට උචිත වන ආකාරයෙන් නිර්මාණය වී ඇත. මේ සඳහා මාත්‍රා 3 රිද්ම රටා බොහෝ විට යොදා ගැනේ. වසර පුරා ගැමියන් ක්‍රීඩාවන්හි නොයෙදුණ ද, ගොවිතැන් සරුසාර වූ පසු ඒවා කපා පාගා ගනිමින් අනතුරු ව එළඹෙන අවුරුදු සමය අළලා කෙළි ගී ආශ්‍රිත නිර්මාණවල යෙදීම සිරිතක් ව පැවතුණි. වර්තමානයේ මෙන් ම එදා සමාජයේ ද ගැහැණු පිරිමි දෙපක්ෂය සඳහා වෙන් වූ ජනක්‍රීඩා දක්නට ලැබේ. එදා මේ සෑම ක්‍රීඩාවකට ම සහභාගි වූයේ සාමූහික වශයෙනි. අද මෙන් එදා ක්‍රීඩා පිටි නොතිබුණු නිසා කමත, ගෙවත්ත මේ සඳහා යොදා ගත් බව තොරතුරුවලින් හෙළි වේ. ඔළිඳ කෙළිය විශේෂයෙන් අවුරුදු සමයේ භාවිත වූ බව කියවේ. මෙම ජනක්‍රීඩා එකමුතුකම, සුහදතාවය, සාමූහිකත්වය වර්ධනය පදනම් කරගෙන නිර්මාණය වී ඇති බව පෙනේ. ඔළිඳ කෙළිය කාන්තාවන් සඳහා පමණක් සීමා වූ ක්‍රීඩාවක් ලෙස සැලකේ. ඔළිඳ කෙළියට ඔළිඳ පෙත හෙවත් ඔළිඳ පුවරුව යොදා ගැනේ. සරල ගණිතමය හැකියා දියුණු කරන ක්‍රීඩාවකි. පහත සඳහන් ගී වලින් කැමති ගීත දෙකක් මේ සඳහා යොදාගන්න.
- ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ
- දොඩම් කපාලා ඇඹුල් තනාලා
- ඔළිඳ වැපුරුව ද බල කොයි නෑනෝ

පියවර 01
- ඔළිඳ කෙළිය ගීත ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ස්වර පුවරුව වාදනය කරමින් ගීත දෙක ගුරුවරයා විසින් ගායනය කරන්න. (නාද රටා දෙකකින් ගැයෙන ගීත දෙකක් තෝරා ගන්න.)
- තාලම්පට, පන්තේරු, ගැටබෙරය ගීතයට අනුව තාලානුකූල ව වැයීමට ළමුන් යොමු කරන්න.
- නාද මාලා දෙකකට අනුව ගැයෙන නාද රටාවල ඇති විවිධත්වය සාකච්ඡා කරන්න.

(මි. 10 යි)

පියවර 02 ■ ගීතවල නාදමාලා හොඳින් තහවුරු වන තෙක් ගීත ගායනය කරවන්න.

■ නාද මාලා දෙකකට අනුව ගීත දෙක වෙන් වෙන් ව ගායනයෙහි යොදවන්න.

(මි. 15යි)

පියවර 03 ■ කණ්ඩායම් වශයෙන් ගායනය කරවන්න.

■ තනි තනි ව ඉදිරිපත් වීමට කැමති සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

■ රංගනයත් සමඟ ගීත ගායනයට අවස්ථාව ලබාදෙන්න.

(මි. 10යි)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

■ තනි තනි ව හා කණ්ඩායම් වශයෙන් ගායනා ඉදිරිපත් කළ සිසුන් ඇගයීමට ලක් කරන්න.

(මි. 05යි)

පසුවැඩ : ඔළිඳ කෙළිය ගී එකතුවක් සාදන්න.

අතිරේක උදවි :

■ 2007 6 ශ්‍රේණියට ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

■ සිංහල ජනකවි සංග්‍රහය

■ හෙළ ගී මග, ඩබ්. මකුලොලුව මහතා

# කළගෙඩි සෙල්ලම ගීත ගායනය කරමින් රංගනය කරමු

නිපුණතාව 4.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 4.1 : සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : කාලඡේද 02

ඉගෙනුම් පල :
- කළගෙඩි සෙල්ලමේ ගීතවල නාද රටාව හා පදමාලාව පිළිබඳ අදහස් දක්වයි.
- දේශීය ජනක්‍රීඩා ආශ්‍රිත කෙළි ගී නාදමාලා එකිනෙකට සුළු වශයෙන් වෙනස්කම් පෙන්වන බව ප්‍රකාශ කරයි.
- ප්‍රීතියෙන්, රංගනයෙහි, ගායනයෙහි සාමූහික ජන නැටුමක් බව පිළිගනියි.
- උචිත රංග රටා ඇසුරින් ස්වයං නිර්මාණ ඉදිරිපත් කරමින් නර්තනයේ යෙදෙයි.
- මෙම ගී ඇසුරින් කරන ලද සරල ගී අගය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට, කළගෙඩි
- කළගෙඩි කවි ලියන ලද දෘශ්‍යාධාරය (2007 ශ්‍රේණියේ ගුරුමාර්ගෝපදේශයේ පිටු අංක 46)

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

දේශීය ජන ක්‍රීඩා වර්ග කිහිපයක් ඇත. ඉන් එකකි කළගෙඩි සෙල්ලම ඒ අතර දෙපිල බෙදී ගෙන කරන ජන ක්‍රීඩා ද නර්තනය ප්‍රධාන කොට කෙරෙන ක්‍රීඩා ද ඇත. කළගෙඩි සෙල්ලම මේ දෙවන වර්ගයට අයත් වන අතර එහිදී කවියට පෙර තානමකින් ගැයුම ආරම්භ වෙයි. විශේෂයෙන් ගැහැණු ළමුන් සඳහා පමණක් නිර්මාණය වූ ගැමි නැටුමකි. ගමේ පෙරහැර, විවිධ ප්‍රසංග සහ ජාතික උත්සව වැනි අවස්ථාවලදී කළගෙඩි සෙල්ලම විශේෂාංගයක් වී ඇත. මෙය සාමූහික ව කෙරෙන ගැමි නැටුමකි. කළගෙඩි සෙල්ලමේ ගීත රංගනයට අදාළ ව සරල රිද්ම රටාවකට අනුව නිර්මාණය වී ඇත. දේශීය ජනක්‍රීඩා ගීතවල නාදමාලාවන් විවිධ කාර්යයන් අනුව එකිනෙකට වෙනස් වේ. ඒ ආශ්‍රයෙන් විවිධ චලන රටාවන්ට අනුව රසවත් නිර්මාණ බිහි කළ හැකි ය. නොයෙක් උත්සව අවස්ථාවන් සඳහා ප්‍රසංග අංගයක් ලෙස ඉදිරිපත් කළ හැකි ය. මේවා සරල ගී නිර්මාණයේ දී ද යොදා ගෙන ඇත. උදා: "තිරය ඇරෙනවා තිරය වැහෙනවා" ගායනය ශිල්පී සුනිල් එදිරිසිංහ. ගී තනුව ආචාර්ය රෝහණ වීරසිංහ.

පහත සඳහන් ගීත වලින් කැමති ගීත දෙකක් මේ සඳහා යොදාගන්න.
- අහසට පිඹිනා
- අඳිමින් සුදු සේලේ රැළි අල්ලා
- වත ඒ පුන්සඳ මෙන් බබලාවි

පාඩම සංවර්ධනය

පියවර 01

- මීට කලින් කරන ලද ක්‍රියාකාරකම්වලින් ගීත කිහිපයක් සිසුන් සමග ගායනය කරන්න. (උදා: එළුවන් කෑම, මේවරකෙළිය, ඔළිඳකෙළිය)
- කළගෙඩි ගීවල තානම වාදනය කර, එම නාදමාලාවට ගැයෙන ගී වර්ගය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මි. 20 යි)

පියවර 02

- කළගෙඩි සෙල්ලමේ ගීත ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- සාම්ප්‍රදායික නාදමාලාවට අනුව ඉහළ ශ්‍රැතියකින් ( ම හෝ ප ශ්‍රැති ස්වරය ලෙස ගෙන) ගීතයේ පාදයෙන් පාදය නාදමාලාව තහවුරු වන පරිදි ගායනය කරවන්න.
- තාලම්පට සහ බෙරය වාදනය කරමින් සිසුන් ගායනයෙහි යොදවන්න.

(මි. 20 යි)

පියවර 03

- සිසුන් කණ්ඩායම් කරන්න.
- පූර්ව උපදෙස් පරිදි සිසුන් රැගෙන එන කළගෙඩි කණ්ඩායම් අතර බෙදා ගැනීමට සලස්වන්න.
- මාත්‍රා තුනේ රිද්ම රටාවට අනුව දෙපා තබමින් රටා මවමින් රංගනය පුහුණු කරවන්න.
- ගීත ගායනය කරමින් සරල තාලපදවලට අනුව චලන භාවිත කරමින් නර්තනයේ යෙදීමට අවස්ථාව දෙන්න.
- කළගෙඩි නිර්මාණ සඳහා උචිත චලනවල දී ගුරුවරයා ද සිසුන් සමග රංගනයේ යෙදෙන්න.
- කණ්ඩායම්වල නිර්මාණ සමස්ත පංතියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මි. 20 යි)

පියවර 04

- සමස්ත කණ්ඩායම්වල නිර්මාණ පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරවීමට අවස්ථාව සලස්වන්න.
- නිවැරදි නාදමාලාව අනුව නිවැරදි ශ්‍රැතියෙන් ගායනය කිරීම වැදගත් බව අවධාරණය කරන්න.

(මි. 10 යි)

ඇගයීම හා තක්සේරුකරණය

සඳහා උපදෙස් : විවිධ චලන රටා අනුව, නිවැරදි ව ගායනය ඉදිරිපත් කළ කණ්ඩායම තෝරා පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දී ඇගයීමට ලක් කරන්න.

(මි. 10 යි)

පසුවැඩ :

- පාසලේ පවත්වන පෙරහැරේ ගායන, නර්තන අංගයක් ලෙස ඉදිරිපත් කිරීමට සුදුසු නිර්මාණයක් පුරුදු පුහුණු වන්න.

අතිරේක උදවි :

- 2007 - 6 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
- සිංහල ජනකවි සංග්‍රහය
- හෙළ ගී මග, ඩබ්. බී. මකුලොලුව මහතා

# ගයා වයා විඳිමු ළමා ගී

නිපුණතාව 5.0 : ව්‍යවහාරික සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ ව අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 5.2 : සිංහල සංගීත හා බැඳි මව්පිය ගුණ වරුණ ඇතුළත් විද්‍යුත් මාධ්‍යයන්හි මාධ්‍යයන්හි ප්‍රචලිත ගීත ගායනය

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- මව්පිය ගුණ ඇතුළත් ළමා ගී පදමාලා තුළ ඇති අන්තර්ගතය වටහා ගනියි.
- ළමා ගී ඇතුළත් ගී ගායනය /වාදන කිරීමේ කුසලතාව ලබයි.
- මව්පිය ගුණ වරුණ ඇතුළත් පදමාලා නිර්මාණය කිරීමට පෙළඹෙයි.
- මව්පිය ගුණ වරුණ ඇතුළත් ගී ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි.
- ලය නිවැරදි ව පවත්වා ගැනීමේ කුසලතාව ලබා ගනියි.

ගුණාත්මක යෙදවුම් :
- නිර්දේශිත ගී අඩංගු කැසට් කාරැඃඑැරැ ඔඞ රැ පෙන්ඩ්‍රයිව් එකක්
- හාර්මෝනියම්/ඕගන්/තබ්ලා හෝ වෙනත් තාල වාද්‍ය භාණ්ඩයක්
- තෝරා ගන්නා ලද ගීත දෙකෙහි පදමාලා අඩංගු දෘශ්‍යාධාරක දෙකක් හෝ ශිෂ්‍ය සංඛ්‍යාවට ගැලපෙන ඡායා පිටපත්
- ගුරුවරයාගේ පාඩම් සැලසුමට අනුව සකසන ලද චිත්‍ර ඡායාරූප ලිපි ලේඛන වැනි දෑ ඇමුණුමෙහි ඡායා පිටපත්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :
- ශ්‍රී ලාංකේය සමාජ පදනම තුළ දරුවන් හා දෙමාපියන් අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. නිර්දේශිත සුරතල් නංගීයේ අපෙ අම්මා - මිදුලේ වැලි මාළිගාවේ යන ගීතවල පදමාලා දරුවන්ට සංවේදී වන අයුරින් පහදන්න. සිසුන්ට සුදුසු ශ්‍රැතියක් තෝරාගෙන යෝජිත ගී ප්‍රාසංගික ව ගායනයට හුරු කරන්න.
- මුල් ගීතවලට හානියක් නොවන සේ ගායනය කිරීම වඩාත් වැදගත් වේ.
- පාඩමට පෙර දිනක දී ගායන කුසලතාව ඇති සිසු සිසුවියකට මව්පිය ගුණ වරුණ ගීතයක් ගායනය සඳහා සූදානම් ව එන ලෙස දැනුවත් කරන්න. (පාඩම සඳහා යෝජිත ගීත මේ සඳහා යොදා නොගැනීමට සැළකිලිමත් වන්න.) සර්පිනාව, ඕගනය වැනි සංගීත භාණ්ඩයක් යොදාගැනීම උචිත ය.

පාඩම සංවර්ධනය :

පියවර 01
- සිසුවා/සිසුවිය තෝරාගත් ගීතය ශ්‍රවණයට සලස්වන්න. (වාදන සහාය අත්‍යවශ්‍ය ය)
- ගායනය සහ ඉදිරිපත් වීම අගයන්න.
- පන්තියේ අන් සිසු සිසුවියන්ගේ අත්පොලසන් නදින් උපස්ථම්බනය කරන්න.
- එම ගීතයේ ඇතුළත් මව්පියගුණ සාකච්ඡා කරන්න.

(මි. 05)

පියවර 02
- නිර්දේශිත ගීතය ගායනය කරන්න.
- ගායනය සඳහා තෝරාගත් ගීතයේ පදමාලාව ප්‍රදර්ශනය කරන්න. ඡායා පිටපත් සිසුන්ට ලබා දෙන්න.
- ගීතයේ තනුව සිසුන්ට ග්‍රහණය කරගත හැකි වන සේ ගායනයට හුරු කරන්න.

- සාමූහික/යුගල/ඒකල ආදි වශයෙන් නැවත නැවතත් ගායනය කරවන්න.
- දෙවැනි ළමා ගීතය ද මෙලෙස ගායනයට හුරු කරවන්න.

(මි.35යි)

පියවර 03

- ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පන්තිය කණ්ඩායම් ගත කරන්න.
- ගායනය කරන ලද ළමා ගීත දෙකෙහි ඡායා පිටපත් එම කණ්ඩායම් අතර බෙදන්න.
- ගායනය සමග ඊට සරිලන සරල රංගනයක් නිර්මාණය කර ගැනීමට හා පුහුණුවීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායම් විසින් නිර්මාණය කරන ලද රංගන විලාසයන් සහිත ගායනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මි.30යි)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කළ එම ප්‍රාසංගික අංග සහිත ගායනය අගයන්න.
- ගායනයෙහි සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
- රංගනයෙහි නිර්මාණාත්මක බව අගයන්න.
- ගීතය හා රංගනය අතර ඇති ගැලපීම් හා නොගැලපීම් පහදා දෙන්න.
- ඉදිරිපත්වීම හා සාමූහික ව කටයුතු කිරීම අගයන්න.

(මි.10යි)

පසුවැඩ :

- මව්පිය ගුණ වරුණ ඇතුළත් ගීතයක පදමාලාව ලියා එහි අරුත පැහැදිලි වන සේ චිත්‍රයක් අඳින්න.
- මව්පිය ගුණ වරුණ ඇතුළත් ගීත අඩංගු පොත් පිංචක් සකසන්න.
- උදෑසන රැස්වීමේ දී, සාහිත්‍ය රැස්වීමේ දී උගත් ගීතයක් සාමූහික ව ගායනය කරන්න.

අතිරේක උදවි : 2007 වසරේ සිට ක්‍රියාත්මක ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.1 නිපුණතා මට්ටම

# තුන් සරණේ ගීත

නිපුණතාව 4.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 4.1 : ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු ගී පිළිබඳ අත්දැකීම් ලබයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල : තුන් සරණේ ගීත ගායනය තුළ අවස්ථා පැහැදිලි කරයි.
තුණ් සරණේ ගීත ගායනා කරයි.
තුණ් සරණේ ගීත ගායනය තුළින් අධ්‍යාත්මික සුවයක් ලබයි.

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව
- තාල වාද්‍ය භාණ්ඩ - තාලම්පට තම්මැට්ටම, ගැටබෙරය
- තුන් සරණේ ගීත ලියන ලද දෘශ්‍යාධාරක

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

මෙම පාඩමේ දී තුන් සරණේ ගීත දෙකක් පමණක් ගායනය සඳහා යොදා ගැනීම ප්‍රමාණවත් ය. ගැමියා තුළ පැවති ඇදහිලි හා විශ්වාස පදනම් කරගනිමින් ගොඩනැගුණු ගී අතුරින් එක් ගීත විශේෂයක් ලෙස තුන් සරණේ ගීත හැඳින්විය හැකි ය. කෘෂිකාර්මික ජීවන රටාව හා බැඳුණු තම ජීවන වෘත්තීන්වල නියැලීමේ දී ඇති වන බාධක දුරලා ගැනීමටත්, සශ්‍රීකත්වය ලබාගැනීමටත්, මානසික සුවය සඳහාත් තුණුරුවන් ආශිර්වාදය ලබාගැනීම ගැමි ජීවිතය හා බද්ධ වූ ලක්ෂණයකි. තෙරුවන් ගුණ හා විවිධ බෞද්ධ කතන්දර තේමා කරගෙන මෙම ගීත රචනා වී ඇත. සිරිපා වන්දනාවේ දී ඇති වන ගමන් අපහසුතාව අමතක කර විඩාව නිවා ගැනීමට මෙම ගීත එදා සිට අද දක්වා ම වන්දනාවේ යන්නෝ ගායනය කරති. පහත සඳහන් ගීත ගායනය සඳහා යොදාගන්න.

- බුද්ධං සරණේ සිරස දරාගෙන
- සීත ගඟුලෙ දී ඇඳ පේවෙනවා

පාඩම සංවර්ධනය :

පියවර 01
- 'වදින්න යන මේ නඩේට බුද්ධං සරණේ සරණයි
  වැඳල බහින මේ නඩේට ධම්මං සරණේ සරණයි'
- 'අග්ගල කං ඩෝං පුතා - හෙලේ නගිං ඩෝං පුතා'
  මෙම ආශිර්වාද හා යෙදෙම් ගුරුතුමා විසින් නිදර්ශනය කර පෙන්වා ඒ පිළිබඳ විමසීමක් කරන්න.

(මි.10)

පියවර 02
- ළමුන් කණ්ඩායම වට කරගනිමින් ගුරුතුමා විසින් එක් තුන් සරණේ ගීතයක් රසවත් ව ගයා ළමුන්ට එය හුරු වන තුරු කිහිප වතාවක් ඔවුන් සමග ගයන්න.

- නඩේ ගුරකු පත් කරගනිමින් වන්දනා නඩයක භූමිකා රංගනයක් ඉදිරිපත් කරමින් රබන්, ගෙජ්ජි, තාලම්පට දවුල් තම්මැට්ටම් වාදනය කරමින් සිසුන් කිහිප දෙනකු ගමන් කරන්නට යොමු කරන්න. දොහොත් මුදුන් දී දෑත නළලේ බැඳගෙන සිසුන් බුද්ධං සරණේ සිරස දරාගෙන ගීතය ගයමින් පේලියට පන්තියෙන් එළිමහන් ස්ථානයක් දක්වා භක්තිය දනවන අයුරු නිරූපණය කරමින් ගමන් කරවන්න.
- ස්වර පුවරුව වයමින් සිසුන් සමග ගායනය කරමින් පුහුණු කරන්න. තාල වාද්‍ය භාණ්ඩ වයමින් තාල තබමින් ගායනය පුහුණු කරන්න.
- සිසුන් කණ්ඩායම් කරමින් තුන් සරණේ ගීතයක් ප්‍රදර්ශනය කර රංගනයේ යෙදෙමින් ගායනයට යොමු කරන්න.

(මි.30)

පියවර 03

- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකු ගීතය ගායනයට යොමු කර එහි විලාශය නිරීක්ෂණය කරවන්න.
- කණ්ඩායම් වශයෙන් සිසුන්ට ගීත ගායනයට අවස්ථාව ලබාදෙන්න.

(මි.35)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- රංගනය සමඟ වඩාත් භාවාත්මක ව හා නිවැරදි ව ගායනය කළ කණ්ඩායම පන්තිය ඉදිරියට කැඳවා ඇගයීමක් කරන්න.

(මි.05)

පසුවැඩ : තුන් සරණේ ගීත ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.

අතිරේක උදව් : සිංහල ජනකවි සංග්‍රහය

## නරිබෑණා නාට්‍යයේ ගීත ගායනය කරමු

නිපුණතාව 6.0 : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 6.1 : නාට්‍ය ගීත ගායනා කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- නාට්‍ය ගීත ගායනය කිරීමේ කුසලතාව ලබයි.
- නාට්‍ය ගීත ගයමින් රස විඳියි.
- නරි බෑණා නාට්‍යය පිළිබඳ අදහස් දක්වයි.
- ප්‍රාසංගික ව ගීත ගායනයට ඇල්මක් දක්වයි.

ගුණාත්මක යෙදවුම් :
- ගුරුවරයා තෝරාගත් ගීත ලියූ දෘශ්‍ය උපකරණ
- නාට්‍යයේ ගීත ඇතුළත් කැසට් පටයක් හෝ ඝ තැටියක්
- තාල වාදනය සඳහා පහතරට බෙරයක්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

- ව්‍යවහාරික සංගීතයේ එන නාට්‍ය ගීත ඉදිරිපත් කිරීමේ දී ප්‍රාසංගික ව ගායනය කිරීම වැදගත් වේ. ඒ සඳහා මෙහිදී නරිබෑණා නාට්‍යයේ ගී තෝරාගත හැකි ය. මෙම නාට්‍යයේ නිෂ්පාදක දයානන්ද ගුණවර්ධන ශූරීන් බවත් සංගීත නිර්මාණය ආචාර්ය ලයනල් අල්ගම ශූරීන් බවත් පැහැදිලි කර දීම වැදගත් වේ. මෙම නාට්‍යයේ එන ගීත රබන් පද ආශ්‍රිත ව නිර්මාණය වී ඇති බවත්, දෙබස් ද රිද්මයානුකූල ව ගීතවත් බවකින් නිර්මාණය වී ඇති බවත් පහදා දෙන්න. නාට්‍යයේ ගීත කිහිපයක් සිසුන්ට ගායනය කිරීමට අවස්ථාව ලබාදිය හැකි ය. ඒ සඳහා සුදුසු ගීත පහත දැක්වේ.
- 'ඇහැළ මලින් ගස් පිරිලා'
- 'තෝව දෙන්නෙත් නරියටයි'
- 'නරිනයිදෙගෙ කාලෙ හොඳයි'
- 'බලන් අපි උන්නෙ - එහෙං එනකං නෙ'

කාලච්ඡේද 02 තුළ දී ඉහත ගීතවලින් ගීත දෙකක් ගායන කිරීමට පුහුණු කරවන්න.

පාඩම සංවර්ධනය

පියවර 01
- නරිබෑණා නාට්‍යයේ එන සුදුසු දෙබස් ඛණ්ඩයක් තෝරාගෙන ඉදිරිපත් කරන්න.

  උදා: "ෂා... ගම දෝනි නම් හරිම පංකාදුයි "

  ''හනේ ෟ හනේ ෟ කෝ දර කැඩුව ද ?''

- රංගනය සමග ඉදිරිපත් කළ එම දෙබස් ඛණ්ඩ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.

(මි. 05)

පියවර 02
- තෝරාගත් ගීත දෙක ඇතුළත් දෘශ්‍යාධාරය සිසුන්ට ප්‍රදර්ශනය කර ඉන් එක් ගීතයක් රසවත් ව ගායනය කරන්න. නැතහොත් කැසට් පටයකින් හෝ සීඩී තැටියකින් ගීත වාදනය කර ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- එය අනුකරණය කරමින් සිසුන්ට ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙවන ගීතය ද මේ ආකාරයට පුහුණු කරවන්න.

(මි. 60)

පියවර 03
- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව ගීත ගායනයට අවස්ථාව ලබා දෙන්න.
  (වාදනයෙන් සහාය ලබා දෙන්න)
- කණ්ඩායම් මාරු කරමින්, ගායනයට අවස්ථාව ලබා දෙන්න.
- ගීත දෙක ම ඉදිරිපත් කිරීමට අහඹු ලෙස සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මි. 10)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- වඩාත් ම රසවත් ව හා ප්‍රාසංගික ව ගායනය කරන සිසුන් පන්තිය ඉදිරියෙහි ගායනයට සලස්වා ඇගයීමක් කරන්න.

(මි. 05)

පසුවැඩ : ඉගැන්වීමට යොදා නොගත් ඉතිරි ගීත දෙක ද නිදහස් කාලයක දී පුහුණු කරවන්න.

අතිරේක උදවි : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 54 - 59 දක්වා ඇති 5.2 නිපුණතා මට්ටමට අදාළ කොටස් පරිශීලනය කරන්න.

# නරිබෑණා නාට්‍යයේ ගීත රංගනය සමග ගායනය කරමු

නිපුණතාව 6.0 : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 6.2 : නාට්‍ය ගීත ගායනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : කාලච්ඡේද 02

ඉගෙනුම් පල :
- නාට්‍ය ගීත ගයමින් රංගනයේ යෙදෙයි.
- නාට්‍ය ගීත රංගනයේ යෙදෙමින් ගායනය කිරීම රසවත් බව පිළිගනියි.
- නරි බෑණා නාට්‍යයේ ගීත නිර්මාණයට පදනම් වූ රබන් පද පිළිබඳ අදහස් දක්වයි.

ගුණාත්මක යෙදවුම් :
- ගුරුවරයා තෝරාගත් ගීත ලියූ දෘශ්‍ය උපකරණ
- ගීත ඇතුළත් කැසට් පටයක් හෝ cd තැටියක්
- ස්වර වාද්‍ය භාණ්ඩයක් හෝ සර්පිනාව
- තාල වාදනය සඳහා පහතරට බෙරයක්

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

- නාට්‍ය ගීත ඉදිරිපත් කිරීමේ දී ගායනය සමග රංගනය වැදගත් වේ. එසේ ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීමේ දී ප්‍රේක්ෂකයා වඩාත් අමන්දානන්දයට පත් කරගත හැකි ය. රසවින්දනය තීව්‍ර වේ. මෙම නාට්‍යයේ ගීත මීට පෙර පාඩමේ දී සිසුන් ඉගෙන ගෙන ඇති අතර එම ගීත ගායනය රංගනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. මේ සඳහා සුදුසු ගීත පහත දැක්වේ.
- 'ඇහැළ මලින් ගස් පිරිලා'
- 'තෝච දෙන්නෙත් නරියටයි'
- 'නරිනයිදෙගෙ කාලෙ හොඳයි'
- 'බලන් අපි උන්නෙ - එහෙං එනකං නෙ'

කාලච්ඡේද 02 සඳහා ඉහත ගීතවලින් ගීත දෙකක් ගායනය කිරීමට පුහුණු කරවන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- පසුගිය පාඩමින් උගත් ගීතයක් සාමූහික ව ගැයීමට සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න.
- එම ගීතයට රංගනයක් කිරීමට සිසුවකුට හෝ සිසුවියකට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ ගායනය හා රංගනය අගයන්න.

(මි. 10)

පියවර 02
- ඉගෙන ගත් ගීත දෙකින් එක් ගීතයක් සාමූහික ව ගායනය කරවන්න.
- කණ්ඩායම් කර ගීතයට අනුව රංගනයක් කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.
- දෙවැනි ගීතය ද මේ ආකාරයට පුහුණු කරවන්න.
- ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීමට ගුරුවරයාගේ සහාය ලබා දෙන්න.
- ගුරුවරයාට වාදනයෙන් සහාය ලබා දිය හැකි ය.

(මි. 30)

පියවර 03

- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව රංගනය සමග ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න, ගායනයට අවස්ථාව ලබා දෙන්න. (වාදනයෙන් ගුරු සහාය ලබා දිය යුතු ය)
- කණ්ඩායම් මාරු කරමින්, ගායනයට හා රංගනයට අවස්ථාව ලබා දෙන්න.
- ගීත දෙක ම ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මි. 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ඉහළ මට්ටමකින් රංගනය හා ගායනය ඉදිරිපත් කරන කණ්ඩායම් හෝ කේවල ව ඉදිරිපත් කරන සිසුන් පන්තිය ඉදිරියට කැඳවා ක්‍රියාකාරකමෙහි යොදවා අගය කරන්න.

(මි. 10)

පසුවැඩ : ඉතිරි ගීත දෙක නිදහස් කාලයක දී පුහුණු කරවන්න.

අතිරේක උදවි : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශයේ 5.2 නිපුණතා මට්ටමට අදාළ කොටස් පරිශීලනය කරන්න.

# ඇතිල්ලීමෙන්, පෙළීමෙන්, පිඹීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ

නිපුණතාව 7.0 : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 7.1 : හඬ නිපදවිය හැකි මෙවලම් සකසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගෙනුම් පල : පරිසරයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය යොදා ගනිමින් ආදේශ භාණ්ඩ නිර්මාණය කරයි.

ගුණාත්මක යෙදවුම් :
- රිජිෆෝම්, ගම් කුප්පි, විවිධ ඇට වර්ග ප්ලාස්ටික් බෝතල්, කළගෙඩි
- ක්ලැපර්ස්, මර්කාස්,
- රිද්ම රටා ප්‍රස්තාර කරන ලද දෘශ්‍ය පත්‍රිකාවක්
- මේස හැඳි, හොඳින් මේරූ වේලා ගත් ඉරටු මිටි, ටොනික් මූඩි, උණබම්බු කැබලි.
- සංගීත භාණ්ඩ
  - ග්ලොකන් ස්පීලයක්
  - සයිලෆෝනයක්
  - නලතරංග
- සංගීත භාණ්ඩ නොමැති අවස්ථාවක දී,
  ස, ග, ප, යන ස්වරවලට සුසර කරන ලද ලෝහ පටි කැබලි හෝ ඇලුමිනියම් පටි කැබලි හෝ ඇලුමිනියම් බට කැබලි

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

පරිසරයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය ඇසුරු කරගනිමින් ළමුන්ගේ නිර්මාණාත්මක කුසලතා ඔප් නැංවෙන අයුරින් ආදේශ භාණ්ඩ නිර්මාණය කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය. ළමුන්ට ආදේශ භාණ්ඩ සැකසීමට මඟ පෙන්වීම තුළින් අනාගතයේ දී ඔවුන්ට ස්වාධීන ව සංගීත භාණ්ඩ නිර්මාණ හැකියාවන් දියුණු කරගත හැකි බවත්, විවිධ රිද්ම රටා නිර්මාණය තුළින් ප්‍රසංග සඳහා සමූහ වාදනයක් නිර්මාණය කර ගත හැකි බවත් අවධාරණය කෙරේ.

පාඩම සංවර්ධනය :

පියවර 01
- රිද්ම රටා ප්‍රස්තාර කරන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- පිළිවෙළින් මාත්‍රා තුනේ රිද්ම රටාව, මාත්‍රා දෙකේ රිද්ම රටාව, මාත්‍රා හතරේ රිද්ම රටාව පත්‍රිකාවේ සඳහන් අන්දමින් තාල තබමින් තාලයට පාද තබමින් හෝ සිසුන්ගේ අවධානයට යොමු කරන්න.
- රිද්ම රටා අනුව ප්‍රස්තාරයක් අවබෝධ කරගන්නා සැටිත්, ඒ අනුව රටා තුළ මාත්‍රා හසුරුවන අන්දමත් සාකච්ඡා කරමින් ප්‍රායෝගික ව අභ්‍යාස කරවන්න.
- ප්‍රස්තාර රටා අවබෝධය ලත් බව පෙනී ගිය පසු පහත සඳහන් කරුණු සාකච්ඡාවට භාජනය කරමින් පැහැදිලි කරන්න.
- මෙම රිද්ම රටා වටහා ගෙන තාල තැබීමෙන් රිද්මය තුළ විවිධ මූලික රටා නිර්මාණය කළ හැකි බව පහදන්න.
- අප අවට පරිසරයේ ඇති මෙවලම් වලින් ආදේශ භාණ්ඩ සකස් කරගෙන එමගින් විවිධ නාද නිපදවා ගත හැකි බව.

(භාණ්ඩවල ස්වභාවය අනුව හඬ නිපදවා පෙන්වන්න)

- එම භාණ්ඩ සියල්ල රටාවන් මත හැඬවීමේ දී ස්වාභාවික පරිසරයේ පවතින සිදුවීම්, නිර්මිත පරිසරයේ ක්‍රියාවන් ප්‍රතිනිර්මාණය කිරීමට හැකි බව.
- රිද්ම රටා මත හඬ නැංවීමෙන් ප්‍රසංගාත්මක සමූහ වාදනයක් කළ හැකි බව. (මි. 40)

පියවර 02
- ළමුන් සියලු දෙනාට ආදේශ භාණ්ඩ අතට ගැනීමට සලස්වන්න.
- එළිමහනේ අවකාශය ඇති ස්ථානයකට කැඳවා ගෙන යන්න.
- සපයා ගත් භාණ්ඩවලින් හඬ නිපදවන ක්‍රම වටහා ගැනීමට අවස්ථාව දී උදව් කරන්න.
- (ගැටීමෙන්, තැලීමෙන්, ඇතිල්ලීමෙන්, පිඹීමෙන්, සෙලවීමෙන් ආදී)
- ළමුන්ට රිසි පරිදි ශබ්ද නංවන්නට ඉඩ හරින්න.
- මාත්‍රා තුනේ, මාත්‍රා දෙකේ, මාත්‍රා හතරේ රිද්ම රටා සඳහා කණ්ඩායම් බෙදන්න.
- බඩී බෝතලය හිස් ව තිබිය දී ඇති හඬ ද , වතුර අඩුවෙන් දමා පිඹීමෙන් පහල හඬක් ද, වැඩියෙන් දමා පිඹීමෙන් ඉහළ හඬක් ද නිකුත් වන අයුරු වරින් වර පිඹිමින් පෙන්වන්න.

(මි. 60)

පියවර 03
- සිසුන් කණ්ඩායම් 6 කට බෙදා කණ්ඩායම් අතර කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- එක් එක් කාර්ය පත්‍රිකාවට අදාළ ක්‍රියාකාරකම්වල යොදවන්න.
- කණ්ඩායම් අතරට ගොස් උපකරණය ගොඩනැගීමට අවශ්‍ය මග පෙන්වීම කරන්න.

(මි. 20)

පියවර 04
- එක් එක් කණ්ඩායම ගොඩනැගූ උපකරණ හඬ නැංවීමට යොමු කරන්න. රිද්ම රටාවකට අනුකූල ව හඬ නැංවීමට උපදෙස් දෙන්න.
- නිර්මාණය කළ උපකරණයේ ගුණාත්මක බව සිසුන් සමග සාකච්ඡා කරන්න. වැඩි දියුණු කර ගැනීමට සහ ස්වර අනුව සුසර කරගැනීමට මග පෙන්වන්න.

පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ගැටීමෙන්, ඇතිල්ලීමෙන්, පිඹීමෙන් සහ සෙලවීමෙන් ආදේශ භාණ්ඩවල හඬ නිකුත් කළ හැකි බව.
- සංගීතමය ස්වර නිකුත් කළ හැකි ආදේශ භාණ්ඩ සකස් කළ හැකි බව.
- හඬ ඉහළ පහළ වීමට බලපාන හේතු ඇති බව, සහ ඒවා එක් එක් භාණ්ඩයේ දී වෙනස් වන බව.
- ආදේශ භාණ්ඩ ඇසුරින් නිර්මාණ කළ හැකි බව.
- උපකරණයේ නිමාව එහි ගුණාත්මක බවට හේතු වන බව.

(මි. 20)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- හඬ නිපදවිය හැකි මෙවලම් සපයයි.
- හඬ ඉහළ පහළ වීමට හේතු දක්වයි.
- සාම්ප්‍රදායික සංගීත භාණ්ඩ සමග සසඳයි.
- නිර්මාණකරණයේ යෙදෙයි.
- විවිධ අත්හදා බැලීම් කරයි. (මි. 20)


| උපකරණ | පහළ හඬක් නිකුත් වීමට හේතු | ඉහළ හඬක් නිකුත් වීමට |
|---|---|---|
| ලෝහ කැබලි /ලී කැබලි | දිග වැඩි නම් හඬ පහළයි | දිග අඩු නම් හඬ ඉහළයි |
| පිඹින විට | දිග වැඩි නම් හඬ පහළයි | දිග අඩු නම් හඬ ඉහළයි |
| වතුර පුරවන වීදුරුවලට තට්ටු කිරීම | වතුර වැඩි නම් හඬ පහළයි | වතුර අඩු නම් හඬ ඉහළයි |
| වතුර පුරවා පිඹින බඩි බෝතල් | වතුර අඩු නම් හඬ පහළයි | වතුර වැඩි නම් හඬ ඉහළයි |
| 2" එස්ලෝන් බටවලට තට්ටු කිරීම | දිග වැඩි නම් හඬ පහළයි | දිග අඩු නම් හඬ ඉහළයි |

කාර්ය පත්‍රිකාව 01

පහත දැක්වෙන අමුද්‍රව්‍ය උපකාරක මෙවලම් සපයා ගන්න.

- ජනෙල් ග්‍රිල් සඳහා යොදා ගන්නා "භාග" පට්ටම් යකඩ පටි කැබලි 3 ක්.
  (අඟල් 9 ක් 8 ක් සහ 6 ක් වශයෙන්) හෝ
- අඟලක් පළල ඇලුමිනියම් පටි කැබලි 3 ක්.
  (අඟල් 9 ක් 8 ක් සහ 6 ක් වශයෙන්) හෝ
- අඟල් දෙකක් පළල ඝනත්වයෙන් වැඩි බුරුත, පලු, හල්මිල්ල වැනි ලී කැබලි 3 ක්.
  (අඟල් 9 ක් 8 ක් සහ 6 ක් වශයෙන්) හෝ
- යකඩ කපන කියත් පටියක් සහ කියතක්
- අඟල් 1 යකඩ ඇණ කිහිපයක්, මිටියක්

ක්‍රියාකාරකම




රූප සටහනේ දැක්වෙන පරිදි දාරකයක් සකසා ඒ මත කැබලි නිදහසේ තබා තට්ටු කර බලන්න.

- දිගින් වැඩි කැබැල්ල තට්ටු කර නිකුත් වන ස්වරයට අනුකූල ස්වරය සර්පිනාවෙන් සොයා බලන්න. මන්ද්‍ර ස්වරයක් නම් දිග ටිකක් කපා (අඟල් භාගයක් පමණ) කෙටි කර නැවත හඬ නංවා බලන්න.
- නැවතත් "ස" ස්වරයට වඩා නිකුත් වන හඬ පහත නම් තවත් කුඩා කොටසක් කපා කෙටි කරන්න. මෙසේ "ස" ස්වරය ලැබෙන තුරු කෙටි කරමින් සුසර කරන්න.
- ඉතිරි කැබලි තුන ද මෙසේ සකසන්න.

කාර්ය පත්‍රිකාව 02

පහත දැක්වෙන අමුද්‍රව්‍ය සපයා ගන්න.

- ඉවත දමන ප්ලැටිග්නම් පෑන් බට, හෝ වයරින් බට කැබලි 3 ක්.
- පොඟවන ලද කඩදාසි කැබලි

ක්‍රියාකාරකම

- මුඛය තබා පිඹීමට හැකි වන පරිදි දෙපස විවෘත නලයක් සේ ප්ලැටිග්නම් පෑන් බට, හෝ වයරින් බට කැබලි සකසා ගන්න.
- එක් පැත්තකට පොඟවන ලද කඩදාසි කැබැල්ලක් සිරකර පිඹ බලන්න. නිකුත් වන ස්වරය සර්පිනාවේ කිනම් ස්වරයක් හා සැසඳේ දැයි සොයන්න.
- "ස" ස්වරයට වඩා පහළ හඬක් නිකුත් වෙයි නම් ක්‍රමයෙන් සිර කරන ලද කඩදාසි කැබැල්ල බටය ඇතුළට යවන්න. ටිකින් ටික සෙමින් යවමින් "ස" ස්වරයට ගැළපෙන ලෙස සුසර කර ගන්න.
- "ග" සහ "ප" ස්වරයන් ගෙන් ඉතිරි බට කැබලි දෙක ද මේ අයුරින් ම සුසර කරගන්න.
- බට තුන ම එකට තබා බැඳ එක් එක් බටයට වෙන වෙන ම පිඹීමෙන් "ස, ග, ප" යන ස්වර නිකුත් කරන්න.

කාර්ය පත්‍රිකාව 03

පහත දැක්වෙන අමුද්‍රව්‍ය සපයා ගන්න.

- දාර නැති වතුර බොන උස වීදුරු (ඡක්සබ ඨකී* 3 ක් හෝ කිහිපයක්.
- වතුර ජෝගුවක්.

ක්‍රියාකාරකම

- වීදුරුව සිමෙන්ති පොළොව මත තබා පැන්සලයකින් තට්ටු කර බලන්න.
- නිකුත් වන ස්වරය සර්පිනාවේ කුමන ස්වරයක් හා සැසඳේ දැයි සොයන්න.
- "ස" ස්වරයට වඩා ඉහළ හඬක් නිකුත් වේ නම් ක්‍රමයෙන් වතුර ටික ටික වීදුරුවට වක් කරන්න.
- "ස" ස්වරයට හෝ මන්ද්‍ර පංචමයට ගැලපෙන ලෙස සුසර කර ගන්න.
- "ග" සහ "ප" වශයෙන් හෝ "ස" සහ "ග" වශයෙන් ඉතිරි වීදුරු දෙක ද මේ අයුරින් සුසර කර ගන්න.
- එක් එක් වීදුරුවට වෙන වෙන ම තට්ටු කිරීමෙන් "ස, ග, ප" යන ස්වර හෝ "ප, ස, ග"යන ස්වර නිකුත් කරන්න.

කාර්ය පත්‍රිකාව 04

පහත දැක්වෙන අමුද්‍රව්‍ය සහ උපකාරක මෙවලම් සපයා ගන්න.

- ෆැන්ටා, කොකාකෝලා වැනි පොඩි බඩි බොතල් 3 ක් හෝ කිහිපයක්.
- වතුර ජෝගුවක්.

ක්‍රියාකාරකම

- එක් බෝතලයකට මුඛය තබා පිඹින්න.
- නිකුත් වන ස්වරය සර්පිනාවේ කුමන ස්වරයක් හා අනුගත දැයි සොයන්න.
- "ස" ස්වරයට වඩා ඉහළ හඬක් නිකුත් වේ නම් ක්‍රමයෙන් වතුර ටික ටික බෝතලයට වක් කරන්න. "ස" ස්වරයට ගැළපෙන ලෙස සුසර කරන්න.
- "ග" සහ "ප" වශයෙන් ඉතිරි බෝතල් දෙක ද මේ අයුරින් සුසර කරන්න.

- එක් එක් බෝතලයට වෙන වෙන ම තිදෙනෙක් පිඹීමෙන් "ස, ග, ප" යන ස්වර නිකුත් කරන්න.
- මිහිරි නාද සංකලනයක් මතු කර ගන්න.

කාර්ය පත්‍රිකාව 05

පහත දැක්වෙන අමුද්‍රව්‍ය සහ උපකාරක මෙවලම් සපයා ගන්න.

- අඟල් 2 විශ්කම්භය ඇති එස්ලෝන් බට කැබලි 3 ක් (අඩි 3 ක් 2.5 ක් සහ 2 ක් වශයෙන්)
- යකඩ කපන කියත් පටියක් සහ කියතක්.
- බටයේ මුහුණතට තට්ටු කිරීමට රබර් සෙරෙප්පු අඩි කැබැල්ලක්.

ක්‍රියාකාරකම

- බටයේ මුහුණතට සෙරෙප්පු අඩි කැබැල්ලක් මගින් හෝ අතින් තට්ටු කරන්න.
- හිස් කළයක කටට තට්ටු කරන විට මතු වන හඬ පරීක්ෂාකර බලන්න.
- දිගින් වැඩි කැබැල්ල තට්ටු කර නිකුත් වන ස්වරයට අනුකූල ස්වරය සර්පිනාවෙන් සොයා බලන්න. මන්ද්‍ර ස්වරයක් නම් දිග මඳක් කපා (අඟල් භාගයක් පමණ) කෙටි කර නැවත හඬ නංවා බලන්න.
- නැවතත් "ස" ස්වරයට වඩා නිකුත් වන හඬ පහත නම් තවත් කුඩා කොටසක් කපා කෙටි කරන්න. මෙසේ "ස" ස්වරය ලැබෙන තුරු කෙටි කරමින් සුසර කරන්න.
- ඉතිරි කැබලි තුන ද මෙසේ සකසන්න.

කාර්ය පත්‍රිකාව 06

පහත දැක්වෙන අමුද්‍රව්‍ය සහ උපකාරක මෙවලම් සපයා ගන්න.

- තලා දිග අරින ලද බීම පියන් කිහිපයක්, කම්බියක්, ඇණයක්, සහ මිටියක්.
- ඉවත දමන ප්ලාස්ටික් බෝතල් කිහිපයක්, මුංඇට, පරිප්පු සහ සහල් ඇට ප්‍රමාණාත්මක ව.
- වැලි කඩදාසි කැබලි කිහිපයක්.
- එක්ස් රේ කඩදාසියක් සහ රබානක් වැනි රවුම් ලී රාමුවක්.
- කිරි වියලන ලද පැපොල් බට කැබලි කිහිපයක්.

ක්‍රියාකාරකම

- ටොනික් පියන් තැලීමට පෙර එහි මැද ඇති රබර් කොටස ඉවත් කරන්න.
- තලා දිග අරින ලද ටොනික් පියන් මැදින් සිදුරු කර කම්බියක් අමුණා සොලවා හඬ නංවන උපකරණයක් සකසන්න.
- ප්ලාස්ටික් බෝතල්වලට විවිධ ඇට වර්ග පුරවා නිකුත් වන හඬෙන් මිහිරි හඬ සොයන්න.
- වැලි කඩදාසි එක මත එක අතුල්ලා නිකුත් වන හඬ විමසන්න.
- එක්ස්රේ කඩදාසියක් රබානක් සේ රවුම් ලී රාමුවකට සවිකර හඬ නංවා බලන්න.
- පැපොල් බටයේ හඬ නැංවෙන සේ කපා පිඹ බලන්න. සිදුරු විද නිකුත් වන ස්වර හඳුනා ගන්න.

# ගැටීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ

නිපුණතාව 7.0 : සංගීත භාණ්ඩ නිර්මාණ කාර්යයේ අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 7.1 : හඬ නිපදවිය හැකි මෙවලම් සකසයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- සංගීත භාණ්ඩයක් ආධාරයෙන් ස්වර සුසර කරයි.
- සිහින් ලී කෝටු 2 ක් මගින් එම ස්වර විවිධ රටාවනට හඬ නංවයි.
- ස්වර තුන අතර පරතරය වටහා ගනියි.
- විවිධ රිද්ම රටා හා තනු කොටස් වයමින් රසාස්වාදයේ යෙදෙයි.
- ආදේශ භාණ්ඩ නිර්මාණයට පෙළඹෙයි.

ගුණාත්මක යෙදවුම් :
- මෙලෝඩිකාවක්, ග්ලොකන් ස්පීල් භාණ්ඩයක්, ඕගනයක් හෝ සර්පිනාවක්, ගිටාරයක්.
- ප්‍රමාණයෙන් එක සමාන එක උස ඇති වීදුරු.
- වීදුරුවලට තට්ටු කළ හැකි පැන්සල් හෝ සිහින් ලී කෝටු.
- ජෝගුවක් හා අවශ්‍ය ප්‍රමාණයට ජලය.
- ගුරුවරයා විසින් සැකසූ ස්වර ප්‍රස්තාර.

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :
- මෙම නිපුණතාවේ ප්‍රථම ක්‍රියාකාරකමේ දී අවනද්ධ හා ඝන ආදේශ භාණ්ඩ සකසා ඇත. සරල රිද්ම රටා කිහිපයකට අනුව වාදනය කර ඇත. මේ ක්‍රියාකාරකමේ දී නිශ්චිත ස්වර සහිත ඝන භාණ්ඩයක් සිසුන් සමග සැකසිය හැකි ය. ස්වර තුනක් උපයෝගි කරගනිමින් සරල වාද්‍ය භාණ්ඩයක් ද, වාදනය කළ හැකි ය. වතුර වීදුර 3 කට ජලය යොදමින් සරිග යන ස්වර තුනේ නාදය සකසා ගැනීමට ඔබ ද, සිසුනට සහාය වන්න. ඒ සඳහා මෙලෝඩිකාවක් හෝ ග්ලොකන් ස්පීල් භාණ්ඩයක් ආධාර කරගන්න. ස රි ග යන ස්වර තුන ඇසුරින් සරල වාද්‍ය බණ්ඩයක් ද, සිසුන් ලවා වාදනය කළ හැකි ය.

- ගුණාත්මක යෙදවුම් පිළිබඳ ව සිසුන් පෙර දිනක දී දැනුවත් කරන්න. වාදනය කළ හැකි ස්වර රටා කිහිපයක් ද සකසා ගන්න. ඔබට ආධාරකයක් ලෙස පහත සඳහන් ස්වර බණ්ඩය ද යොදා ගත හැක.

1 2 3 / 4 5 6 / 7 8 9 / 10 11 12 /
ස - රි / ස - රි / ග - - / - - - /
ග - රි / ග - රි / ස - - / - - - /
ග - රි / ස - රි / ග - - / - - - /
ග - රි / ග - රි / ස - - / - - - /
ග ග රි / ග ග රි / ස - - / - - - /

පාඩම සංවර්ධනය :

පියවර 01
- පහත සඳහන් ප්‍රවේශ අතරින් ඔබ කැමති ප්‍රවේශයක් හෝ ඔබට සුදුසු ප්‍රවේශයක් භාවිත කරන්න.
  a) සරිග යන ස්වර තුන සිසුනට තවදුරටත් තහවුරු වන අන්දමට කැමති භාණ්ඩයකින් විවිධ රටාවනට වාදනය කිරීම.

b) පහත අන්දමට ගොඩනැගූ ස්වර රටා ගායනය කරවමින් ස රි ග ස්වර තුන ශ්‍රවණයට සැලැස්වීම.

ස රි ග / ස රි ග / ස රි ග / රි - - /
ස රි ග / ස රි ග / ස - - / රි - - /

- අදාළ ස්වර තුන සිසුනට තහවුරු වූ පසු වීදුරුවලට ජලය පුරවමින් ස්වර සංඛ්‍යාතයකට සකසා ගන්නා අන්දම පිළිබඳ ව සාකච්ඡා කරමින් නිවැරදි ස්වර 3 සුසර කරවන්න. මෙම භාණ්ඩය ප්‍රචලිත ජල තරංග භාණ්ඩයකට සමාන වන බව ද, පහදා දෙන්න.

(මි. 20)

පියවර 02
- සිසුන් කිහිප දෙනකු ලවා සංගීත භාණ්ඩ මගින් අදාළ ස්වර තුන පිළිවෙළින් වාදනය කරවන්න.
- කණ්ඩායම් මගින් හෝ තනි තනි ව ම හෝ වීදුරුවලට ජලය පුරවමින් ශ්‍රවණය වන ස්වර සංඛ්‍යාතය ගැළපෙන තෙක් සුසර කරවන්න.
- ඒ සඳහා ගුරුවරයා සහාය වන්න.
- වාදනය කළ හැකි දුරකින් වීදුරු තබා ගැනීම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.

(මි. 20)

පියවර 03
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව වාදනයට අවස්ථාව දෙන්න.
- වාදනය කරන විට කිහිප දෙනකු ලවා එය ගායනය කරවන්න.
- සපයා ගෙන ඇති අනෙක් සාම්ප්‍රදායික භාණ්ඩ
- නිවැරදි ශ්‍රැතියට භාණ්ඩය සුසර දැයි සොයා බලන්න.
- කණ්ඩායම් ලවා හෝ තනි සිසුවකු ලවා නව වාද්‍ය භාණ්ඩ නිර්මාණය කර ඒවා වාදනය කරවන්න.
- නිදහස් කාලවල පිඹීමෙන් හෝ පෙළීමෙන් ස්වර ඉපදවිය හැකි භාණ්ඩ සැකසීමට සිසුන් පොළඹවන්න.
- නිවැරදි ව වාදනය කරන කණ්ඩායම් හෝ සිසුන් අගයන්න.

(මි.30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- ඉතා හොඳින් වාදනයේ යෙදෙන කණ්ඩායම හෝ සිසුවා ඉදිරියට ගෙන අගය කරන්න.

(මි.10)

පසු අභ්‍යාස :
- ඉතිරි ස්වර ද හඬ නැගෙන අයුරින් සැකසීමට අවධානය යොමු කරන්න.
- ස්වර ස්ථාපන ගීත වාදනයට යොමු කරන්න.

අතිරේක උදවි : 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි සඳහන් ස්වර ස්ථාපන ගීත, ප්‍රස්තාර භාවිතයට ගන්න.

## ආදේශ භාණ්ඩ හා නිශ්චිත සංගීත භාණ්ඩ එකතුව මාතෘකාවකට අදාළ ව නිර්මාණයේ යෙදීම. (වැස්ස, කෝච්චිය)

නිපුණතාව 7.0 : සංගීත භාණ්ඩ නිර්මාණ කාර්යයේ අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 7.2 : ආදේශ භාණ්ඩ ආශ්‍රිත නිර්මාණයේ යෙදෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :
- ස්වර හතක් දක්වා වීදුරු භාණ්ඩය වර්ධනය කරයි.
- ලියන ලද ස්වර ප්‍රස්තාර කියවා බලා වාදනය කරයි.
- නිර්මාණය කර ඇති වාද්‍ය භාණ්ඩ හා මාතෘකාව අතර ගැලපීම විමසයි.
- නව සංගීත බණ්ඩ නිර්මාණය කිරීමට පෙළඹෙයි.
- සමූහය සමග වයමින් රස විඳියි.

ගුණාත්මක යෙදවුම් :
- මෙලෝඩිකාවක, මවුත්ඕගනය, අවනද්ධ භාණ්ඩයක්, සිම්බල්, යන භාණ්ඩ. මාතෘකාවට අදාළ ව සකස් කරගත් වාද්‍ය භාණ්ඩයන්හි ස්වර පත්‍රිකා.
- අවශ්‍ය ප්‍රමාණයට එක සමාන වීදුරු

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

මේ වන විට සිසුන් ආදේශ භාණ්ඩ නිර්මාණය කර භාවිත සංගීත භාණ්ඩ සමගින් වෙන ම වාදන ඉදිරිපත් කර සැලකිය යුතු වාදන තත්ත්වයකට පැමිණ ඇත ය අපේක්ෂා කළ හැකි ය. ඔවුනට ගෝචර වන වැස්ස වැනි නිර්මාණයක් සමූහ වාදනයක් ලෙස තෝරා ගැනීම ඔබට පහසුවකි.

මේ සඳහා අදාළ මාතෘකාව පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කළ යුතු වේ. පළමුව එම වාදනය සඳහා ගත යුතු කාලය පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න. විනාඩි 6ක් හෝ හතක් සෑහේ. මාතෘකාව පියවරින් පියවර ගොඩනැගීම සඳහා පහත දක්වා ඇති කරුණු ඔබේ අභිමතය පරිදි තෝරා ගත හැක.

1. වැස්සට පෙර පරිසරයේ වෙනස්කම් (සුළං හැමීම, කුරුල්ලන් කූඩු කරා පියැඹීම, ගෙම්බන් හඬ නැගීම ..... ආදි දෑ)
2. සිහින් වැසි පොද පොළොවට පතිත වීම.
3. කෙමෙන් වර්ෂාව වැඩි වීම, ගෙරවීම්, අකුණු ගැසීම්, සුළං තදින් හැමීම.
4. ධාරානිපාත වර්ෂාවක් දක්වා වර්ධනය වීම.
5. සුළං හැමීම, අකුණු ගැසීම, ගෙරවීම ක්‍රමයෙන් අඩුවීම.
6. සිහින් පොද වැස්සකට පරිවර්තනය වීම.
7. කුරුල්ලන් නැවත පියැඹීම, හිරු එළිය පතිත වීම, මිනිසුන් නැවත තම දෛනික කාර්යයන්හි නිරත වීම.

සිසුන්ගේ හැකියාවන් හොඳින් තේරුම් ගෙන ඔබ විසින් සංගීත වාද්‍ය භාණ්ඩ නිර්මාණය කළ යුතු වේ. (ශුද්ධ ස්වරවලින් පමණක් වුව ද සෑහේ.) මීට කලින් ක්‍රියාකාරකමේ ඇතුළත් වූ වීදුරු තුන වෙනුවට ස්වර සප්තකය ම සඳහා ප්‍රමාණවත් වීදුරු සපයා ගැනීමට සිසුන් කලින්

දැනුවත් කරන්න. අදාළ අනිත් භාණ්ඩ වූ මෙලෝඩිකා, මවුත්ඕගන්, අවනද්ධ භාණ්ඩයක්, සිම්බල් , ආදි තවත් අවශ්‍ය වෙතැයි ඔබට අභිමත භාණ්ඩ පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.

පාඩම සංවර්ධනය :

පියවර 01
- වාද්‍ය බණ්ඩයේ කොටසක් ගුරුවරයා විසින් සර්පිනාවක් ආධාරයෙන් සිසුනට ශ්‍රවණය වන පරිදි වාදනය කරන්න.
- වාදනයෙහි සම්බන්ධ සිසුවකුට ඒ කොටස තම භාණ්ඩය මගින් අනුකරණය කරන ලෙසට උපදෙස් දෙන්න.
- ඔබ විසින් වාදනයේ ඒ ඒ කොටස් නියමිත පරිදි සිසුන් අතර බෙදා වාදනයෙහි යොදවන්න.
- ප්‍රස්තාර කියැවීමෙහි දුර්වල ළමුනට ඒ සඳහා ඔබ සහාය වන්න.
- මාතෘකාවේ කොටස් නිසි ලෙස වැයේ දැයි සොයා බලන්න.

(මි. 15)

පියවර 02
- ස්වර වාද්‍ය භාණ්ඩයන් වාදනය සඳහා සුසර කර තබන්න.
- වීදුරු 7 ගෙන ජලය නිසියාකාර ව පුරවාගන්න.
- මෙලෝඩිකාව යොදා ගෙන නිවැරදි ශ්‍රැතියට එම වීදුරු සුසර කරගැනීම සඳහා සිසුන් ද සහභාගි කරගන්න.
- වාදනයේ කොටසින් කොටස ඔබ විසින් සිසුන්ට පුහුණු කරන්න.
- ඒ ඒ අදාළ භාණ්ඩයන්හි වාදන කොටස් තනි තනි ව පුහුණු වීමට සිසුවාට කාලය ලබා දෙන්න.

(මි. 15)

පියවර 03
- වාද්‍ය වෘන්දය මෙහෙය වීම සඳහා කැමැත්තෙන් ඉදිරිපත් වන්නකුට ඒ සඳහා අවසර ලබා දෙන්න.
- වාදනයේ නිවැරදිතාව ඔබ විසින් ම පිරික්සන්න.
- සමස්ත වාදනය ම ඇගයීම මගින් සිසුන් නිර්මාණකරණයෙහි දිරිමත් කරන්න.

(මි. 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- නිවැරදි ස්වර ප්‍රස්තාරය මත වාදන කොටස් ඉදිරිපත් කරන සිසුන් කිහිප දෙනකු ඉදිරියට කැඳවා ඔවුනගේ දක්ෂතා අන් අයට ප්‍රදර්ශනය කරන්න.

(මි.20)

පසුවැඩ :
- වෙනත් පහසු මාතෘකා කිහිපයක් ඉදිරිපත් කර ඔවුන් නිර්මාණකරණයෙහි පොළඹවන්න.
- වීදුරු සංඛ්‍යාව ප්‍රමාණයෙන් ඉහළ දමමින් විකෘති ස්වර ගොඩනැංවීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් : 2007 6 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි සඳහන් වන සමූහ වාදනය වඩා විධිමත් ව ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

# රබන් පද වාදනය

නිපුණතාව 7.0 : සංගීත භාණ්ඩ නිර්මාණ කාර්යයේ අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 7.1 : ආදේශ භාණ්ඩ ආශ්‍රිත නිර්මාණයේ යෙදෙයි

කාලච්ඡේද සංඛ්‍යාව : කාලඡේද 02

ඉගෙනුම් පල :
- ■ ප්‍රචලිත රබන් පද ඉදිරිපත් කරයි.
- ■ විවිධ රටාවලට බැඳී ඇති රබන් පද වර්ග කරයි.
- ■ රබන් පද ආශ්‍රිත ව ගීත නිර්මාණය වී ඇති බව වටහා ගනී.
- ■ ආදේශ භාණ්ඩ මගින් රබන් පද වාදනයට පෙළඹෙයි.
- ■ අලුතින් රබන් පද නිර්මාණය කරයි.
- ■ සමූහය සමග රබන් පද වයමින් රසාස්වාදයේ යෙදෙයි.

ගුණාත්මක යෙදවුම් :
- ■ බංකු රබානක් හෝ කිහිපයක්
- ■ නිර්මාණය කරන ලද අවනද්ධ ඝනයේ ආදේශ භාණ්ඩ
- ■ රබන් පද ලියන ලද දෘශ්‍යාධාර
- ■ නරිබෑනා නාට්‍යයේ ගීත

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

- ■ රිද්ම රටා වාදනය සඳහා ආදේශ අවනද්ධ භාණ්ඩ යොදා ගනිමින් මින් ඉහත දී සිසුන් ක්‍රියාකාරකමක නිරත වී ඇත. එහි දී වාදනය කර ඇත්තේ නිර්මාණාත්මක තනු කිහිපයකි. එහෙත් මේ ක්‍රියාකාරකමේ දී අප අතර ඇති රබන් පද වාදනය කිරීමක් සිදු වේ. මේ සඳහා යොදා ගත හැකි රබන් පද කිහිපයක් පහතින් දක්වමු.
- ■ 'උඩින් උඩින් වර පෙත්තප්පු'
- ■ 'උඩ පල ගත්තත් වට්ටක්කා'
- ■ 'එගොඩ ගොඩෙත් රත්තරන්'

(බංකු රබානක් සපයා ගත හැකි නම් එය වඩාත් පහසු වෙයි.)

පාඩම සංවර්ධනය :

පියවර 01
- ■ නරිබෑනා නාට්‍යයේ ගීත ගායනය කළ හැකි සිසුවකුට එහි ගීතයක් ගැයීමට සලසන්න.
- ■ එම ගායනය අගයන්න.
- ■ ඔබ විසින් ද, එම නාට්‍යයේ රබන් පද ආශ්‍රිත ව ඇති වෙනත් ගීතයක් රසවත් ව ගයා දක්වන්න.
- ■ එම ගී කිහිපය අත් පොළොසන් දෙමින් ගායනය කිරීමට සිසුන් පොළඹවන්න.
- ■ එම ගීත රබන් පද ඇසුරෙන් ගොඩනැගී ඇති බව සිසුනට ඒත්තු පහදන්න.

(මි.10)

පියවර 02
- ■ දෘශ්‍ය උපකරණයේ ඇති එක් රබන් පදයක් සිසුනට පෙන්වන්න.
- ■ එම රබන් පදය තම තමන් අත ඇති ආදේශ භාණ්ඩ මගින් වැයීමට හුරු කරන්න.
- ■ ඔබ රබන් පදය කියන විට සිසුන් ලවා එය වාදනය කරවන්න.

- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා, එක් කණ්ඩායමක් ගයන රබන් පදය අනිත් කණ්ඩායම ලවා වාදනය කරවන්න.
- මේ අයුරින් රබන් පද කිහිපයක් ම වාදනයේ හා ගායනයේ හුරු කරවන්න.

(මි.30)

පියවර 03

- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව වාදන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වාදනයේ පහසු ක්‍රම ඔබ සිසුනට හුරු කරවන්න.
- ඔබ විසින් ක්ෂණයෙන් ගොඩනැගූ නව රබන් පද, කිහිපයක් සිසුන් ලවා වාදනය කරවන්න.

(මි.30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- රබන් පද ගයමින් වාදනයේ දක්ෂ සිසුන් හඳුනාගෙන ඔවුන් ඉදිරියට ගෙන අගයන්න.
- නව රබන් පද නිපැයූ සිසුන් හඳුන්වා දී පන්තිය ඉදිරියේ ඔවුන් අගයමින් එම නිර්මාණ අන් අය අතර සටහන් කරවන්න.

(මි.10)

පසුවැඩ :

- තම තමන්ගේ ප්‍රදේශ ආශ්‍රිත ව ඇති අප්‍රකට රබන් පද සෙවීමට සිසුන් යොමු කරවන්න.
- ඒවා ලිඛිත ව සටහන් කර කුඩා පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

අතිරේක උදවි : 2007 7 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි සඳහන් නරිබෑණා පාඩම නැවත පරිශීලනය කරන්න.

# රිද්ම රටා ප්‍රස්තාර කිරීම

නිපුණතාව 8.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 8.1 : ප්‍රස්තාරකරණයේ මූලික කුසලතා ලබයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් පල :
- රිද්මය විවිධ රටාවන් සහිත බව ප්‍රකාශ කරයි.
- මාත්‍රා 2, 3, 4 ආදී වශයෙන් බෙදෙන බව පවසයි.
- නැවතීම් හා ඇදීම් අනුව විවිධ රටා බිහිවන බව පිළිගනියි.
- විවිධ රිද්ම රටා නිර්මාණය කරයි.
- රිද්ම රටා අනුව අත්තැළීම හෝ භාණ්ඩයකට තට්ටු කිරීම කරයි.

ගුණාත්මක යෙදවුම් :
- පොල් කටු, ලී කෝටු හෝ තට්ටු කිරීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ.
- තම්මැට්ටම, දවුල හෝ සපයාගත හැකි වෙනත් තාල වාද්‍ය භාණ්ඩ.
- රිද්ම රටා ප්‍රස්තාර කරන ලද දෘශ්‍ය උපකරණය.
- සපයා ගත හැකි නම් ඉලෙක්ට්‍රෝනික් කීබෝඩ් එකක්.
- ඇමුණුම 01 ට අයත් රිද්ම රටා ඇතුළත් දෘශ්‍ය උපකරණය.

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

ස්වර ප්‍රස්තාර කියවීම (ˆසටයඑ සෘ:ඍසබට* සංගීතයේ දී අත්‍යවශ්‍ය කුසලතාවකි. මේ පිළිබඳ ව 6 වසරේ සිට ම සිසුවාගේ හැකියා දියුණු කිරීම අවශ්‍ය වේ. ප්‍රස්තාර කියවීම හා ප්‍රස්තාරකරණය පිළිබඳ මූලික කුසලතා ලබාදීම මෙම පාඩමේ අරමුණ වේ. මේ වන විට සිසුවා විවිධ ප්‍රස්තාර ගායනය කර හා වාදනය කර ඇති බැවින් ගුරුවරයාට මග පෙන්වීම පහසු වේ. ප්‍රස්තාරකරණයේ දී කාලය මූලික වන අතර මාත්‍රා 2, 3 සහ 4 යන රිද්ම රටා පිළිබඳ අධ්‍යයනය කිරීම හා අභ්‍යාස කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. සිසුවා සමග අත්තැළීම මගින් විවිධ රිද්ම රටා ප්‍රස්තාර කිරීමේ හැකියාව ලබාදීමට ගුරුවරයා මග පෙන්විය යුතු ය.

පාඩම සංවර්ධනය

පියවර 01
- ගුරුවරයා විසින් මේසයට තට්ටු කර රිද්ම රටාවන් වයා පෙන්වන්න.
- එම රිද්ම රටාවට තාලවාද්‍ය භාණ්ඩයක් වයා පෙන්වන්න.
- සිසුන්ට ඒ මත අත් තැළීමට උපදෙස් දෙන්න.
- කවකටු පෙට්ටිවලට හෝ බිමට තට්ටු කර රිද්ම රටාවන් වැයීමට ළමුනට අවස්ථාව දෙන්න.

(මි.05)

පියවර 02
- දෘශ්‍ය උපකරණය මගින් රිද්ම රටා කිහිපයක් ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රදර්ශනය කරන ලද රිද්ම රටා කිහිපයක් පියවරෙන් පියවර වාදනය කර පෙන්වන්න.
- ශිෂ්‍යයන්ට එය අනුකරණය කිරීමට සලස්වන්න.
- ගුරු සහයෙන් තොර ව තවත් රිද්ම රටා කීපයක් වාදනය කිරීමට සලස්වන්න.

(මි.15)

පියවර 03 :

- මාත්‍රා තුනේ රිද්ම රටා වෙනස් කරමින් වාදනය කරවන්න. (තට්ටු කරවන්න)
- මාත්‍රා 4 රිද්ම රටාවන් විවිධ රටාවන් ඔස්සේ වාදනය කරවන්න.
- කණ්ඩායම් වශයෙන් විවිධ මෝස්තර හා හැඩයන් අනුව රිද්ම රටා වාදනය කරවන්න. (මි. 15)

ඇගයීම හා තක්සේරකරණය සඳහා උපදෙස් :

- ගුරුවරයා විසින් නිර්මාණය කරන ලද රිද්ම රටා එක් එක් සිසුන්ට වාදනය කිරීමට අවස්ථාව දෙන්න.
- සිසුන්ට රිද්ම රටා නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න. (මි. 05)

09. පසුවැඩ

- විවිධ රටාවන් ඔස්සේ රිද්ම රටා වාදනය කිරීමට යොමු කරන්න.
- ඍකැප්ළ්එරදබසප් ණැහඉද්රා එකක ඊ්එ එක දමා ඒ මත අත් තැලීමට උපදෙස් දෙන්න.


10. අතිරේක උදව්

- " භ්‍ඍෘධ'' තාල වාදන ප්‍රසංගය සහිත උැඉ්සඑ එක පරිශීලනය කර අධ්‍යයනය කරන්න.


මාත්‍රා 2 රිද්ම රටා | | | |

1. o ϕ o | o ϕ o | o o
2. o † - | - |o - | o -
3. o † o | o |o - | o o
4. o ϕ o | - |o o | o -
5. o † o | - ϕ o | o o
6. o ϕ o | o ϕ - | o -
7. o ϕ o | - |o - | o o
8. o ϕ o | o ϕ - | o o
9. o † o | o ϕ o | o -
10. o o - o o - o o

මාත්‍රා 3 රිද්ම රටා



මාත්‍රා 4 විද්ම රටා



# මාත්‍රා, ලඝු, ගුරු, ප්ලුත අක්ෂර විභාග

නිපුණතාව 8.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමෙන් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 8.1 : ප්‍රස්තාරකරණයේ මූලික කුසලතා ලබයි.

කාලච්ඡේද සංඛ්‍යාව : කාලඡේද 02

ඉගෙනුම්පල

- මාත්‍රා යනු කුමක්දැයි අර්ථ දක්වයි.
- ලඝු, ගුරු, ප්ලුත අක්ෂර නම් කරයි.
- ගී පාදයක ලඝු, ගුරු අක්ෂර සඳහා වන සංකේත ලකුණු කරයි.
- ලඝු, ගුරු, ප්ලුත අක්ෂර වෙන් කොට හඳුනාගනියි.

ගුණාත්මක යෙදවුම්

- ලඝු, ගුරු, ප්ලුත අක්ෂර වෙන් කොට දක්වන ලද දෘශ්‍ය උපකරණය

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

මේ වන විට 6 ශ්‍රේණියේ ළමුන් ස්වර ප්‍රස්තාරකරණය පිළිබඳ සරල අවබෝධයක් ලබා ඇත. ස්වර ස්ථාපන ගී සහ සංගීත භාණ්ඩ වාදනය කිරීමේ, පාඩම්වල දී ස්වර ප්‍රස්තාර කියවීම පිළිබඳ මූලික කුසලතා ලබාගෙන
ඇත. තව දුරටත් විධිමත් ව ප්‍රස්තාරකරණය පිළිබඳ අධ්‍යයනය කිරීම, මෙම
පාඩමේ අභිප්‍රාය යි. මෙහි දී ලඝු, ගුරු, ප්ලුත යන අක්‍ෂර හඳුනා ගී/ කවි පාදයක ඒවා ලකුණු කිරීම කළ යුතු ය.

පාඩම සංවර්ධනය

පියවර 01 :

- ඇමුණුම අංක 1 හි සපයා ගත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි සඳහන්
වචන පිළිවෙළින් උච්චාරණය කරන්න.
- ඇදෙන අකුරු හා නොඇදෙන අකුරු ඇති බව වටහා දෙන්න.

(මි. 10)

පියවර 02 :

- ඇමුණුම අංක 02, 03, 04 ඇති දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ඇති
අභ්‍යාස පිළිවෙළින් සාකච්ඡා කරන්න.
- සිසුන් ලවා ඒවා උච්චාරණය කරමින් ලඝු, ගුරු, ප්ලුත අක්ෂර වෙන් කොට
දක්වන්න.

(මි. 30)

පියවර 03 :

- තෝරාගත් වචන හා පදවල ලඝු, ගුරු, ප්ලුත අක්ෂර සංකේතානුසාරයෙන් දැක්වීමට අවස්ථාව දෙන්න.
- ගී පාදයක ලඝු, ගුරු, ප්ලුත අක්ෂර පිහිටීම ලකුණු කරවන්න.

(මි. 30)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- කළු ලෑල්ල මත සටහන් කරන ලද වචනයක හෝ ගී පාදයක අදාළ සංකේත ලකුණු කිරීමට සලස්වන්න.

(මි. 10)

පසුවැඩ

- විවිධ මාත්‍රා ගණනින් යුත් ගී පාදවල සංකේත ලකුණු කිරීමට යොමු කරන්න.
- පුද්ගල නාම, ගම්, නගරවල නාමයන්හි ලඝු, ගුරු පිහිටීම සොයන්න.

අතිරේක උදව්

- 'හෙළ ගී මග'- ඩබ්. බී. මකුලොලුව මහතා

ඇමුණුම අංක 01

ලඝු අකුරු

කෙටි අකුරු ලඝු අකුරු වේ.

| | | |
|---|---|---|
| මම | පිල | ගැල |
| බසය | නුවණ | විනය |
| කතරගම | පොත | බෙර නද |

මේවා උච්චාරණය කිරීමට ගත වන්නේ කෙටි කාලයකි. ඒ නිසා මේවා කෙටි අකුරු නොහොත් ලඝු අකුරු වශයෙන් හැඳින්වේ. ලඝු අකුරක් උච්චාරණය කිරීමට ගත වන කාලය එක් මාත්‍රාවකි. සංකේතාත්මක ව ලකුණු කිරීමේ දී අකුරට යටින් කෙටි ඉරි කැබැල්ලක් යොදයි.

උදා: 1. දි ය ගො ඩ සැ ම තැ න

ඇමුණුම අංක 02

ගුරු අකුරු

දීර්ඝ අකුරු නැතහොත් ඇදෙන අකුරු ගුරු අකුරු වේ. මේවා වර්ග දෙකකි.

| | | |
|---|---|---|
| මාමා | පීලාවා | මෝරා |
| තාරාවා | බූලා ආවා | |

මෙම අකුරු උච්චාරණය කිරීමට ගතවන කාලය දීර්ඝ වේ. ලඝු අකුරක් උච්චාරණය කිරීමට ගතවන කාලය මෙන් දෙගුණයකි. මේවා ගුරු අකුරු ලෙස හැඳින්වේ. ගුරු අකුරක් උච්චාරණය කිරීමට ගතවන කාලය ලඝු මාත්‍රා දෙකකි. ඒ අනුව ගුරු අකුරක් මාත්‍රා 2ක් ලෙස ගණන් ගැනේ සංකේතාත්මක ව ලකුණු කිරීමේ දී අකුරට යටින් (යටි වරහන් යොදයි)

උදා: කී වා ශා ලා ව ආ වා පා රේ නා න වා

ලඝු අකුරක් සමග හල් අකුරක් යෙදෙන අවස්ථාවක දී එය හඳුන්වන්නේ ද ගුරු අකුරක් ලෙසිනි.

උදා:-

පන්සල   පල්ලිය   විල්පත්තු   සත්තුවත්ත

මේවා හලන්ත ගුරු වශයෙන් හැඳින්වේ.

පින් ම ඳ පු තුන් සි ය යක් ල දු වත් නි ස රු

මෙම ගී පදයේ ලඝු අකුරු සංඛ්‍යාව 10 එහි මාත්‍රා 10

ගුරු අකුරු සංඛ්‍යාව 4 එහි මාත්‍රා 2o4 08

ගී පාදයේ මාත්‍රා සංඛ්‍යාව (මුළු) 18 කි

ප්ලුත අක්‍ෂර ඇමුණුම අංක 03

උච්චාරණය කිරීමට මාත්‍රා 03 ක කාලයක් ගත වන අක්ෂර ප්ලුත අක්ෂර යනුවෙන් හැඳින්වේ. මේවා ගුරු අක්ෂරයක් සමඟ හල් අක්ෂරයක් යෙදීමෙන් උපදී. අඩ වෘත්තයට කෙටි ඉරක්ද

සම්බන්ධකර ලිවීමෙන් සංකේතවත් කරයි.

ශාන් ත   තීන් ත   කාන් ති   කෝ ජ් ජ

ප ළා ත්   නි ශා න් ත

ගුරු අකුරට මාත්‍රා දෙකක් ද, හල් අකුරට මාත්‍රාවක් ද වශයෙන් එම අකුරු දෙක ම උච්චාරණය කිරීමට ගත වන කාලය මාත්‍රා 03 කි.

ඇමුණුම අංක 04

කෙටි අකුරු හෙවත් ලඝු අකුරු

| | | | | | | | | මාත්‍රා |
|---|---|---|---|---|---|---|---|---|
| ම | ම | | | | | | | 02 |
| ක | ත | ර | ග | ම | | | | 05 |
| ඇ | ඹි |ලි | පි | ටි | ය | | | 06 |
| උ | ඩ | ර | ට | මැ | ණි | කෙ | ට | 08 |

දීර්ඝ අකුරු හෙවත් ගුරු අකුරු

| | | | | | | | | මාත්‍රා |
|---|---|---|---|---|---|---|---|---|
| තා | - | රා | - | වා | - | | | 06 |
| බු | - | ලා | - | නා | - | ලා | - | 08 |
| ප | ත් | ත | ර | ක | ඩේ | - | | 07 |
| ක | ලා | - | ව | වෙ | නු | වෙ | න් | 08 |

දිර්ඝ අකුරු හෙවත් ප්ලුත අකුරු

| | | | | | | | | | මාත්‍රා |
|---|---|---|---|---|---|---|---|---|---|
| කා | - | න් | ති | නැ | න් | දා | - | | 08 |
| පා | - | න් | පි | ටි | කෑ | - | ම | | 08 |
| වෙ | ළ | ඳ | හා | - | ණ් | ඩ | ය | | 08 |
| කෝ | - | ච් | චි | පෙ | ටි | ටි | ය | | 08 |
| හා | - | ල් | පි | ටි | ආ | - | ප් | ප | 09 |

# මූලික තාල මත පද ප්‍රස්තාර කිරීම

නිපුණතාව 8.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විදි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමෙන් දේශිය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම 8.1 : ප්‍රස්තාරකරණයේ මූලික කුසලතා ලබයි.

කාලච්ඡේද ගණන : 02

ඉගෙනුම්පල

- මූලික මත් ඝන තුන සහිත ගී පද ප්‍රස්තාර කරයි.
- මාත්‍රා සංඛ්‍යාව අනුව ඇදෙන ප්‍රමාණය සංකේත මගින් දක්වයි.
- පද සහ ස්වර අතර සබඳතාවය හඳුනාගනියි.
- ශ්‍රවණය කළ ගී පාදයක් පද ප්‍රස්තාර කරයි.

ගුණාත්මක යෙදවුම්

- ගී පද ලියන ලද දෘශ්‍යාධාරකය

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

ලඝු ගුරු, ප්ලූත වශයෙන් යෙදෙන අක්ෂර ඇත. ඒවාට හිමි මාත්‍රා සංඛ්‍යාවන් ආදී කරුණු මෙම පාඩමේ දී වැදගත් වන නිසා ඒ පිළිබඳ ව ද අවධානය යොමු කරන්න. ස්වර ප්‍රස්තාර කිරීම මෙන් ම පද ද තාලානුකූලව
ප්‍රස්තාර කළ යුතු ය. නැතහොත් තාලානුකූලව ගායනය අපහසු වේ. 6 වසරේ සිසුන් නිසා කුඩා ගීත කිහිපයක් මේ සඳහා යොදාගතහැකි ය. මේ වන විට ඇදීම සහිත ප්‍රස්තාර පිළිබඳ තරමක් දැනුවත් වී ඇති බැවින්
මූලික තාලරූප තුනට අදාළ පද ප්‍රස්තාර සෑහේ.

පාඩම සංවර්ධනය

පියවර 01 :

- ප්‍රස්තාර නොකළ ගී පද ලියන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- එහි සඳහන් කර ඇති හොඳින් දන්නා ගී පද ගයන්න. සිසුන් ද ඒ සඳහා සහභාගි කරවන්න.
- ගායනය කරන ගී පාදය මත තාල තැබීමට යොමු කරන්න.
- ආඝාතස්ථාන දෙකක් අතර ඇති වචනය පිළිබඳ සාකච්ඡා කරන්න.
- මාත්‍රා 2, 3, 4 ආදී වශයෙන් ගී පද බෙදෙන ආකාරය සාකච්ඡා කරන්න.

(මි. 20)

පියවර 02 :

- දිය ගොඩ සැම තැන යන ගීතය ශ්‍රවණයට සලසා පද ප්‍රස්තාර කරන්න.
- මාත්‍රා 3, 4 යෙදෙන ගී පද ද මෙසේ ප්‍රස්තාර කරන්න.
- ඇදෙන මාත්‍රා සංඛ්‍යාවන් ප්‍රස්තාරයක දී පෙන්වන ආකාරය පැහැදිලි කරන්න.

- මුහුදු පතුල යට ඉඳල... ගීතය ප්‍රස්තාර කරවන්න.
- මේ රට මගෙ රට... ගීතය ද ප්‍රස්තාර කරන්න.

(මි. 30)

පියවර 03 :

- ගුරුවරයාගේ අභිමතය පරිදි මාත්‍රා, 2, 3, 4 ආදි වශයෙන් ගී පාද 3 ක් සිසුන් ලවා ප්‍රස්තාර කරවන්න.

(මි. 20)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- පාසල් ගීය හා ජාතික ගීය පද ප්‍රස්තාර කිරීමට සලස්වන්න. එහි අඩුපාඩු සකසන්න.
- පෙර නොඇසූ ගී පාදයක් ශ්‍රවණයට සලස්වා එය පද ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.

(මි. 10)

- ගුරුවරයා විසින් පහත සඳහන් ගීත කොටස් මිහිරි ව ගයා, වයා පෙන්වන්න. ඒ ඒ ගීත කුමන තාලවලට අයත් වන්නේ දැයි විමසන්න.
  1. 'දියගොඩ සැම තැන කිරි ඉතිරේ'
  2. 'සවන පිනන ගීත මිහිර'
  3. 'ලංකා ලංකා පෙම්බර ලංකා'
  4. 'බැතිනා සිරිපා කරුණා කරනා'
  5. 'එකට සතුටු සාගරේ'

පසුවැඩ

- තාල රූප තුනට අයත් ගී පද තුනක් පද ප්‍රස්තාර කරගෙන එන ලෙස සිසුන් දැනුවත් කරන්න.

අතිරේක උදවි

- පුස්තකාලයෙහි ඇති සංගීත ස්වර ප්‍රස්තාර පද ප්‍රස්තාර පොත් පරිශීලනය කරවන්න. මේ සඳහා මාත්‍රා 2, 3, සහ 4 පැහැදිලි ව හඳුනා ගත හැකි වචනවලින් යුත් ගීත තෝරාගැනීම වඩාත් වැදගත් ය. පහත දැක්වෙන ස්වභාවයේ ගී පද මේ සඳහා යොදාගත හැක.
  1. 'ඇහැල මලින් ගස් පිරිලා'
  2. 'බැතිනා සිරිපා කරුණා කරනා'
  3. 'දිය ගොඩ සැම තැන'
  4. 'මේ රට මගෙ රට'

  දෘශ්‍ය උපකරණය සැකසීමේ දී ප්‍රස්තාරයෙන් සකසන්න.

# වාර්ෂික විවිධ ප්‍රසංගය

නිපුණතාව 3.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 3.1 : සංගීත නිර්මාණකාර්යයේ අත්හදා බැලීම් කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 06

ඉගෙනුම්පල :

- ප්‍රාසංගික අත්දැකීම් ලබමින් සතුටු වෙයි.
- සංගීතය විෂය ඉගෙනීමෙන් තෘප්තිමත් වෙයි.
- වේදිකාව පරිහරණය පිළිබඳ අත්දැකීම් ලබයි.
- විවිධ පෞරුෂ ගුණාංග වර්ධනය කර ගනියි.
- ගායන වාදන තනි ව ඉදිරිපත් කිරීමට පෙළඹෙයි.

ගුණාත්මක යෙදවුම් :

- එක් එක් අයිතමයට ගැළපෙන ලෙස සකස් කර ගත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- වාද්‍ය භාණ්ඩ

ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :

පාසල් වේදිකාවේ ප්‍රාසංගික අවස්ථාවකට සහභාගි වීමට සිසුහු කැමැත්තක් දක්වති. එයින් ඔවුන් තුළ පෞරුෂ ගුණාංග රාශියක් වර්ධනය වනු ඇත. එබැවින් සැම විට ම විශේෂ තෝරා ගැනීමක් නොකර සියලු ම සිසුන්ටද සහභාගි වීමට අවස්ථාව ලැබෙන පරිදි පාසල් විවිධ ප්‍රසංගය සැලසුම් කරගැනීම ගුරුවරයාගේ වගකීමකි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහනට ගැළපෙන ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස මේ සඳහා ලකුණු පිරිනැමීමක් ද කළ හැකි ය. මෙහි දී මහා පරිමාණයේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීම අරමුණු කර නැත. එබැවින් පහත දැක්වෙන කරුණු ඔබට මේ සඳහා උපකාර වනු ඇත.

- ශ්‍රේණි මට්ටමින් වෙන වෙන ම විවිධ ප්‍රසංගය පැවැත්වීම හෝ සියලු පන්ති සහභාගි කරගනිමින් එක් විවිධ ප්‍රසංගයක් පාසල තුළ පැවැත්වීම.
- වේදිකාවේ ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන පරිදි අවම වශයෙන් පාසල් නිල ඇඳුමින් හෝ ගායන, වාදන, රංගන අංකවලට සිසුන්ට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීම.
- කාලය, ඉඩකඩ, පහසුකම් ප්‍රමාණවත් පරිදි වර්ෂය තුළ ලබාගත නොහැකි වූ යේ නම් පාසල තුළ ඉඩකඩ ඇති ස්ථානයක අනෙක් ගුරු භවතුන් සහ දෙමාපියන් ඉදිරියේ කේවල සහ සාමූහික ප්‍රසංග ලෙස කෙටි සංදර්ශනයක් පවත්වා සිසුන් අගය කිරීම සහ ධෛර්යමත් කිරීම.

කාලච්ඡේද 6 ක් යනු සති දෙකක කාලයකි. ඒ අනුව 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා කාලච්ඡේද 6 බැගින් වෙන් කර ඇත. සිසුන් පන්ති කාමරයේ දී උගත් සංගීතමය ප්‍රායෝගික අංග ඇසුරින් කිසියම් තේමාවකට ගැලපෙන ලෙස කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව වේදිකාවේ රඟ දැක්වීමට සුදුසු ගායන, වාදන, නාට්‍ය, අංග කණ්ඩායම් වශයෙන්

කරගැනීමටත්, විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමටත් මෙම කාලච්ඡේද

06 යොදා ගැනේ. පහත දැක්වෙන කරුණු පිළිබඳ ගුරුවරයා

සැලකිලිමත් විය යුතු වේ.

- උපරිම අන්දමින් පැය දෙකහමාරක පමණ කාලයකට ගැළපෙන ලෙස ප්‍රසංගය සඳහා තෝරාගන්නා අංක ලැයිස්තුවක් පිළියෙළ කිරීම.
- පන්ති කාමරයේ අධ්‍යයනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට මුල් තැනක් ලබාදීම.
- බාහිර සම්පත් පුද්ගලයන් සහභාගි කර නොගෙන පාසලේ සිසු - ගුරු සම්පත්වලින් පමණක් සරල ව ප්‍රසංගය පැවැත්වීම.
- සරල අංකවලින් ආරම්භ කිරීම.
- පාසල් වේදිකාව භාවිත කරන්නේ නම් ඒ සඳහා සුදුසු සැලසුමක් පිළියෙළ කර කණ්ඩායම් සඳහා වැඩ බෙදීම.
- ප්‍රේක්ෂක පිරිස පිළිබඳ අවධානය යොමු කිරීම.

එක් එක් ශ්‍රේණියට ගැළපෙන ලෙස පන්ති කාමරයේ අධ්‍යයනය කළ කොටස් ඇසුරින් ප්‍රසංග අංක සැකසීම යන කාරණය පිළිබඳ වැටහීමක් ලබා ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔබට

මග පෙන්වනු ඇත.

තාලානුකූල ස්වර අභ්‍යාස ඇසුරින් ප්‍රාසංගික අංකයක්

ලය සහ තාලය පිළිබඳ සැලකිලිමත් වෙමින් පහත දැක්වෙන ස්වර ඛණ්ඩය අධ්‍යයනය කර සිසුන් ලවා ගායනය කරවන්න.

සεεε රැ εεεε /සεεε රැεεεε රැ

සεεε රැ සεεε රැ සεεε රැ සεεε රැ

සε සε / සε සε / ස ස ස ස /සස සස සස සස /

ස ස ස ස /ස රි ග -/ රි රි රි රි /රි ග ම -/

ග ග ග ග /ග ම ප - / ප ම ග රි / ස - - - /

ප්‍රස් - ප ස් -/- - - - / ප්‍රස - ප ස - / - - - - /

සූ සූ සූ සග / සූ සග සූ සග / රූ රූ රූ රිම / රූ රිම රූ රිම/

ගූ ගූ ගූ ගප / ගූ ගප ගූ ගප/ පප පප ස - / - - - - /

ග ග ග රි / ස - ස රි / ග ග ග රි / ස - - - /

ප ප ප ම / ග - ග ම / ප ප ප ම / ස - - - /

ග - ම - / ප - ධ - / නි - - - / ස - - - /

ග - ම - / - - - - / නි - - - / ස - - - /

පස - ප ස - / - - - - / පස - ප ස - / - - - - /

මෙවැනි ස්වර ඛණ්ඩ තවදුරටත් ඔබට නිර්මාණය කර ගත හැකි වේ. ස්වර අභ්‍යාස වුවත් මෙහි රිද්මය දුම්රියක ගති ලක්ෂණ මතු කරන බව ඔබට පෙනෙනු ඇත. මේ ආකාරයෙන් පන්ති

කාමරයේ අධ්‍යයනය කළ ක්‍රියාකාරකම් තවදුරටත් දීර්ඝ වන ලෙස නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම විවිධ ප්‍රසංගය යන පාඩමින් අපේක්ෂිත ය. එක් එක් පන්තියේ ක්‍රියාකාරකම් වෙනත්

අයුරකින් ඉදිරිපත් කිරීමට ගුරුවරයා වශයෙන් ඔබගේ නිර්මාණශීලී බව හේතු වේ. මෙසේ නොවුව ද පන්තියේ ඉගෙන ගත් ප්‍රායෝගික කොටසක් වුව ද ප්‍රසංගාත්මක ව ඉදිරිපත් කළ හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1 :

- විවිධ ප්‍රසංගයකට ඉදිරිපත් වීමෙන් ශිෂ්‍යයාට ලැබෙන වාසි පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මි.10)

පියවර 2 :

- තෝරාගත් අයිතම පුහුණු කරන්න.
(මි.30)
- තෝරාගත් අයිතම පුහුණු කරන්න.
(මි.40)
- තෝරාගත් අයිතම පුහුණු කරන්න.
(මි.40)

පියවර 3 :

- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව වේදිකාවේ හෝ පන්තිකාමරයේ ප්‍රසංග අංක ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. (මි.40)
- ස්වර නියමිත නාදස්ථාන අනුව ගායනයට යොමු කරන්න.
සුදුසු අංග චලන ප්‍රාසංගික ව යොදා ගන්න (මි.40)
- මෙම පන්තියට යෝජිත කොටසේ සමස්ත නිමාව ඉදිරිපත් කර අගයන්න.
(මි.30)

ඇගයීම් හා තක්සේරුකරණය :

- කණ්ඩායම් ලෙස හෝ කේවල ව අගය කර ලකුණු ප්‍රදානය කරන්න.
(මි.10)

පසු වැඩ

- විවිධ ප්‍රසංගයක දී ඉටු කළ යුතු වැඩ කොටස් ලැයිස්තුවක් සිසුන් ලවා
පිළියෙළ කරවන්න.

අතිරේක උදව්

- 2007 - 6 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය